71 වන කාණ්ඩය
16 වන කලාපය

අඟහරුවාදා
1967 අප්‍රේල් 4

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශ [තී. 2361]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 2368]

ශෝක ප්‍රකාශය : ඒ. අප්පදුරේ මහතා [තී. 2392]

පළමුවනවර කියවන ලද පනත් කෙටුම්පත් : [තී. 2394]

රජය වශකියන නීතිගත සංස්ථා සංශෝධන පනත් කෙටුම්පත [සෙනෙට්]
නීති කොමිෂන් සභා පනත් කෙටුම්පත [සෙනෙට්]
බෞද්ධ විහාර දේවාල ගම් (සංශෝධන) පනත් කෙටුම්පත
තේ (විකුණුම් බදු) පනත් කෙටුම්පත

පරිපූරක මුදල් [තී. 2398]

මහා නගර සභා සහ සුළු නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත [සෙනෙට්] : [තී. 2419]

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී.

රක්ෂණ පාලන (සංශෝධන) පනත් කෙටුම්පත : [තී. 2490]

දෙවන වර කියවීම—විවාදය කල් තබන ලදී.

කල් තැබීමේ යෝජනාව [තී. 2508]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 71
இல. 16

செவ்வாய்க்கிழமை
4 ஏப்றில், 1967

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

*அதிகார அறிக்கை*

*பிரதான உள்ளடக்கம்*

**மகாதேசாதிபதியிடமிருந்து வந்த செய்திகள் [ப. 2361]**

**வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 2368]**

**அனுதாபத் தீர்மானம் : திரு. அப்பாக்குட்டி அப்பாத்துரை [ப. 2392]**

**முதன்முறை மதிப்பிடப்பட்ட மசோதாக்கள் [ப. 2394] :**

*அரசாங்க ஆதரவுபெற்ற கூட்டுத்தாபனங்கள் (திருத்த) மசோதா [செனெற்]*
*சட்டவாணைக்குழு மசோதா [செனெற்]*
*பௌத்த கோயிலாதனங்கள் (திருத்த) மசோதா*
*தேயிலை (விற்பனை வரி) மசோதா*

**குறைநிரப்புத் தொகை [ப. 2398]**

**மாநகர சபைகளும் பட்டின சபைகளும் (திருத்த) மசோதா [செனெற்] [ப. 2419] :**

*இரண்டாம், மூன்றும் மதிப்புக்களிடம் பெற்று நிறைவேற்றப்பட்டது*

**காப்புறுதிக் கட்டுப்பாடு (திருத்த) மசோதா [ப. 2490] :**

*இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது*

**ஒத்திவைப்புப் பிரேரணை [ப. 2508]**

---

**Volume 71**
**No. 16**

**Tuesday,**
**4th April 1967**

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

**MESSAGES FROM THE GOVERNOR-GENERAL [Col. 2361]**

**ORAL ANSWERS TO QUESTIONS [Col. 2368]**

**VOTE OF CONDOLENCE : MR. APPACUTTY APPADURAI [Col. 2392]**

**BILLS READ THE FIRST TIME [Col. 2394] :**

**Government-Sponsored Corporations (Amendment) Bill [Senate]**
**Law Commission Bill [Senate]**
**Buddhist Temporalities (Amendment) Bill**
**Tea (Sales Tax) Bill**

**SUPPLEMENTARY SUPPLY [Col. 2398]**

**MUNICIPAL COUNCILS AND TOWN COUNCILS (AMENDMENT) BILL [Senate] [Col. 2419] :**

**Read a Second and the Third time and passed**

**CONTROL OF INSURANCE (AMENDMENT) BILL [Col. 2490] :**

**Second Reading—Debate adjourned**

**ADJOURNMENT MOTION [Col. 2508]**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

*House of Representatives*

**1967 අප්‍රේල් 4 වන අඟහරුවාදා**

செவ்வாய்க்கிழமை, 4 ஏப்றில், 1967

*Tuesday, 4th April 1967*

---

 අ. භා. 2ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්, කේ. බී. ඊ.] මූලාසනාරූඪ විය.

சபை, பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ ஸ்ரீமான் அல்பட் எப். பீரிஸ், கே. பி. ஈ.] தலைமை தாங்கினார்கள்.

*The House met at 2* P.M., MR. SPEAKER [THE HON. SIR ALBERT F. PERIES, K.B.E.] *in the Chair.*

---

## අග්‍රාණ්ඩුකාර තුමාගෙන් ලත් සන්දේශ

மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்திகள்

## MESSAGES FROM THE GOVERNOR-GENERAL

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගෙන් ලැබී තිබෙන සන්දේශ දෙකක් මම දැන් කියවමි.

I

" අග්‍රාණ්ඩුකාර කාර්යාලය.

රජ වාසල, කොළඹ. ශ්‍රී ලංකාව.
1967 මාර්තු 23.

මහත්මයාණනි,

1946 යේ ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාවේ 36 (2) වැනි වගන්තිය ප්‍රකාර, පහත සඳහන් ආකාරයට නම් කරන ලද ව්‍යවස්ථා කෙටුම්පත්වලට මහා රාජිණීන් වහන්සේගේ ශ්‍රී නාමයෙන් මම අද දින අනුඥාව දුන් බව ගෞරව පූර්වකව ඔබට දන්වමි:

1. 'An Act to amend the Development Finance Corporation of Ceylon Act.'

2. 'An Act to amend the law relating to local authorities for the purposes of extending the duration of their term of office and to provide for matters connected therewith.'

මේ වගට,

ඔබගේ කීකරු සේවක,

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාර.

නියෝජිත මන්ත්‍රණ සභාවේ ගරු කථානායකතුමා. "

II

" අග්‍රාණ්ඩුකාර කාර්යාලය.

රජ වාසල, කොළඹ. ශ්‍රී ලංකාව.
1967 මාර්තු 28.

මහත්මයාණනි,

1946 යේ ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාවේ 36 (2) වැනි වගන්තිය ප්‍රකාර, පහත සඳහන් ආකාරයට නම් කරන ලද ව්‍යවස්ථා කෙටුම්පත්වලට මහා රාජිණීන් වහන්සේගේ ශ්‍රී නාමයෙන් මම අද දින අනුඥාව දුන් බව ගෞරව පූර්වකව ඔබට දන්වමි:

1. 'An Act to amend the Rubber Replanting Subsidy Act.'

2. 'An Act to amend the Tea (Tax and Control of Export) Act, No. 16 of 1959.'

3. 'An Act to provide that a certain rule made under the Public Service Mutual Provident Association Ordinance relating to payments out of the death donation fund established under section 16 of the aforesaid Ordinance shall have retrospective operation.'

4. 'An Act to amend the Estate Duty Ordinance.'

5. 'An Act to incorporate the National Council of the Young Men's Christian Associations of Ceylon.'

මේ වගට,

ඔබගේ කීකරු සේවක,

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාර.

නියෝජිත මන්ත්‍රණ සභාවේ ගරු කථානායකතුමා. "



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලත් සන්දේශ

*மூதவையிலிருந்து வந்த செய்திகள்*

## MESSAGES FROM THE SENATE

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලැබුණු සන්දේශ දෙකක් දැන් ලේකම් විසින් කියවනවා ඇති.

**පහත දැක්වෙන සන්දේශ ලේකම් විසින් කියවන ලදී.**

*செயலதிகாரி பின்வரும் செய்திகளை வாசித்தார் :*

*The Clerk read the following Messages :*

I

"1946 සහ 1947 ලංකා (ආණ්ඩුක්‍රම සහ ස්වාධීනතා) රාජඥාවන් සහ අනිකුත් ලිඛිත නීති පිළිබඳව, කාරක සභාව අවශ්‍යයයි අදහස් කරන අනිකුත් කරුණු අතර—

(1) **සමූහාණ්ඩුවක් පිහිටුවීම,**

(2) **මූලික අයිතිවාසිකම් සහතික කිරීම,**

(3) **සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලීය පත් කළ මන්ත්‍රීන් පිළිබඳ තත්ත්වය,**

(4) **රජයේ සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම,**

යන කරුණුද සම්බන්ධයෙන් සංශෝධනය කිරීම සලකා බැලීම පිණිස, නියෝජිත මන්ත්‍රී මණ්ඩලීය විශේෂ කාරක සභාව සමග ඒකාබද්ධ විශේෂ කාරක සභාවක් වශයෙන් එක්වීම සඳහා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය විසින්, අවශ්‍ය ලිපිලේඛනාදිය ගෙන්වා ගැනීමේ සහ අවශ්‍ය පුද්ගලයන් කැඳවීමේ හා මන්ත්‍රී මණ්ඩලය කල් තබනු ලැබුවත් කාරක සභාව රැස්වීමේ බලය ලත්, මන්ත්‍රීන් තුන් දෙනෙකුගෙන් යුත් ගණපූරණයකින් සමන්විත මන්ත්‍රීන් හත් දෙනෙකුගෙන් යුත් විශේෂ කාරක සභාවක් පත් කරන ලදී."

II

"සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය මතු පළවන කෙටුම්පත් පනත් සම්මත කළෙන් ඊට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වය ඔවුහු අපේක්ෂා කරති :

Law Commission

Government-Sponsored Corporations (Amendment).

මතු පළවන කෙටුම්පත් පනත්වලට සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය සංශෝධන නොමැතිව එකඟවී ඇත :

Rubber Replanting Subsidy (Amendment)

Tea (Tax and Control of Export) (Amendment)

Estate Duty (Amendment)

National Council of the Young Men's Christian Associations of Ceylon (Incorporation)

Public Service Mutual Provident Association Rules (Retrospective Operation)

Local Authorities (Term of Office)

Development Finance Corporation of Ceylon (Amendment)."

## නීති කොමිෂන් සභා පනත් කෙටුම්පත [සෙනෙට්]

*சட்டவாணைக் குழு [செனெற்]*

## LAW COMMISSION BILL [SENATE]

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

**සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් එවන ලද පනත් කෙටුම්පත ඉදිරිපත් කළේය.**

*மூதவையிலிருந்து வந்த மசோதாவைப் பிரேரித்தார்.*

*sponsored the Bill sent by the Senate.*

**පනත් කෙටුම්පත පළමුවන වර කියවන ලදින්, 1967 අප්‍රේල් 21 වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද, නියෝග කරන ලදී.**

*மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு, 1967, ஏப்றில் 21 ஆம் தேதி வெள்ளிக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படவும் அச்சிடப்படவும் கட்டளையிடப்பட்டது.*

*The Bill was read the First time and ordered to be read a Second time upon Friday, 21st April 1967, and to be printed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## රජය වගකියන නීතිගත සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත [සෙනෙට්]

அரசாங்க ஆதரவு பெற்ற கூட்டுத்தாபனங்கள் (திருத்த) மசோதா [செனெற்]

## GOVERNMENT-SPONSORED CORPORATIONS (AMENDMENT) BILL [SENATE]

ගරු වන්නිනායක

(கௌரவ வன்னிநாயக்க)

(The Hon. Wanninayake)

සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් එවන ලද පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ ය.

மூதவையிலிருந்து வந்த மசோதாவைப் பிரேரித்தார்.

*sponsored the Bill sent by the Senate.*

පනත් කෙටුම්පත පළමුවන වර කියවන ලදින්, 1967 අප්‍රේල් 21 වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද, නියෝග කරන ලදී.

மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு, 1967 ஏப்றில் 21 ஆம் தேதி வெள்ளிக்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்படவும் அச்சிடப்படவும் கட்டளையிடப்பட்டது.

*The Bill was read the First time and ordered to be read a Second time upon Friday, 21st April 1967, and to be printed.*

## නිවේදනය

அறிவிப்பு

## ANNOUNCEMENT

### ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැංවීමේ) පනත් කෙටුම්පත

இந்திய–இலங்கை உடன்படிக்கை (செயற்படுத்தல்) மசோதா

### INDO-CEYLON AGREEMENT (IMPLEMENTATION) BILL

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

"Indo-Ceylon Agreement (Implementation) Bill" නමැති කෙටුම්පත් පනත සලකා බැලීම පිණිස "බී" ස්ථාවර කාරක සභාවට නම් කරන ලද රාජනීතිඥ ජී. ජී. පොන්නම්බලම් මහතා, එතුමාගේ කැමැත්ත පරිදි, එකී සේවයෙන් නිදහස් කර ඇති බැවින්, ඒ වෙනුවට එම කාරක සභාවේ සේවය කිරීම සඳහා එම් . සිවසිතම්පරම් මහතා අතිරේක සාමාජිකයෙකු වශයෙන් මවිසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

I have nominated Mr. M. Sivasithamparam as an additional Member to serve on Standing Committee "B" for the consideration of the Indo-Ceylon Agreement (Implementation) Bill, in place of Mr. G. G. Ponnambalam, Q.C., who has been discharged from the Committee at his request.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

## PAPERS PRESENTED

1966-67 අංක 8 දරණ පරිපූරක ඇස්තමේන්තුව—[ගරු ආචාර්ය දහනායක]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

Supplementary Estimate No. 9 of 1966-67—[ගරු වන්නිනායක]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

Annual Report of the Port (Cargo) Corporation for 1964-65.—[ජනසතු සේවා ඇමති වෙනුවට ගරු වන්නිනායක]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

## 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තාව

நிலையற்கட்டளை இல. 51(4) இன்படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்

## REPORT PRESENTED UNDER STANDING ORDER No. 51 (4).

"Bill to incorporate the Horana Vidyaratna Sanskrutika Sangamaya" නමැති පනත් කෙටුම්පත පිළිබඳ වාර්තාව—[අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති ගරු ඊරියගොල්ල]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පනත් කෙටුම්පත 1967 අප්‍රේල් 5 වන බදාදා දෙවන වර කියවිය යුතුයයි නියෝග කරන ලදී.

மசோதா, 1967 ஏப்றில், 5 ஆம் தேதி புதன்கிழமை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.

*Bill ordered to be read a Second time upon Wednesday, 5th April 1967.*

## පෙත්සම්

### மனுக்கள்

### PETITION

**නීල් ද අල්විස් මයා.** (බද්දේගම)
*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*
**(Mr. Neal de Alwis—Baddegama)**

ගරු කථානායකතුමනි, මම අද ඔබතුමා මාර්ගයෙන් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නෙ සමස්ත ලංකා නැගෙනහිර සිංහල උප ගුරුවරුන්ගෙ සංගමයෙ පෙත්සමක්. මේ පෙත්සමේ සඳහන් කර තිබෙන්නෙ මෙයයි: දැනට අවුරුදු 2 1/2 කට පමණ කලින් විභාගයක් පවත්වා තිබෙනව, උතුරු නැගෙනහිර පළාත්වල දෙමළ පාසල්වලට පත් කිරීම පිණිස සිංහල ගුරුවරුන් තෝරා ගැනීමට. පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය මඟින් එම විභාගය පැවැත්වූයේ මේ පාසල්වලට පත් කිරීම සඳහා සිංහල උප ගුරුවරුන් 1,200 ක් තෝරා ගැනීමටයි. නමුත් විභාගය පවත්වා අවුරුදු 2½ක් ගත වී ඇතත් පත් කර තිබෙන්නෙ ඉතා සුළු පිරිසක් පමණයි. තවත් බොහෝ දෙනෙක් පත් කළ යුතුව තිබෙනව. ගරු අධ්‍යාපන ඇමතිතුමා පසුගිය දෙසැම්බර් මාසයෙ පොරොන්දුවක් දුන්නා මේ සියලුම පත්වීම් කරනවාය කියා. ඊට පසුව 1967 ජනවාරි මාසයෙ නැවතත් පොරොන්දුවක් දුන්න, මේ පත්වීම් කරන බවට. නමුත් ඒ පොරොන්දු ඉෂ්ට කර නැහැ. මේ පෙත්සමෙන් ඉල්ලා සිටින්නෙ, මේ සම්බන්ධයෙන් සොයා බලා මේ සිංහල ගුරු පිරිස වහාම පත් කරන හැටියටයි.

මහජන පෙත්සම් කාරක සභාවට පැවරිය යුතුයයි නියෝග කරන ලදී.

பொதுமனுக் குழுவுக்குச் சாட்ட கட்டளையிடப்பட்டது.

*Ordered to be referred to the Public Petitions Committee.*



## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

### வினாக்களுக்கு வாய்மூல விடைகள்

### ORAL ANSWERS TO QUESTIONS

### මහජන බීඩි සමාගම

#### மகாஜன பீடிக் கம்பெனி

#### MAHAJANA BEEDI COMPANY

1. **ඇලික් අලුවිහාරේ මයා.** (මාතලේ)
*(திரு. அலிக் அலுவிஹார—மாத்தளை)*
**(Mr. Alick Aluwihare—Matale)**

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මහජන බීඩි නමින් ආරම්භ කළ ව්‍යාපාරය සඳහා ග්‍රාම සංවර්ධන හා සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ණය මුදල කොපමණද? (ආ) එම මහජන බීඩි ව්‍යාපාරය ආරම්භකොට තිබුනේ කුමන ස්ථානයකද? (ඉ) මෙම ව්‍යාපාරය ආරම්භ කළේ කවරෙක්ද? (ඊ) මෙම ව්‍යාපාරය පාලනය කරනු ලැබුවේ කවරෙකු විසින්ද? (උ) මෙම බීඩි ව්‍යාපාරයට සිදුවූයේ කුමක්ද? (ඌ) මෙම බීඩි ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා ගත් ණය මුදලට සිදුවූයේ කුමක්ද? (එ) මෙම ණය මුදලට වගකිවයුත්තේ කවුද?

உள்நாட்டு விவகார அமைச்சரைச் கேட்ட வினா: (அ) மகாஜன பீடி என்னும் பெயருடைய வியாபாரத்துக்கென கிராம அபிவிருத்தி சிறு கைத்தொழில் திணைக்களத்திடமிருந்து கடனாகப் பெற்றுக்கொள்ளப்பட்ட பணம் எவ்வளவு? (ஆ) மகாஜன பீடி என்னும் பெயருடைய இவ்வியாபாரத் தொழில் எங்கே ஆரம்பிக்கப்பட்டது? (இ) இத்தொழிலை ஆரம்பித்தவர் யார்? (ஈ) இவ்வியாபாரத் தொழிலை நடத்தி வந்தவர் யார்? (உ) இவ்வியாபாரத் தொழிலின் கதி என்னவாயிற்று? (ஊ) இத் தொழிலின் உரிமையாளர்களால் பெற்றுக் கொள்ளப்பட்ட கடன் என்னவாயிற்று? (எ) இக்கடனுக்குப் பொறுப்பாளி யார்?

asked the Minister of Home Affairs: (*a*) What sum of money was obtained as a loan from the Department of Rural Development and Small Industries, for the business undertaking known as Mahajana Beedi? (*b*) Where was this business undertaking known as Mahajana Beedi started?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(c) Who set up this enterprise ? (d) By whom was this business undertaking controlled ? (e) What became of this enterprise ? (f) What happened to the loan raised for this business ? (g) Who is responsible for the loan ?

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)*

(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

(අ) " මහජන බීඩි " නමින් ව්‍යාපාරයක් සඳහා ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් ණය මුදලක් දී නැත. (ආ) මාතලේ, කවටයාමුණේ. (ඉ) " සීමාසහිත දකුණු මාතලේ බීඩි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය " නමින් සමිතියක් ඇම්. ඩී. සමරකෝන් මහතා සභාපති හා භාණ්ඩාගාරික වශයෙනුත්, එච්. එම්. කරුණාරත්න මහතා ලේකම් වශයෙනුත් ඇතිව තවත් 64 දෙනෙකුගෙනුත් සමන්විතව, මුලින් පිහිටුවාගෙන ඇත. (ඊ) එහි කාරක සභාව විසින් පාලනය කෙරුණු මෙම සමිතිය සමුපකාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත. (උ) දැනට මෙම සමිතිය පවත්වාගෙන යනු නොලැබේ (ඌ) ඉහත (අ) අනුව පැන නොනඟී. (එ) ඉහත (අ) අනුව පැන නොනඟී.

## ගම්සභා ලිපිකරුවන්

*கிராமச் சங்க இலிகிதர்*

**CLERKS IN VILLAGE COMMITTEES**

3. **ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදූව)

*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ)*

(Mr. Prins Gunasekera—Habaraduwa)

පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ගම්සභා ලිපිකරු සේවයේ 1959 වන විට ශ්‍රේණි කීයක් තිබුණාද? (ආ) ගම්සභා ලිපිකරු සේවයේ ශ්‍රේණි ක්‍රමය අහෝසි කළේ කවදාද ? (ඉ) මේ හේතුකොට ගෙන දෙවැනි ශ්‍රෙණියේ සිටි ලිපිකරුවන්ට හිඟ වැටුප් ගෙවීද ? (ඊ) පළමුවැනි ශ්‍රෙණියේ සිටි ලිපිකරුවන්ට ඒ හේතුවෙන් සිදුවූ අසාධාරණය ගැන එතුමා දන්නේද? (උ) එසේ නම්, ඔවුන්ට කළ යහපත කුමක්ද ? (ඌ) 1965. 1. 1 දින සිට ගම්සභා ලිපිකරු සේවයත්, පළාත් පාලන ලිපිකරු සේවයත් ඒකාබද්ධ කෙළේ කුමන ප්‍රතිපත්තියක් අනුවද? (එ) ඒ සඳහා ගම්සභා ලිපිකරු සේවයේ යෙදී සිටි, පසුව පළාත් පාලන සේවයට විභාග මාර්ගයෙන් උසස්ව ගිය ලිපිකරුවන්ට, වැටුප් වැඩිවීමක් දී පසුව එය වැරදීමක් යයි කියා ගෙවූ වැටුප් ආපසු අයකර ගන්නට චක්‍ර ලේඛයක් නිකුත් කළ බැව් එතුමා දන්නේද ? (ඒ) මේ හේතුවෙන් ලිපිකරුවන්ට විඳින්ට සිදුවී ඇති කරදර එතුමා දන්නේද ? (ඔ) මෙවැනි චක්‍ර ලේඛන නිකුත් කිරීමෙන් හා අවලංගු කිරීමෙන් අහිංසක සේවකයන්ට සිදුවන හිරිහැර ගැන වග කිව යුත්තේ කවුරුන් දැයි එතුමා සඳහන් කරනවාද ? (ඕ) ඉහත සඳහන් කරුණු ගැන සාධාරණයක් ඉටු කරලීමට එතුමා කටයුතු කරන්නේද ?

உள்ளூராட்சி அமைச்சரதும் தகவல் ஒலி பரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரிய தரிசியைக் கேட்ட வினு : (அ) 1959 ஆம் ஆண்டில், கிராமச் சங்க இலிகிதர் சேவையில் எத்தனை தரங்கள் இருந்தன ? (ஆ) கிராமச் சங்க இலிகிதர் சேவைத் தரமுறை எப்பொழுது நிறுத்தப்பட்டது ? (இ) இதன் பயனாக இரண்டாந் தர சேவையிலிருந்த இலிகிதர்களுக்கு சம்பள நிலுவைகள் கொடுக்கப்பட்டனவா ? (ஈ) இதனால் முதலாந்தர சேவையிலிருந்த இலிகிதர்களுக்கேற்பட்ட அநீதியை அவர் அறிவாரா ? (உ) அப்படியாயின் அவர்களுக்கு அளிக்கப்பட்ட உதவி என்ன ? (ஊ) 1.1.1965 தொடக்கம் கிராமச்சங்க இலிகிதர் சேவையையும் உள்ளூராட்சி இலிகிதர் சேவையையும் ஒன்று சேர்த்தது எந்தக் கொள்கையின் கீழ் ? (எ) கிராமச்சங்க இலிகிதர் சேவையிலிருந்து ஓர் சோதனையின் முடிவுகளைக்கொண்டு உள்ளூராட்சி இலிகிதர்சேவையிற் சேர்த்துக் கொள்ளப்பட்ட இலிகிதர்களுக்குச் சம்பள உயர்வு வழங்கப்பட்டதென்பதையும் இத்தொகை பிழையாகக் கொடுக்கப்பட்டதென்றும் அதைத் திருப்பிப் பெற

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

றுக்கொள்ளுமாறுங் கேட்டுக்கொள்ளும் ஓர் சுற்று நிருபம் பின்னுல் வெளியிடப்பட்ட தென்பதையும் அறிவாரா? (எ) இதனுல் இலி கிதர்களுக்கு ஏற்பட்ட கஷ்டத்தை அறி வாரா? (ஐ) சுற்று நிருபங்களே வெளியிடுவ திணுலும் ரத்து செய்வதிணுலும் குற்றமற்ற உத்தியோகத்தருக்கு ஏற்படுங் கஷ்டத்திற்கு காரணமாயுள்ளவர் யார் என்பதைக் கூறு வாரா? (ஒ) மேற்கூறிய விடயங்கள் சம்பந்த மாக நியாயம் வழங்குவதற்கு வேண்டிய நட வடிக்கையை அவர் எடுப்பாரா?

asked the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting: (*a*) How many grades existed in the Village Committee Clerical Services in 1959? (*b*) When was the system of grades in the Village Committee Clerical Service terminated? (*c*) Were arrears of salary paid to the Grade II clerks as a result of this? (*d*) Is he aware of the injustice caused to the Grade I clerks because of this? (*e*) If so, what relief was given to them? (*f*) On what principle was the amalgamation of the Village Committee Clerical Service and the Local Government Clerical Service effected in 1.1.1965? (*g*) Is he aware that the clerks of the Village Committee Clerical Service who were absorbed into the Local Government Clerical Service on the results of an examination were granted an increase of salary and that a circular was issued later to recover this money on the ground that it was paid in error? (*h*) Is he aware of the hardships the clerks have had to suffer as a result of this? (*i*) Will he state who are responsible for the hardships imposed on innocent employees as a result of the issue and cancellation of these circulars? (*j*) Will he take action to see that justice is done in respect of the above mtters?

**ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்ச ரதும் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)

(අ) දෙකයි. (ආ) ජනවාරි මස 1 වැනි දිනදීය. (ඉ) නැත. (ඊ) මම නො දනිමි. (උ) පැන නොනගී. (ඌ) කාර්යක්‍ෂම පළාත් පාලන සේවයක් උදෙසාය. මේ නිසා කලින් ගම්සභා ලිපිකරුවන්ට පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ II වැනි ශ්‍රේණියට උසස්වීමේ මාර්ග විවෘත වූ අතර, මහ නගර සභා, නගර සභා සහ සුළු නගර සභා වැනි සෙසු පළාත් පාලන ආයතනයන්හි සේවය කිරීමටද අවස්ථා සැලසුනි. (එ) ඔව්. පළාත් පාලන ලිපිකරු සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබීමෙන් පසු, මෙම ලිපිකරුවන්ට සමාන රජයේ සේවකයින්ට අදාල වන භාණ්ඩාගාර චක්‍රලේඛයක් පදනම් කර ගෙන, එක් වැටුප් වැඩිවීමක් වශයෙන්, මාසයකට රු. 6 බැගින් වූ, වැටුප් වැඩිවීමක් මෙම ගම්සභා ලිපිකරුවන්ට දෙන ලදී. මෙම වැටුප් වැඩිවීම ගෙවීමට නො හැකි බවට භාණ්ඩාගාරය විසින් රජයේ දෙපාර්තමේන්තු වෙත චක්‍රලේඛයක් පසුව යවනු ලැබූ නිසා වැඩිපුර ගෙවා ඇති මුදල සුදුසු පරිදි කොටස් වශයෙන් ආපසු අය කරගෙන යනු ලැබේ. (ඒ) නැත. (ඔ) සහ (ඕ) පැන නොනගී.

**ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)**

*(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை)*

(Mr. T. B. M. Herath—Walapane)

ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් අහන්න තියෙනව. පළාත් පාලන ලිපිකරුවන්ය කියා වෙනම නිකායක් තබන්නෙ නැතිව, ඒ අයත් රජයේ ලිපිකරු සේවයටම ඇතුළත් කිරීමට පළාත් පාලන ඇමතිතුමා මුදල් ඇමතිතුමත් සමග සාකච්ඡා කර ක්‍රියා මාර්ගයක් ගන්නවද කියා දැන ගන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඒ ගැන දැන්ම කිසි දෙයක් කියන්න බැහැ.

## අකුරණ ඡන්ද කොට්ඨාශයේ පේෂකර්ම මධ්‍යස්ථාන

*அக்குறணைத் தொகுதி : நெசவு நிலையங்கள்*

**AKURANA ELECTORATE : WEAVING CENTRES**

4. **හේමචන්ද්‍ර සිරිසේන මයා.** (අකුරණ පළමුවන මන්ත්‍රී)
*(திரு. ஹேமச்சந்திர சிறிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)*
(Mr. Hemachandra Sirisena—First Akurana)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : 1965/66 වර්ෂය වෙනුවෙන් අකුරණ ඡන්ද කොට්ඨාශයට අනුමත කරන ලද පේෂකර්ම මධ්‍යස්ථාන 14 සම්බන්ධයෙන් පහත දැක්වෙන විස්තර එතුමා සඳහන් කරනවාද ? (i) දැනට වැඩ නිමවී විවෘත කර ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද? නම් වශයෙන් මොනවාද ? (ii) දැනට ආරම්භ කර තිබෙන පේෂකර්ම මධ්‍යස්ථාන සංඛ්‍යාව හා නම් වශයෙන් ඒවා මොනවාද? (iii) එකී මධ්‍යස්ථාන සඳහා ගුරුවරු කී දෙනෙක් පත්කර සිටිත්ද ? (iv) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් මොනවාද ? (v) ඔවුන් පත්වූ දිනයන් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරනවාද ?

*உள்நாட்டு விவகார அமைச்சரைக் கேட்ட வினா: அக்குறணைத் தொகுதியில் 1965/66 வருடத்திற்கு அங்கீகரிக்கப்பட்ட 14 நெசவுத் தொழில் நிலையங்களைப் பற்றிய கீழ்க் கண்ட விபரங்களை அவர் கொடுப்பாரா :— (1) பூரணமாக்கித் திறக்கப்பட்ட நெசவுத் தொழில் நிலையங்கள் எத்தனை ? அவைகளின் பெயர்கள் யாவை ? (2) வேலை ஆரம்பிக்கப் பட்டுள்ள நிலையங்கள் எத்தனை ? அவைகளின் பெயர்கள் யாவை? (3) இந்நிலையங்களுக்கு எத்தனை ஆசிரியர்கள் நியமிக்கப்பட்டுள்ளார் கள்? (4) இவ்வாசிரியர்கள் ஒவ்வொருவருடைய பெயர், விலாசம் ஆகியவற்றை அவர் தருவாரா ? (5) ஒவ்வொரு ஆசிரியரினதும் நியமனத்திகதியை அவர் கூறுவாரா ?*

asked the Minister of Home Affairs : Will he give the following particulars regarding the 14 weaving centres that were approved for the Akurana electorate for the year 1965-66 : (i) What is the number of weaving centres that have now been completed and opened and what are their names ; (ii) What is the number of weaving centres where work has now commenced and what are their names ; (iii) How many teachers have been appointed for these centres ; (iv) Will he state the name and address of each of these teachers ; (v) Will he state the date of appointment of each of them ?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

ඔව්. (i) පහයි. නම් වශයෙන් :—බලකඩුව, එගොඩමුල්ල, ගල්ඇල්ල, ඕවිස්ස සහ හමන්ගොඩ. (ii) නවයයි. නම් වශයෙන් :—බටගල්ල, වැවල, ගල්හින්න, දූල්වල, මාරතුගොඩ, පංගොල්ලාමඩ, දෙහිඅංග, විලානගම සහ මාවතපොළ. (iii) ගුරුවරු 14 දෙනෙක් පත් කර ඇත.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, ගරු ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා ප්‍රශ්නයෙන් කොටස් තුනකට පමණයි, පිළිතුර දුන්නෙ. 4, 5 කොටස්වලට පිළිතුරු දුන්නෙ නැහැ.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

ඒ කොටස් දෙකට පිළිතුරු සැපයීමට මම සතියක් කල් ඉල්ලනව.

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புளை)*
(Mr. T. B. Tennekoon—Dambulla)

ප්‍රශ්නයකින් භාගයකට උත්තර දීමෙයි, භාගයකට උත්තර දීමට කල් ඉල්ලීමෙයි තේරුම මොකක්ද? ඒක කවදාවත් සිදු නොවුණ දෙයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මීට කලින් සිදු වුණේ නැති සිද්ධීන් හුඟක් අද දවසේ සිදු වන නිසා මම ඒකට ඉඩ දෙනව.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிறிசேன)*
(Mr. Hemachandra Sirisena)

ගරු කථානායකතුමනි, මීට කලින් මම ඔය විධියට ප්‍රශ්නයක් ඇහුවම කොටස් දෙකකට උත්තර දුන්නෙ නැහැ. කන්තෝරුවෙන් ඇහුවම කන්තෝරුවෙ ලිපිකරු මහත්වරු කිව්වා, ඇමතිතුමා උත්තර දුන්නය කියා. මේ කොටස් දෙකට පිළිතුරු සැපයීමට කල් ඉල්ලන විට මම ඉල්ලා සිටිනව, කුමන ප්‍රතිපත්තියක් අනුව මේ ගුරුවරුන් පත් කළාද යන්නත් සඳහන් කර ඒ පිළිතුරු සපයන ලෙස.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

දිසාපතිතුමාගෙනුත්, ඒ ප්‍රදේශයේ නිලධාරිතුමාගෙනුත්, ඒ නිලධාරිතුමා වගේම උසස් තවත් නිලධාරියකුගෙනුත් යුක්ත තේරීමේ මණ්ඩලයක් තිබෙනව. ඒ තේරීමේ මණ්ඩලය විසින් සියළුම ඉල්ලුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා මේ අය තෝරා ගත්තා.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிறிசேன)*
(Mr. Hemachandra Sirisena)

පත්වීම් දීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය අමාත්‍යාංශයෙන් පිළියෙල කර නිලධාරීන්ට යැව්වෙ නැද්ද?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

සුදුසුකම් සියල්ලම ගැසට් නිවේදනයේ අඩංගු කරනව. ඒ අනුව ලැබුණු ඉල්ලුම් පත්‍ර පරීක්ෂා කර බලනව. අවශ්‍ය සුදුසුකම් තිබෙන අයැදුම්කරුවන් පමණයි තේරීම් භාර මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන්නෙ. එවැනි සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම් දුන්නා. මේ පිළිබඳ සම්පූර්ණ විස්තර මහනුවර කච්චේරියට ගියොත් ගරු මන්ත්‍රීතුමාට දැන ගන්න පුළුවන් වේවි.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிறிசேன)*
(Mr. Hemachandra Sirisena)

මට දැන ගන්න ලැබී තිබෙන හැටියට නම් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීන්ගෙන් ලියුම් ගෙනා උදවියටයි පත්වීම් දී තිබෙන්නෙ.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

ගරු මන්ත්‍රීතුමාට ලැබී තිබෙන ආරංචිය වැරදියි. එසේ කර තිබෙනවා නම් කර තිබෙන්නෙ පත්වීම් සම්බන්ධ කටයුතු කරන මණ්ඩලයයි. ඒ මණ්ඩලය එසේ කළ බවට ගරු මන්ත්‍රීවරයා චෝදනාවක් කරනවා නම් ඒ චෝදනාව මට ඉදිරිපත් කළොත් මම ඒ ගැන විභාග කර බලන්නම්.

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ)
*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொடை)*
(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

පරීක්ෂා කරාවි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, පිළිතුරු දීම සඳහා කල් ඉල්ලන ප්‍රශ්න නැවත වරක් න්‍යාය පත්‍රයට එන්නෙ නැත්තෙ ඇයි?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ප්‍රශ්න තුනක් අහලා තියෙන නිසා තවත් ප්‍රශ්න අහන්න ඉඩ දෙන්න බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මා අහන්නෙ අතුරු ප්‍රශ්නයක් නොවෙයි. ගරු කථානායකතුමාගෙනුයි මේ ප්‍රශ්නය අහන්නෙ. මට දැන ගන්න වුවමනා කරන්නෙ, පිළිතුරු සූදානම් නැති නිසා කල් ඉල්ලන ප්‍රශ්න නැවත වරක් න්‍යාය පත්‍රයට අඩංගු නොකරන්නෙ මන්ද යන්නයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා මා කියන කාරණය පිළිපදිනවද ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඒ කාරණය සම්බන්ධයෙන් තමුන්නාන්සෙගෙ අවධානය යොමු කරන්නයි මට වුවමනා කළේ.

## සිනමා සේවකයින් සඳහා වේතන මණ්ඩලයක්

இயக்கப்படச் சேவையாளர்க்கு சம்பள நிர்ணய சபை

**WAGES BOARD FOR CINEMA EMPLOYEES**

5. **පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)
*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)*
(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) පුද්ගලික අංශයේ සිනමා චිත්‍රාගාරවල කාර්මිකයින්ගේ සහ වෙනත් සේවකයින්ගේ වේතන හා වෙනත් සේවා කොන්දේසි නිශ්චය කිරීම සඳහා වේතන මණ්ඩලයක් එතුමා පත් කරනවාද ? (ආ) එසේ නම්, කවදාද ? නො එසේ නම්, මන්ද ?

*தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா : (அ) தனியார் துறையிலுள்ள இயக்கப்படக் கலைக் கூடங்களிலுள்ள நுண்தொழிலாளருக்கும் பிறசேவையாளர்களுக்குமுரிய சம்பளம், சேவை நிபந்தனைகள் ஆகியவற்றை, நிர்ணயிப்பதற்கு சம்பள நிர்ணயச் சபையொன்றை அவர் நியமிப்பாரா ? (ஆ) அப்படியானால் எப்பொழுது ? இல்லையெனில் ஏன் ?*

asked the Minister of Labour, Employment and Housing : (*a*) Will he appoint a wages board to determine the wages and other conditions of service of technicians and other employees in the cinema studios in the private sector ? (*b*) If so, when ; if not, why ?

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

(අ) නැත. කෙසේ වෙතත් සිනමා චිත්‍රාගාරවල කාර්මිකයින් සහ වෙනත් සේවකයින් සිනමා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ දෘෂ්ටි පථයට ඇතුළත් කිරීමට දැනටමත් කම්කරු දෙපාර්තමේන්තුව කටයුතු කරගෙන යයි. (ආ) ඉහත (අ) හි සඳහන් පිළිතුරු කරණකොට ගෙන මෙය පැන නො නැඟේ.

## මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු : සිංහල මාධ්‍යයෙන් පුහුණුවන්නන්

பொது சுகாதாரப் பரிசோதகர் : சிங்கள மொழிமூல பயிற்சியாளர்

**PUBLIC HEALTH INSPECTORS : SINHALA MEDIUM TRAINEES**

6. **කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් තෝරා ගැනීම සඳහා, 65.9.18 වැනි දිනදී හෝ ඊට ආසන්න දිනයකදී විභාගයක් පැවැත්වූ බවත්, 66.6.22 වැනි දිනදී හෝ ඊට ආසන්න දිනයකදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ බවත්, සිංහල මාධ්‍යයෙන් සාමාර්ථය ලත් 42 කු පමණ, පුහුණුවීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

සඳහා තෝරාගනු ලැබූ බවත් එතුමා දන්නවාද ? (ආ) සිංහල මාධ්‍යයෙන් ඉගෙනීම ලැබූ අය සඳහාවූ සම්මුඛ පරීක්ෂණ, ගැසට් නිවේදනයෙහි සඳහන් වූ විධිවිධානවලට පටහැනිව, ඉංග්‍රීසි භාෂා වෙන් පැවැත්වූ බවත්, සිංහල මාධ්‍යයෙන් තෝරාගනු ලැබූ අයට ඔවුන්ට තේරුම් ගැනීමට අපහසු ඉංග්‍රීසි භාෂාවෙන් දේශන පවත්වනු ලබන බවත්, වර්‍ෂය අවසානයේ දී පවත්වනු ලබන ඔවුන්ගේ වාචික පරීක්ෂණයද ඉංග්‍රීසියෙන් පවත්වන බව ඔවුනට දන්වා තිබෙන බවත් එතුමා දන්නවාද ? (ඉ) සිංහල මාධ්‍යයෙන් තෝරා ගනු ලැබ කටුකුරුන්දේ පුහුණුව ලබන මෙම මහජන සෞඛ්‍ය පරීක්‍ෂකයින්ට පැවැත්වෙන දේශන සහ ඔවුන්ගේ පරීක්ෂණ, සිංහල භාෂාවෙන් කෙරෙන ලෙසට එතුමා පියවර ගන්නවාද ?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) 18.9.65 இல் அல்லது அத்தேதியளவில் பொதுச் சுகாதாரப் பரிசோதகர்களைத் தெரிவு செய்தற்கான பரீட்சையொன்று நடாத்தப்பட்டதென்பதையும், நேர்முகப் பரீட்சைகள் 22.6.66 இல் அல்லது அதற்கண்மையில் நடைபெற்றதென்பதையும், சிங்கள மொழிமூலம் தகைமைபெற்ற 42 பேர் வரையில் பயிற்சிக்காகத் தெரிவு செய்யப்பட்டனரென்பதையும் அவர் அறிவாரா? (ஆ) வர்த்தமானி அறிவித்தலுக்குமாறாக, சிங்களத்தில் கல்வி கற்றவர்களின் நேர்முகப் பரீட்சை ஆங்கிலத்தில் நடாத்தப்பட்டதென்பதையும், சிங்கள மொழிமூலம் தெரிவு செய்யப்பட்டவர்களுக்கு விரிவுரைகள் ஆங்கிலத்தில் நிகழ்த்தப்படுவதால் அவைகளை விளங்கிக் கொள்ள அவர்கள் கஷ்டப்படுகின்றனரென்பதையும் வருட இறுதியில் நடைபெறும் வாய்மொழிப் பரீட்சையும் ஆங்கிலத்தில்தான் நடைபெறுமென அவர்களுக்கு அறிவிக்கப்பட்டுள்ளதென்பதையும் அவர் அறிவாரா? (இ) சிங்கள மொழி மூலம் தெரிவு செய்யப்பட்டு கட்டுக்குறுந்தையில் பயிற்சி பெற்று வரும் பொதுச் சுகாதாரப் பரிசோதகர்களுக்கு சிங்களத்திலே விரிவுரைகள் ஆற்றப்படுவதற்கும் பரீட்சைகள் நடாத்தப்படுவதற்கும் அவர் நடவடிக்கை யெடுப்பாரா? ஆமெனில் எப்பொழுது, அன்றேல் ஏன்?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

asked the Minister of Health : (*a*) Is he aware that on or about 18.9.65 an examination was held to select public health inspectors, that interviews were held on or about 22.6.66, and that about 42 persons who had qualified in the Sinhala medium were selected for training ? (*b*) Is he further aware that the interviews of those who had studied in the Sinhala medium were held in English, contrary to the provisions of the Gazette Notification ; that those selected through the Sinhala medium are lectured to in English which they find difficult to follow, and that they have been informed that their *viva voce* test at the end of the year will also be conducted in English ? (*c*) Will he take steps to see that these P. H. Is, who are under training at Katukurunda and who had been selected through the Sinhala medium, are lectured to and examined in Sinhala ; and if not, why ?

**ගරු විමලා කන්නන්ගර (වැඩ බලන සෞඛ්‍ය ඇමතිනිය)**

*(திருமதி விமலா கன்னங்கரா—பதில் சுகாதார அமைச்சர்)*

(The Hon. Wimala Kannangara—Acting Minister of Health)

(අ) එසේ ය. සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් 43 දෙනෙකු තෝරා ගනු ලැබූහ. (ආ) සම්මුඛ පරීක්ෂණයන් පවත්වන ලද්දේ ඉංග්‍රීසියෙන් නොවේ. තෝරා ගනු ලැබූ අපේක්ෂකයින් සියලු දෙනාම සිංහල මාධ්‍යයෙන් සම්මුඛ පරීක්ෂණයට භාජන කරනු ලැබූහ. කථිකාචාර්යවරුන් සමහරෙකුට තවමත් සිංහලෙන් ඉගැන්වීමට නිපුණත්වයක් නොමැත්තේ ය. එවැනි කථිකාචාර්යවරුන් විසින් ඉංග්‍රීසියෙන් දේශනයන් පැවැත් වූ විට ඒ විගසම එම දේශනයන් අළලා සිංහලෙන් පාඩමක් මෙහෙයවනු ලැබේ. වර්‍ෂය අවසානයේදී පවත්වනු ලබන වාචික පරීක්ෂණය ඉංග්‍රීසියෙන් පවත්වන බවක් ඔවුන්ට දන්වා යවා නොමැතිය. (ඉ) මේය පැන නොනඟී.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
7 වැනි ප්‍රශ්නය.

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. சி. பி. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)
ගරු කථානායකතුමනි, 7 වැනි ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් ඉල්ලනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

### පළාත් පාලන ලිපිකරු සේවා විභාගය, 1964 : පත්වීම්

உள்ளூராட்சி எழுதுவினைஞர் சேவைப் பரீட்சை, 1964 : நியமனங்கள்

LOCAL GOVERNMENT CLERICAL SERVICE EXAMINATION, 1964 : APPOINTMENTS

8. **බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)
පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්න: (අ) 1964.10.24 වැනි දින පැවැත්වුණු පළාත් පාලන ලිපිකරු සේවා විභාගයෙන් සාමාර්ථ්‍යය ලැබූ සංඛ්‍යාවත්, මෙතෙක් පත්වීම් ලැබූ සංඛ්‍යාවත් එතුමා සඳහන් කරනවාද? (ආ) ඉතිරි සංඛ්‍යාවට පත්වීම් දීම ප්‍රමාදවීමට හේතුව කුමක් දැ'යි එතුමා පැහැදිලි කරනවාද ?

*உள்ளூர் ஆட்சி அமைச்சரினதும் தகவல், ஒலிபரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) 24.10.1964 இல் நடைபெற்ற உள்ளூராட்சி எழுதுவினைஞர் சேவைப் பரீட்சையில் சித்தியடைந்தோரின் எண்ணிக்கையையும் இது வரையில் நியமனங் கொடுக்கப்பட்டவர்களின் எண்ணிக்கையையும் அவர் கூறுவாரா? (ஆ) எஞ்சியுள்ளோருக்கு நியமனங்கள் வழங்கப் படுவதிலுள்ள காலதாமதத்திற்கான காரணத்தை அவர் விளக்குவாரா?*

asked the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting : (*a*) Will he state the number of those who passed the Local Government Clerical Service Examination held on 24.10.1964 and the number of those who have been appointed so far ; (*b*) Will he explain the reason for the delay in giving appointments to the rest ?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
(අ) තෝරාගනු ලැබූ 383 දෙනාගෙන්, 1967.3.19 දක්වා 298 දෙනෙකු පත්වීම් ලබා ඇත. (ආ) පත්වීම් කරනු ලබන්නේ, පුරප්පාඩු ඇති වී, පළාත් පාලන ආයතන විසින් ඒ ගැන කොමිෂන් සභාවට වාර්තා කළ විටය. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා පත්වීම් කිරීමේ පුරුද්ද නතර කර තිබේ. මින් ඉදිරියට පත්වීම් කරනු ලබන්නේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා පමණකි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
1964.10.24 වන දින පැවැත්වූ විභාගයට පසු පළාත් පාලන ලිපිකරුවන් තෝරාගැනීමට විභාගයක් පවත්වා තිබෙනවද? එසේ නම් ඇයි එම විභාගය පැවැත්තුවේ ?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
පසුව ඊට පිළිතුරු දෙන්නම්. කල් දෙන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
අපි දෙන්නම් පිළිතුරු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ගරු මන්ත්‍රීතුමාට ඒ ගැන පිළිතුරු ලියා එවන්ට මට පුළුවනි. [බාධා කිරීම්]

## උතුරු, නැගෙනහිර පළාත්වල තැපැල් කාර්යාල : සිංහල භාවිතය

வடகிழக்கு மாகாணங்களிலுள்ள தபால் நிலையங்கள் : சிங்கள உபயோகம்

**POST OFFICES IN NORTHERN AND EASTERN PROVINCES : USE OF SINHALA**

9. **තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) සිංහල විදුලි පණිවුඩ බාර නොගන්නා තැපැල් කාර්යාල ගණනක් උතුරු, නැගෙනහිර පළාත්වල ඇති බව එතුමා දන්නවාද ? (ආ) එම තැපැල් කාර්යාලයයන්හි නම් ලැයිස්තුව එතුමා ඉදිරිපත් කරනවා ද ? (ඉ) සිංහලයෙන් කටයුතු කිරීම සඳහා එම තැපැල් කාර්යාලයයනට අවශ්‍ය නිළධාරීන් පත් කිරීමට එතුමා ක්‍රියා කරනවාද? (ඊ) එසේ නම්, ඒ කවදා සිට ද ? (උ) නො එසේ නම්, ඒ මන්ද ?

*அரசாங்க கட்டுவேலை, தபால், தந்திப்போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா : (அ) வட, கிழக்கு மாகாணங்களில் சிங்களத் தந்திகளை ஏற்றுக்கொள்ளாத அஞ்சல் நிலையங்கள் பல உண்டென்பதை அவர் அறிவாரா? (ஆ) அத்தகைய அஞ்சல் நிலையங்களின் பெயரடங்கிய பட்டியலொன்றை அவர் சமர்ப்பிப்பாரா? (இ) இவ்வித அஞ்சல் நிலையங்களில் சிங்களத்தில் செயலாற்றத் தேவைப்படும் உத்தியோகத்தர்களை நியமிக்க அவர் நடவடிக்கை எடுப்பாரா ? (ஈ) ஆமெனில் என்று தொடக்கம்? (உ) இல்லையெனின் ஏன் ?*

asked the Minister of Public Works, Posts and Telecommunications : (*a*) Is he aware that there are a number of post offices in the Northern and Eastern Provinces where Sinhala telegrams are not accepted ? (*b*) Will he submit a list of the names of such post offices ? (c) Will he take action to appoint to these post offices the officers necessary for them to function in Sinhala ? (*d*) If so, from when ? (*e*) If not, why ?

**පී. සී. ඉඹුලාන මයා. (කෘෂිකර්ම හා ආහාර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්—රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමති වෙනුවට)**
*(திரு. பீ. சீ. இம்புலான—விவசாய, உணவு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி—அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சர் சார்பாக)*
(Mr. P. C. Imbulana—Parliamentary Secretary to the Minister of Agriculture and Food—on behalf of the Minister of Public Works, Posts and Telecommunications)

(අ) තැපැල් කාර්යාල 10 ක් ඇත. (ආ) 1. ඩෙල්ෆ්ට්. 2. වේලනේ. 3. පන්ඩතෙරුප්පු. 4. තෙලිප්පල. 5. චුන්ඩිකුලිය. 6. වන්නාර් පොන්නේ. 7. කිලිනොච්චි. 8. නැදුන්කර්නි. 9. කාතන්කුඩි. 10. අට්ටාලචේන. (ඉ) ඔව්. (ඊ) සුදුසු කාර්ය මණ්ඩලයක් ලබාගැනීමට හැකිවූ විගසින්ම. (උ) පැන නොනඟී.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

සිංහල රජයේ බස වී තිබෙන්නෙ මේ විධියටද ?

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

සුදුසු කාර්ය මණ්ඩලයක් ලබා ගැනීමට හැකි වූ විගසින්ම කියා පිළිතුරු දෙන විට සඳහන් කළා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

අවුරුදු කීයකින් ඉවු කරනවද ?

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

ඇමතිතුමාගෙන් අහල කියන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
මේ විධියට තමයි රටේ සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වෙලා තියෙන්නෙ.

## දුම්රිය ස්ථානාධිපති සේවා විභාගය, 1965 : ප්‍රතිඵල

புகையிரத நிலைய அதிபர்கள் சேவைப் பரீட்சை 1965 : பெறுபேறுகள்

STATION-MASTERS' SERVICE EXAMINATION, 1965 : RESULTS

10. බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ)
(திரு. பேர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு)
(Mr. Bernard Soysa—Colombo South)
ප්‍රවාහණ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) දුම්රිය ස්ථානාධිපති සේවාවට (II වැනි පෙළ) බඳවා ගැනීමේ විභාගයක් 1965 සැප්තැම්බර් 25 වැනිදා පැවැත් වූ බවත්, 1965 ජූනි 18 වැනිදා ගැසට් පත්‍රයේ දැන්වීමක් මඟින් විභාගයට ඇතුළු වීමේ අයදුම්පත් කැඳවූ බවත් ; (ii) විභාග යට පෙනී සිටි කිසිවෙකු හෝ මෙතෙක් එහි ප්‍රතිඵල නො දන්නා බවත් ; එතුමා දන්නවාද? (ආ) (i) ප්‍රතිඵල ප්‍රකාශ කිරීමට ප්‍රමාද වීමේ හේතුවත් ; (ii) 1965 ජූනි 18 වැනිදා එකී දැන්වීමෙන් ප්‍රකාශයට පත් කළ යෝජිත බඳවාගැනීම සම්බන්ධ යෙන් එතුමා ගන්නට බලාපොරොත්තු වන ක්‍රියා මාර්ගයත්; එතුමා සඳහන් කරනවාද ?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) 1965, செப்ரெம்பர் 25 ஆம் திகதி யன்று புகையிரத நிலைய அதிபர்கள் சேவைக்கு (II ஆம் வகுப்பு) ஆட்களைச் சேர்ப்பதற்கு பரீட்சையொன்று நடாத்தப்பட்டதென்பதையும், 1965, ஜூன் 18 ஆம் திகதி யிடப்பட்ட அரசாங்க வர்த்தமானியில் வெளியான அறிவித்தல் மூலம் பரீட்சைக்கு அனுமதிப்பதற்கு விண்ணப்பங்கள் கோரப்பட்டன வென்பதையும் ; (ii) பரீட்சைக்குத் தோற்றியவர்களில் எவருக்கேனும் பரீட்சையில் பெறு பேறுகள் இதுவரை தெரியாதென்பதையும் அவர் அறிவாரா? (ஆ) (i) பரீட்சையின் பெறுபேறுகளை வெளியிடுவதில் தாமதம் ஏற்படுவதற்கான காரணத்தையும் ; (ii) 1965, ஜூன் 18 ஆம் திகதி அறிவித்தலில் வெளியிடப்பட்ட உத்தேச ஆட்சேர்ப்புச் சம்பந்தமாய் அவர் மேற்கொள்ளவிருக்கும் நடவடிக்கை என்னவென்பதையும் அவர் கூறுவாரா ?

asked the Minister of Communications: (a) Is he aware that—(i) an examination for recruitment to the Station Master's Service (Class II) was held on September 25, 1965, and that applications for admission to the examination were called for by Notice in the Government Gazette of June 18, 1965 ; (ii) the results are not yet known to any of those who sat ? (b) Will he state—(i) the cause for the delay in making the results known ; (ii) the action he contemplates taking in regard to the proposed recruitment that was announced in that notice in June 18, 1965 ?

ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)
(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)
(The Hon. E. L. B. Hurulle—Minister of Communications)
(අ) (i) ඔව්. (ii) ඔව්. (ආ) (i) අපේක්ෂකයින් 958 ක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කළ බැවිනි. (ii) හැකි පමණ ඉක්මනින් පත්වීම් දෙනු ලැබේ.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னட் சொய்சா)
(Mr. Bernard Soysa)
පත්වීම් දෙන්නෙ විභාග ප්‍රතිඵලවලට අනුවද ?

ගරු හුරුල්ලේ
(கௌரவ ஹுருல்ல)
(The Hon. Hurulle)
ගරු මන්ත්‍රීතුමා මෙන්ම මාද මෙය ඉක්මණින් අවසන් කරන්ට බලාපොරොත්තු වෙන් සිටිනව.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னட் சொய்சா)
(Mr. Bernard Soysa)
විභාග ප්‍රතිඵලවලට අනුවද පත්වීම් දෙන්ට යන්නෙ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)
එහෙම තමයි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
කී දෙනෙකුට පත්වීම් දෙන්ට බලාපොරොත්තු වෙනවද?

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)
200 කට පමණ.

## රයිගම් කෝරළේ ග්‍රාම සේවකයින් : සහතික නිකුත් කිරීම

றைகம் கோறளே கிராம சேவையாளர் : அத்தாட்சிப் பத்திரங்கள் வழங்கல்

GRAMASEVAKAS, RAIGAM KORALE: ISSUE OF CERTIFICATES

2. **ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය) (රත්නසිරි වික්‍රමනායක මයා.—හොරණ—වෙනුවට)
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய—திரு. ரத்னஸிரி விக்ரமநாயக்க—ஹொறன—சார்பாக)*
(Mr. Lakshman Jayakody—Divulapitiya—on behalf of Mr. Ratnasiri Wickramanayaka—Horana)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රයිගම් කෝරළයේ ආදායම් පාලක නිලධාරි කොටසේ ග්‍රාමසේවක මහතුන් කෙනෙකුට අවශ්‍ය කිසිම සහතිකයක් ආදායම් පාලක නිලධාරිගේ අවසරය නැතුව නිකුත් නොකරන බව එතුමා දන්නවාද? (ආ) මේ නිසා මහජනයාට විශාල කරදරයකට මුහුණපාන්ට වී ඇති බව එතුමා දන්නවාද? (ඉ) මහජන බැංකුවෙන් ණය ඉල්ලුම්කරුවෙකුට අවශ්‍ය ආදායම් වාර්තාවක් ග්‍රාමසේවක මහතෙකුගෙන් ගැනීමට අපහසු වී ඇති බව දන්නවාද? (ඊ) මෙය දීමට මහජන බැංකුවෙන් ග්‍රාමසේවක මහතාට ලිපියක් අවශ්‍ය බව ග්‍රාමසේවක මහත්වරු සහ ආදායම් පාලක නිලධාරි මහතා පවසන බව එතුමා දන්නවාද? (උ) මහජන බැංකුවෙන් එවැනි ලිපියක් ග්‍රාමසේවක මහතෙකුට හෝ ආදායම් පාලක නිලධාරිතුමාට දීමට නොහැකි බවත්, බැංකුවේ සම්බන්ධකම ණය ඉල්ලුම්කරු සමග පමණක් බවත් ප්‍රතිපත්තියක් වශයෙන් බැංකුව පිළිපදින බව එතුමා දන්නවාද? (ඌ) මේ කාරණා නිසා විශාල කරදරයකට මුහුණ පා ඇති මහජනයාට, අවශ්‍ය සහතික සහ වාර්තා සැපයීමට ග්‍රාමසේවක මහතුන්ට ඉඩ දීම පිණිස දැනට ඇති ඉහත සඳහන් දුෂ්කරතාවයන් හෝ රෙගුලාසි නොපමාව අහෝසි කරනවා ද?

*உள்நாட்டு விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) றைகம் கோறளே மாவட்ட இறைவரி உத்தியோகத்தரது பிரிவைச் சேர்ந்த கிராம சேவையாளரால் பொது மக்களுக்குத் தேவைப்படும் அத்தாட்சிப் பத்திரங்கள் எவையும் மாவட்ட இறைவரி உத்தியோகத்தரது அனுமதியின்றி வழங்கப்படுவதில்லை யென்பதை அவர் அறிவாரா? (ஆ) இந்நடவடிக்கை பொதுமக்களுக்கு மிகுந்த அசௌகரியங்களை ஏற்படுத்தியுள்ளதென்பதை அவர் அறிவாரா? (இ) மக்கள் வங்கியிலிருந்து கடன் பெறுவதற்கேதுவாக விண்ணப்பதாரர் ஒருவரால் சமர்ப்பிக்கப்படவேண்டிய அவரது வருமான அத்தாட்சிப் பத்திரத்தைக் கிராம சேவகரொருவரிடம் பெற்றுக்கொள்வது கஷ்டமாகவுள்ளது என்பதை அவர் அறிவாரா? (ஈ) வருமான அத்தாட்சிப் பத்திரம் வழங்கப்படுவதன் முன்னர் அதுசம்பந்தமாய் மக்கள் வங்கியால் கிராம சேவகருக்கு எழுதப்பட்ட கடிதம் ஒன்று அவசியமென கிராமசேவகரும் மாவட்ட இறைவரி உத்தியோகத்தரும் கூறுகின்றனரென்பதை அவர் அறிவாரா? (உ) தமது தொடர்புகள் யாவும் கடனுக்கு விண்ணப்பித்த விண்ணப்பதாரருடன் மாத்திரமே என்ற கொள்கைக்கமைய கிராம சேவகருக்கோ அல்லது மாவட்ட இறைவரி உத்தியோகத்தருக்கோ கடிதம் கொடுக்க முடியாது என்ற நிலையை வங்கி கடைப்பிடிக்கிறதென்பதை அவர் அறிவாரா? (ஊ) மேற்கூறிய காரணங்களால் பொது மக்கள் பெருமளவு அசௌகரியங்களை அனுபவிக்க வேண்டியுள்ளமையை முன்னிட்டு பொது மக்களுக்குத் தேவையான அத்தாட்சிப்பத்திரங்களையும் ஏனைய சாதனங்களையும் கிராம சேவகர்களே வழங்குவதற்கேதுவாக மேற்கூறப்பட்ட தடைகளை அல்லது நிபந்தனைகளைக் காலதாமதமின்றி அவர் அகற்றுவாரா?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

asked the Minister of Home Affairs: (*a*) Is he aware that no certificate whatsoever required by the public is issued by the gramasevakas of the Raigam Korale D. R. O's Division, except with the approval of the D. R. O.? (*b*) Is he aware that this has caused the general public much inconvenience? (*c*) Is he aware that it has become difficult to obtain from a gramasevaka the certificate of income which an applicant has to submit in order to obtain a loan from the People's Bank? (*d*) Is he aware that the gramasevakas and the D. R. O. say that a letter addressed to the gramasevaka by the People's Bank on the subject, is required before a certificate of income can be issued? (*e*) Is he aware that the bank takes up the position that, on principle, its dealings are only with the applicant for a loan and as such, a letter addressed either to the gramasevaka or the D. R. O. cannot be issued? (*f*) In view of the very great inconvenience that the general public have to undergo for the above reasons, will he without delay eliminate the obstacles or regulations stated above, so as to make it possible for the gramasevakas to issue the certificates and other documents required by the public?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

(අ) ග්‍රාම සේවකගේ නිර්දේශය අනුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි විසින් සහතික නිකුත් කරනු ලැබේ. ඇතැම් සහතික වලට ප්‍රාදේශීය ආදායම් නිලධාරි විසින් අනුඅත්සන යොදනු ලැබේ. (ආ) මම දැන නොසිටිමි. (ඉ) ආදායමට බැර කරනු ලබන එක්තරා සියයට ගණනක් අයකර ග්‍රාම සේවකයින්ගේ නිර්දේශය අනුව ප්‍රා. ආ. නි. විසින් සහතික නිකුත් කළ යුතුව ඇත. (ඊ) මම දැන නොසිටිමි. (උ) (ඊ) අනුව පැන නොනඟී. (ඌ) සෑම සහතිකයක්ම නිකුත් කිරීම ප්‍රාදේශීය ආදායම් නිලධාරි විසින් දිගටම කරගෙන යා යුතුය. මහජනයාට අපහසුවක් හෝ ප්‍රමාදයක් ඇති නොවීමට වග බලාගත්තා ලෙස උපදෙස් නිකුත් කර ඇත.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මට අතුරු ප්‍රශ්නයක් අහන්ට තිබෙනවා. ප්‍රාදේශීය ආදායම් නිලධාරිතුමාට සියයට 5 ක පමණ මුදලක් අය කිරීමට ඉඩ දී තිබෙනවා. නමුත් ග්‍රාම සේවකගෙ වාර්තාව අනුවයි ඒවා නිකුත් කළ හැකි වන්නෙ. එසේ නම් ඒ ග්‍රාම සේවකට එම කොමිසමෙන් කොටසක් නොදෙන්නෙ මන් ද?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

එම කරුණ ගැන කල්පනා කර ගෙන යනවා. නියම විධියට නිර්දේශ කරන්නෙ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනයි. ග්‍රාම සේවක කරන්නෙ උපදෙස් දීමයි. එත කොට නියම වශයෙන් නිර්දේශ කරන්නෙ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැන බව අපට පේනවා. නීතියෙ හැටියට එය උසස් නිලධාරියකුගෙ නිර්දේශයක් විය යුතුයි. නීතියෙ හැටියට මුදල් ගෙවිය යුත්තෙ නිර්දේශ කරන නිලධාරියටයි. නමුත් එයින් කොටසක්වත් ග්‍රාම සේවකට ගෙවීම පිළිබඳව දැන් භාණ්ඩාගාරයත් සමග ලියුම් ගනුදෙනු කර ගෙන යන බව මතක් කරන්ට කැමතියි.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

Sir, before we proceed to the Business of the day——

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Is it a supplementary question?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

——I wish to bring to your notice a very important matter. You are probably aware that hon. Members have given notice of a number of Questions for Oral Answer. In

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නිල් ද අල්විස් මයා.]

fact, some of these Questions have become stale. When Answers are given to Questions a number of months after they have been sent in, the purpose in asking such Questions is lost.

I think, some time ago, when this matter was raised, you decided that at least twenty Questions should be put down on the Order Paper. Now, if you would please refer to today's Order Paper you will find that there are only ten Questions. There are quite a number of Questions notice of which had been given some months ago but which have not appeared on the Order Paper.

We feel, Sir, that something is happening in your office, and I respectfully submit that you should go into this matter and see that a sufficient number of Questions appear on the Order Paper because if Questions are not answered within a certain time they lose their usefulness.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I shall look into the matter.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு.ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඊටම අදාළව මාත් වචනයක් කියන්නට කැමතියි. පිළිතුරු සැපයීම සඳහා ඇමති වරුන් විසින් කල් ඉල්ලන ලද මගේ ප්‍රශ්න කීපයක්ම තිබෙනවා. ඒ ප්‍රශ්න නැවත වරක් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ ප්‍රමාදයක් ඇති බව කියන්නට ඕනෑ. ඒ වගේම ප්‍රශ්නයක් හෝ ලියමනක් හෝ මන්ත්‍රී මණ්ඩල කාර්යාලයට යැවූ විට ඒවා පිළිබඳව පිළිතුරු ලැබෙන්නේ නැහැ. වරක් මා මේ ගැන විමසූ විට මා විසින් එවන ලද ප්‍රශ්න ලැබුණු බව මට දන්වා එවා තිබුණා. මේ අතර පිළිතුරු සැපයීම නැවතත් ප්‍රමාද කර තිබෙනවා. ඒ ගැන සොයා බලන්න.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඒ ගැන සොයා බලනවා.

## ශෝකප්‍රකාශය : අප්පකුට්ටි අප්පදුරේ මයා.

*அனுதாபத் தீர்மானம் : திரு. அப்பாக்குட்டி அப்பாத்துரை*

## VOTE OF CONDOLENCE : MR. APPACUTTY APPADURAI

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**
*(கௌரவ சி. பி. டி சில்வா—காணி, நீர்ப் பாசன, மின்விசை அமைச்சரும் சபை முதல் வரும்)*
(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

With your permission, Sir, I wish to refer to the passing away of Mr. Appacutty Appadurai, who was a Member of the Legislative Council.

When the seat occupied by the late Sir Ponnambalam Ramanathan in the Legislative Council fell vacant, Mr. Appadurai contested the by-election and was returned to the Kankesanturai Seat.

Mr. Appadurai was a lawyer by profession who contributed much to the progress of this country. He commanded an extensive practice in the Peninsula and also devoted his attention to the affairs of local bodies.

It was not only on political and social affairs that Mr. Appadurai spent his valuable time ; he was also actively interested in agriculture and industries. He worked hard for the promotion of the tobacco trade in Ceylon. His religious activities induced him to do research work in Tamil literature and to produce a studied thesis on Tamil Origin.

On behalf of all Members of this House, I wish to record our sincere regrets at the passing away of Mr. Appadurai, and request you to convey our deepest sympathies to the bereaved members of his family.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වී. ධර්මලිංගම් මයා. (උඩුවිල්)**
*(திரு. வீ. தர்மலிங்கம்—உடுவில்)*
**(Mr. V. Dharmalingam—Uduvil)**

*கௌரவ சபாநாயகரவர்களே, சபை முதல்வர் அவர்கள் கொண்டுவந்த இந்த அனுதாபப் பிரேரணையை அநுவதிப்பதில் நான் மிகவும் பெருமையடைகிறேன்.*

*அமரர் அப்பாத்துரை அவர்கள் ஒரு சிறந்த குடும்பத்தைச் சேர்ந்தவர். பல்வேறு துறைகளில் அதாவது கல்வித் துறை, சமயத்துறை, சமூக சீர்திருத்தத்துறை முதலிய பல்வேறு துறைகளில்—சிறந்த சேவைகளைச் செய்த குடும்பத்தைச் சேர்ந்தவர் அமரர் அப்பாத்துரை. அமரர் அப்பாத்துரை அவர்களும் பல்வேறு துறைகளில் உழைத்திருக்கிறார்கள். சபை முதல்வர் அவர்கள் குறிப்பிட்டதுபோல், அவர் வழக்கறிஞராக மிகவும் சிறந்த முறையில் கடமை செய்து அனைவரது பாராட்டுதல்களையும் பெற்றார். அது மாத்திரமல்ல. 1931 ஆம் ஆண்டில் காலஞ்சென்ற சேர் பொன்னம்பலம் இராமநாதன் அவர்களின் சட்டசபை இடத்திற்கு திரு. ஜெகந்நாதன் தியாகராசா, திரு. வீ. முத்துக்குமாரு ஆகியோரை எதிர்த்துப் போட்டியிட்டு அந்தத் தொகுதியின் பிரதிநிதியாகத் தேர்ந்தெடுக்கப்பட்டார். அதன் மூலம் அவர் தமிழ் மொழிக்கும் நாட்டுக்கும் அரும்பெரும் சேவையை ஆற்றியுள்ளார்.*

*அவர் இளைப்பாறியபோது ஒரு ஞானியாகவும், சமயத் துறையில் மிகுந்த ஈடுபாடு கொண்டவராகவும் விளங்கினார். அவர் ஒரு சிறந்த அறிஞர். தமிழ் ஆராய்ச்சியில் இறங்கி சிறந்த ஒரு நூலை அவர் எழுதியதை இப்பொழுது ஞாபகப்படுத்த விரும்புகிறேன். அந்நூலில், தமிழ்தான் எல்லா மொழிகளுக்கும் தாய் மொழி என்பதை அவர் விளக்கியிருக்கிறார். இன்று இந்தியாவின் ஜனாதிபதியாக இருக்கும் டாக்டர் ராதாகிருஷ்ணன் போன்ற பலர் அதனைச் சிறந்த கருத்து என்று பாராட்டியிருக்கிறார்கள். அதை இந்தச் சந்தர்ப்பத்தில் ஞாபகப்படுத்துவதில் நான் மிக்க பெருமையடைகிறேன். சபை முதல்வர் அவர்கள் கொண்டுவந்த அனுதாபப் பிரேரணையை நான் வழிமொழிகிறேன்.*



**මෛත්‍රීපාල සේනානායක මයා. (මැදවච්චිය)**
*(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)*
(Mr. Maithripala Senanayake—Medawachchiya)

Now what happens is that on account of the shortage of housing space in Colombo there is a tendency for rents to rise; there is blackmarket rent. There is a rent that is shown on the face of the receipt and there is a blackmarket rent that is actually paid. At every revision of assessments the Assessor's Department takes into account the blackmarket rent that is paid. When they find out that in fact a tenant is paying not Rs. 100 as he says but 250 in respect of certain premises, the Assessor's Department says, "Well, Rs. 250 per month is in fact the potential income from this premises, and therefore the annual value has to be revised accordingly." If the annual value is to be realistic you must take into account the true rent that is paid which may be a blackmarket amount, and this amount is determined by the shortage of housing space in Colombo. And therefore at every revision there is a tendency for the assessed annual value to rise.

When the annual value rises the amount paid by way of rates also increases. And since the Rent Restriction Act provides for the passing on to the tenant of the amount of the rate paid by an increase of the rent by that amount, what happens is that the legally assessed rent also goes up by that amount. When the legally assessed rent goes up by that amount the blackmarket rent also tends to increase. When the blackmarket rent increases the assessed annual value is increased, and the amount you pay by way of rates is increased. So this is a continuous process.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I can quote the very figures. In 1960 when the hon. Parliamentary Secretary first became a member of the Colombo Municipal Council, the amount that the Colombo Municipal Council derived from the consolidated rate of 30 per cent. was Rs. 14 million. Today without any significant increase in the number of buildings to justify an increase, the total amount that is collected by way of rates is Rs. 25 million within city limits. Between 1950 and 1967—over a period of 16 years—the total amount that the Colombo Municipal Council derives by way of rates has increased from Rs. 14 million to Rs. 25 million. Now this is a tremendous burden, an unconscionable burden, that is placed by the Colombo Municipal Council upon the ratepayer.

It is high time that the Hon. Minister did something to relieve the poor tenant of the burden that he has to bear, but from the point of view of real relief to the tenant the hon. Parliamentary Secretary's Bill becomes irrelevant. He is enabled by this to vary the rate on an area basis, taking into account the services provided. I say, Sir, that he should take unto himself the power to vary the rate according to variations in the annual value, which would reflect, even in a devious way, the capacity to pay of the tenant. Even in a devious way, the annual value—the assessed annual value—would reflect that. And that is why I say that, if he is in fact going to change the rating law, the correct change that should be made is to relate it to the annual value of the houses and not to the services provided because, on the question of services provided, to make a change from area to area within one particular set of municipal limits would in fact be an invidious task for any local council to undertake.

Today, the people of Kirillapone, as the Hon. Minister of State knows, say that they are badly treated by the Colombo Municipal Council. They complain of stepmotherly treatment; they complain of lack of water services; they complain of lack of drainage services; and they say, "Why are we being asked to pay 30 per cent ?"

There is the area represented by my Hon. Friend the Minister of Nationalized Services. He represents the Colombo North constituency here. He has represented a ward of Colombo North in the Municipal Council for a number of years. He was also the Mayor of Colombo for a number of years. The Hon. Minister was unable to get certain areas of Colombo North sewered. There are a large number of areas in Colombo North still remaining unsewered. But those are the people who have paid the consolidated rate of 30 per cent. for years to the council.

If there should be any desire on the part of the Colombo Municipal Council to reduce the rates in respect of any area in Colombo North, part of which is the old residential area coming down from Dutch times, there would be an outcry in Kirillapone. If, on the other hand, the Colombo Municipal Council tries to make a further variation, as demanded by me, and reduce the consolidated rate in Kirillapone or in the Pamankade East Ward, then the people in Colombo North would have a just cause for complaint against the council.

I say that the hon. Parliamentary Secretary has not given his mind to the real question of local government finances at all. What is required is to get away from this antiquated system of rates—a system of rates which comes down from the days of the Tudors in England. After the Spanish wars there were a large number of disabled persons in Britain who had to be looked after, and that duty was cast upon local authorities in the form of public assistance. Towards meeting the cost of that public assistance, the State decreed that the parishes that were entrusted with that task could levy a tax on land. That is how the system of assessed annual values came into being.

Sir, we are continuing to tinker with that system which has come down from the reign of Elizabeth I

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

to the reign of Elizabeth II and trying to see how we can make it suitable for this country. I say that it is time we abolished it and introduced a new system whereby local authorities could collect revenue. It may be that a property tax is the easiest. There are so many ways in which it can be reformed. It is not necessary for the Government to accept Marxist principles or anything like that. There are so many ways in which the system of local government finances can be altered to suit local conditions.

For instance, in Johannesburg there is a system which is far from being socialist or Marxist, whereby income is derived not from rates but from a betterment tax on the basis of included areas. They buy undeveloped lands, develop them, and sell them at a higher rate. They reconvey it and the profit that is derived from that is used as capital. A part of this capital is used for further development and the other part of it is revenue of the Council for its activities.

The Johannesburg Council, which is very far from being socialist, runs utility services of various kinds—cinemas, beauty parlours, hairdressers' saloons and a number of things of that kind.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

Massage clinics !

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I am told that the Singapore Municipality is considering the question of running massage clinics also.

There are a number of utility services from which revenue can be derived without hacking at this ancient system of rating.

The Hon. Minister's Government were loud in their protest against the Turnover Tax. They have been in office for two years. I do not think there is any proposal from the Hon. Minister of Finance to do away with the Turnover Tax. The Hon. Minister of Finance, when he was in the opposition, was one of the loudest opponents of the Turnover Tax.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

They have turned over !

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I also had my own criticism to make of that tax. I had it then and I still have criticisms to make of that tax. The Turnover Tax has produced a fair proportion of governmental revenue and that is why those who opposed the tax find that it is impossible—when they have got into office—to do away with the tax that they opposed. I do not want to quote what the present Hon. Minister of Finance said against this tax. When he was on this side he was the loudest opponent of the Turnover Tax. Today he derives a fair amount of revenue from that tax and he cannot do without it.

A Turnover Tax or a Sales Tax, to which it was linked, is in fact a proper source of revenue for a local authority instead of rates. Why does not the hon. Parliamentary Secretary say that a certain proportion of the Turnover Tax that the Government gets should be allocated on a certain basis to the local authorities because it is in fact a proper local authority tax that is being collected ?

There was a proposal made by a former Commissioner of Local Government, Mr. V. C. Jayasuriya, who for a long time was Commissioner of Local Government. He made the proposal, a very sensible proposal, of levying a parallel income tax with a certain fixed minimum below which you do not

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

tax, and the Central Government's income tax being adjusted in order to provide for the local authority to obtain the parallel income tax.

These are new methods of taxation which are available to the Hon. Minister from the point of view of local government tax reforms. He should find new methods instead of tinkering with this system of rates in a manner which is not going to give the relief that is required.

I do not know about Badulla or Matale or some of these areas which have not had the benefit of a separate differential rates law passed for them. That may give a relief to certain undeveloped areas within municipal limits, but as far as Colombo is concerned, this law is irrelevant. It is not going to give one atom of relief more than what the law enables the Council to do now. That is one side of the matter. The other is, from the point of view of Colombo, this Bill that the Hon. Minister has brought does not in any way tackle the real problem; that is, the tremendous burden of taxation that is placed upon the poor man living in Colombo.

If you take the totality of Colombo's revenue, if you take the amount that is given by way of Governmental rates, it will be seen that a single individaul in Colombo pays something in the nature of Rs. 50 a year towards the local authority, which is a very high percentage of the estimated *per capita* income in this country. It is more than Rs. 50 a year. It comes to something in the neighbourhood of about 11 per cent. of the *per capita* income. That is paid to the local authority by way of taxes by every single individual in Colombo. The Hon. Minister will therefore realize that what he is collecting by way of rates is passed on to the tenant through the rent that is collected. What is paid by way of licensing fees is passed on to the poor man through prices. The Hon. Minister of Nationalized Services, when he was Mayor of Colombo, in response to the demand that there should be some reduction of taxes, made some changes. What are the changes he made? He reduced the tax on elephants in Colombo—

සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය. (අත්තනගල්ල)
*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டார நாயக்க—அத்தனகல்ல)*
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

Two-legged elephants!

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

—and he reduced the tax on donkeys. Yes, the donkey tax and the elephant tax were reduced when there was a tremendous demand from the poor for reduced taxes. This is what the Hon. Minister of Nationalized Services did when he was the Mayor of Colombo to give some relief in respect of taxes. Now I do not know who derived the benefits of these reductions.

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

The donkeys!

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

That is why I say that the hon. Parliamentary Secretary is not taking into account the realities in the city of Colombo in introducing this Bill.

Of course, he might say he is not concerned with Colombo but he is thinking of the areas outside Colombo. I am urging now, along with my honourable Friend, the Minister of State, the case of the people in Colombo who are today

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

oppressed by the very heavy burden of local taxes, and say it is time that they be given some relief.

One form of relief would be a graded system of rates which is not provided for in this Bill at all. This is one way of doing it. The other is for him to ask his colleagues in the Colombo Municipal Council not to oppose my motion year after year that either the rates be reduced or the annual values which keep on mounting year after year be frozen. They brought in a report from the executive saying that it is illegal, whereas the law provides for it. I even proposed as a temporary measure to freeze the assessment or, if that is not possible, to lower the rates. Neither was done.

In respect of the backward areas of Kirillapone, Pamankade East, Kirula, Narahenpita and the undeveloped areas, when I asked for a differential rate which the law allows and suggested that the rates be reduced from 20 per cent. to 15 per cent., that was opposed. So, if the hon. Parliamentary Secretary is really anxious to give some relief to the people of Colombo, let him ask his colleagues in the Colombo Municipal Council to see that they do not oppose my motion and that they adopt this principle to give the necessary relief.

As for the rest of the Island, what does this Bill propose? The Hon. Minister's Bill is devised for the purpose of granting premise-wise variation in rates outside municipal areas. You could vary the rates according to the premises and not according to area. I say it might be a very good thing to do so. But there must be a principle of variation laid down in the Bill.

What is the principle of variation that is proposed? If you say that it can be varied according to the assessment rate, then the variation can be said to be according to some standard. Even if you vary it according to the income of the person residing therein you can say it is on some basis. But if the rates are to vary according to the services provided in the area, how are you going to measure the services provided?

Services are provided area-wise and not premise-wise. How are you going to levy rates, say, in respect of premises numbered " A " which might be a palatial mansion of a large estate owner living in a village area? Next to that building may be a shanty. As far as the area is concerned, the amenities provided will remain the same. But what about the amenities provided by the persons themselves? What happens then?

The rich man may have a septic tank which his neighbour does not have. The former might own a unit for the purpose of generating electricity, which the neighbour does not have. But these amenities are not provided by the local authorities but by the man himself out of his wealth. Then how are you going to vary the rates premises-wise? In such cases it might be necessary to gear it to the principle of the income of the person concerned or to the assessed value of the premises. As far as this Bill is concerned, there is no objective test.

I protest against that for this reason. It can open up a tremendous field of corruption of local authorities. He who has the ear of the chairman or of the valuation authority will get the necessary relief. Tht is why I say that from that point of view the second part of the Bill, which is intended to give relief, which can be utilized to give relief, can also open the road to a tremendous degree of corruption because there is no objective test to which this is linked.

The variation in rates proposed premiseswise is not linked to any objective test at all; it can be purely on the basis of subjective considerations of the taxing authority; and however keen the members in any local authority may be, where the taxing authority is concerned it will always go on the basis that kissing goes by favour. That is why I think that the second part of this Bill carries with it a vicious principle.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

In regard to the first part of the Bill, as far as Colombo is concerned, it is irrelevant. It is not going to provide any relief at all. As far as the other local authorities are concerned, to them the second part of the Bill which enables the Minister to vary the rates premises-wise can be extremely pernicious and dangerous.

I have to plead with the Hon. Minister not to bring this kind of piecemeal legislation here in regard to local government finances when in fact the entire question has to be reviewed and looked at from a new point of view. I know that he is thinking of changing the structure of the Local Government Service Commission and he is coming up against a lot of difficulties on that matter. I know that for political reasons the Minister has extended the life of the members of local authorities for one year. He has brought a number of measures here which do not have relevance to the actual question of local government reform in this country. The principal question is that of financial reform, and from that point of view the Bill before the House is the least important that could have been thought of. From one point of view it is irrelevant; from another point of view it is pernicious.

I ask the Minister to reconsider this question and if possible to withdraw this Bill, and then having reconsidered the question, to bring in a new Bill which would really enable local government finances to be placed upon a proper footing.

අ. භා. 3.49

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

ගරු කථානායකතුමනි, මාත් මේ පනත ගැන වචන කීපයක් කථා කරන්නට අදහස් කරනවා. මහානාම සමරවීර මහතා පළාත් පාලන ඇමතිවරයා වශයෙන් සිටියදී ගම්කාර්ය සභා සෑහෙන ගණනක් සුළු නගර සභා බවට පත් කිරීම නිසා සමහර ප්‍රදේශවල සිටින මිනිසුන්ට සෑහෙන කරදරයක් විඳින්නට සිදු වී තිබෙනවා. මේ කාරණය සම්බන්ධයෙන් මා නියෝජනය කරන ප්‍රදේශයෙන්ම උදාහරණයක් ඉදිරිපත් කරන්නට කැමතියි. යටියන්තොට ගම්කාර්ය සභාව හොඳින් වැඩ කරගෙන ගියා. ඒ ගම්කාර්ය සභාවේ දියුණුවට රුපියල් 30,000 ක් පමණ "සැනිටරි බෝඩ්" එක යටතේ තිබුණා. පසුව යටියන්තොට සඳහා සුළු නගර සභාවක් ඇති කළා. දැන් තිබෙන තත්ත්වය මේකයි. සුළු නගර සභාවට අයිති ප්‍රදේශයේ, පාර අද්දර ගම් කීපයක් තිබෙනවා; නමුත් සෑහෙන ප්‍රමාණයක් කඳු සහිතයි. ගම් කීපයක් ඇති කඳු සහිත ප්‍රදේශයක් සුළු නගර සභා ප්‍රදේශයක් හැටියට පරිවර්තනය කිරීමෙන් අමුතු සේවයක් සලසන්නට පුළුවන් වෙන්නේ නැහැ. වතුර දෙන්නට පුළුවන්කමක් නැහැ. පාරවල් දෙන්නට පුළුවන්කමක් නැහැ. විදුලි බලය දෙන්නට පුළුවන්කමක් නැහැ. ඒ ප්‍රදේශයේ සිටින වැඩි දෙනාගේ ගෙවල් ද ඒ තරම් හොඳ ඒවා නොවෙයි. ඉතින් ඒ ප්‍රදේශයේ සුළු නගර සභාවක් ඇති කිරීම නිසා එහි පදිංචිකරුවන්ට ලොකු කරදරවලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. ඒ වගේම ඒ සුළු නගර සභාවටත් හිරිහැරයක් ඇති වී තිබෙනවා. කී දෙනකු අයබදුවලින් නිදහස් කරන්නද? හැම දෙනාම අයබදුවලින් නිදහස් කරන්න බැහැ. නමුත් ගම්බද පළාත්වල සෑම කෙනකු වාගේම අයබදු වලින් නිදහස් කරන්න වෙලා තිබෙනවා.

දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) කීවාක් මෙන් මේ පනතෙන් අදහස් කරන්නේ සපයන සේවා අනුව ඒ ඒ ප්‍රදේශයේ වරිපණම් අඩු කිරීමට ඒ ඒ පළාත් පාලන ආයතනයට බලය දීමයි. නමුත් ගම්බද ප්‍රදේශවල කිසිත් සේවාවක් සපයන්නේ නැහැ. ඒ නිසා සේවා අනුව වරිපණම් අය කරන්න බැහැ. සේවා නොදී නිකම්ම වරිපණම් අඩු කරන්න ඕනෑ අපේ ප්‍රදේශවල සේවා දෙන්නට අමාරුයි. වතුර දෙන්නට බැහැ; ලයිට් දෙන්නට බැහැ; කසළ ශෝධක පහසුකම් දෙන්නටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

බැහැ. මේ පනතෙන් බලය දෙන්නේ ඒ ප්‍රදේශයේ අය කරන වරිපණම් ගාස්තුව සියයට 10 නම් එය සියයට තව ගණනකින් අඩු කරන්නටයි. කොහොමටත් සියයට 5 කට නැත්නම් 6 කට වඩා නම් අඩු කරන්නට බැහැ. ඉතින් මේ තත්ත්වය යටතේ සුළු නගර සභාවක් ගෙන යෑම අමාරුයි. අපට තිබෙන ප්‍රශ්නය ඕකයි. වටිනාකමේ තක්සේරුව අනුව වර්ග කොට බදු අය කිරීමේ ක්‍රමයක් ඇති කළහොත් මීට වඩා නරකද ? මා හිතන හැටියට දැනට ලංකාවේ තිබෙන වරිපණම් ක්‍රමය පමණයි දුප්පත් පොහොසත් භේදයක් නැතිව දෙගොල්ලන්ගෙන්ම එක ප්‍රමාණයට අය කරන ක්‍රමයකට තිබෙන්නෙ. මුදල වෙනස් වෙන්න පුළුවන් නමුත් අය කරන ප්‍රමාණය එකක් බවයි මා කියන්නෙ. මෙය අමුතු දෙයක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂය කොළඹ නගර සභාව පිළිබඳ මැතිවරණ කිහිපයකදීම බදු අඩු කිරීම තමන්ගේ වටිනා ප්‍රතිපත්තියක් ලෙස ඉදිරිපත් කර තිබෙනව. එය ක්‍රියාවේ යොදන්න බලාපොරොත්තු වන බව නොයෙක් වර ඒ උදවිය ප්‍රකාශ කර තිබෙනව. එසේ කියන්නෙ ඡන්ද කාලයේදීයි. බොහොම හයියෙන් කෑකෝ ගහලා එසේ කියන්නෙ වැදගත් සටන් පාඨයක් හැටියටයි. "ගෙවල් කුලිය අඩු කරන්න, යූ. එන්. පියට ඡන්දෙ දෙන්න" ආදි වශයෙන් සටන් පාඨ කිව්ව. එසේ කියන නමුත් ඡන්ද වැඩ කටයුතු අවසන් වුණාම එය ඉබේම අමතකවෙලා යනව. තවමත් ඒ අදහස ක්‍රියාවේ යොදු නැහැ. ඒ අදහස ක්‍රියාවේ යෙදෙව්වොත් සැහෙන සහනයක් ලැබෙනව. මෙයින් නම් ඒ තරම් සහනයක් නැහැ. අන්න එයයි මා කියන්නෙ.

දැනටත් එක්තරා විධියක සහනයක් තිබෙන නමුත් එය ඉතාමත් අසාධාරණ බවයි මට කියන්න තියෙන්නෙ. දිළිඳුකම උඩ යම් යම් බදු අස් කරන්න බලයක් සභාපතිවරයට තිබෙනව. යම් බද්දක් යම් පුද්ගලයෙකුගෙන් අය කිරීම අවලංගු කරන්න සභාපතිවරයට බලය තිබෙනව. ඒ සහනය ලබා ගැනීමට නම් ඒ සඳහා ඉල්ලුම් කරන්න ඕනැ. ඒ ඉල්ලීම උඩ යම් බද්දක් අස් කරන්න සභාපතිවරයාට බලය තිබෙනව. එය සුළු නගර සභාවලටත් වඩා එම සුළු නගරසභාවල සිටින සභාපතිවරුන්ට තිබෙන බලයකැයි මා හිතනව. එය ඊටත් වඩා නරකයි. මේ බලය තිබීමෙන් සභාපතිවරයට නොයෙක් විධියේ අපවාද අසන්න සිදු වෙනව. තමන් අයිති පක්ෂයේ ඉල්ලුම්කරුවන්ට බදු බර සැහැල්ලු කරනවය යනුවෙන් සභාපතිවරයට විරුද්ධව චෝදනාවක් එල්ල වෙන්න ඉඩ තියෙනව. අනෙක් පක්ෂයට අයිති දිළිඳු මිනිහට එම සහනය ලැබෙන්නෙ නැහැ කියන්න ඉඩක් එයින් ලැබෙනව. එවැනි අපවාදයකට සභාපතිවරයා ලක්වන තැනට ඉඩකඩ තැබීම අසාධාරණයි. මීට වඩා සාධාරණ විධියට එය සකස් කළොත් හොඳයි. එවිට එවැනි ප්‍රශ්න මතු වන්නේ නැහැ.

මේ වර්ග කිරීම උඩ ඇත්ත වශයෙන්ම බොහොම ස්වල්පයයි බදු අය කර ගන්න පුළුවන් වෙන්නෙ. ඒ නිසා මේ පනත මේ විධියට ක්‍රියාත්මක නොකර අස් කර ගන්නවා නම් හොඳය කියා මා හිතනව. මෙය ඉදිරිපත් කරන්න මේ තරම් හදිසියක් ඇතැයි මා කල්පනා කරන්නෙ නැහැ. ඒ නිසා මෙය අස් කර ගෙන අනෙක් විධියට සංශෝධන පනතක් ඉදිරිපත් කරන්න බැරි ඇයි ? එය ඉදිරිපත් කළොත් අප දෙගොල්ලන්ගේම ඡන්දය ඒ සඳහා ලැබෙනව ඇති. එතකොට ඒ පනත ඒකච්ඡන්දයෙන්ම සම්මත කරවා ගන්න පුළුවනි. කාගෙන්වත් විරුද්ධත්වයක් ඊට ඇති වන්නෙ නැහැ. එවැනි සංශෝධනයක් පිළිගන්න අප කාටත් පුළුවනි. කොළඹ නගර සභාවේ පාලන බලය එක්සත් ජාතික පක්ෂයට නොතිබුණ කාලයේදී නම් මෙවැන්නක් කරන්න බැරියයි කියන්න ඉඩ තිබුණා. මහා ආණ්ඩුවේ බලය තමන්ට නොතිබුණු කාලයේදී නම් එවැන්නක් කරන්න බැරියයි එක්සත් ජාතික පක්ෂයේ උදවියට කියන්න ඉඩ තිබුණා වෙන්න පුළුවනි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් තිබුණු නිසා හෝ සභාග ආණ්ඩුවක් තිබුණු නිසා හෝ තමන්ට කරන්න දෙයක් නැතැයි කියන්න උන්නැහේලාට ඉඩ තිබ්ණා වෙන්න පුළුවනි. එහෙත් දැන් එවැන්නක් කියන්න බැහැ. දැන් මහා ආණ්ඩුව තිබෙන්නෙත් කොළඹ නගර සභාවේ පාලනය තිබෙන්නෙත් එක පක්ෂයටමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම නිසා කරදරයක් නැතිව අවශ්‍ය දේ කරන්න උන්නැහේලාට පුළුවනි. ජනසතු සේවා ඇමතිතුමා සභා ගර්භයෙන් පිට වී යනව. එතුමා කලක් නගරාධිපති වශයෙන් සිටියා. දැන් එතුමා ඇමති මණ්ඩලයේ ඉන්නව. උන්නැහෙට දැන් පසු ගිය කාලය අමතකවෙලා තියෙනව. ඒ ගැන උන්නැහෙට දොස් කියන්න බැහැ. උන්නැහෙට දැන් හුඟක් දේවල් අමතක වෙලා තියෙනව.

ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටින්නෙ මෙය ඉල්ලා අස් කර ගන්නා ලෙසයි. පුළුවන් තරම් ඉක්මණින් අප සඳහන් කරන විධියට සාධාරණ වැඩ පිළිවෙලක් අඩංගු පනතක් ඉදිරිපත් කරන්න. මෙය බේරුමක් කර ගත්තොත් අපේ ගම්බද ප්‍රදේශවලට සහනයක් ප්‍රයෝජනයක් ලබා ගන්න ඉඩ තිබෙනව. මෙය අපේ සුළු නගර සභාවට පමණක් නොවෙයි ප්‍රයෝජනවත් වන්නෙ. යටියන්තොට, රුවන්වැල්ල ආදි සුළු නගර සභා රාශියක් නොයෙක් පළාත්වල දැනටමත් ඇති කර තිබෙනව. කිසිම අර්ථයක් නැති විධියට සුළු නගර සභා ඇති කර තිබෙනව. නිලධාරීන්ට පඩි ගෙව්වට පස්සෙ පළාතෙ දියුණුවට මොකවත් ඉතිරි නොවන කාර්යාල බොහොම තිබෙනව. එම නිසා නගර සභාවලට ආධාර කරන්නෙ කොහොමද, ඒවා දියුණු කරන්ට ගත යුතු ක්‍රියා මාර්ග මොනවද යනාදී කරුණු ගැන සෑහෙන අන්දමේ ශාස්ත්‍රානුකූල පරීක්ෂණයක් කළොත් හොඳය කියා මා විශ්වාස කරනව.

මා දීර්ඝ වශයෙන් කතා කරන්ට බලාපොරොත්තු වන්නෙ නැහැ. නගර සභාවලටවත් පළාත්වාසීන්ටවත් මෙම පනත ක්‍රියාවෙ යෙදීමෙන් කිසිම ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ. එම නිසා මෙම පනත ඉල්ලා අස් කර ගෙන අප ඉදිරිපත් කරන අදහස් අනුව වැඩ කටයුතු කරන හැටියට ඉල්ලමින් මගෙ වචන ස්වල්පය අවසාන කරනව.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended till 4.30 P.M. On resumption, the hon. Deputy Chairman of Committees will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 4.30ට කාරක සභා නියෝජ්‍ය සභාපති තැන්පත් ටී. ක්වින්ටන් ප්‍රනාන්දු මහතාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. குழுக்களின் உப அக்கிராசனர் [திரு. ரி. குவின்ரன் பெர்ணாண்டோ] தலைமை தாங்கினார்.

*Sitting accordingly suspended till 4.30 P.M., and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. T. QUENTIN FERNANDO], *in the Chair.*

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මෙයින් බලාපොරොත්තු වන්නෙ මේ රටේ ඇති මහ නගර සභා සහ සුළු නගර සභා තුළ ඇති එක් එක් කොට්ඨාශයට විවිධ බදු ඇති කිරීමෙ වැඩ පිළිවෙළක් නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමට බව අපට පේනව. මහ නගර සභා සහ සුළු නගර සභා මෙම පනතට සීමා කර තිබෙනව. නමුත් ඒ අතර තුර තිබෙන සාමාන්‍ය නගර සභා සහ ගම් සභා එහෙම මෙම පනතට ඇතුළත් වෙලා නැහැ. සමහර විට ඊට හේතු තිබෙන්ට පුළුවනි. නගර සභා ආඥ පනතෙ සමහර වගන්ති ඒවට බලපාන්නෙ නැති වන අන්දමට සකස් වී තිබෙන බැවින් ඒව මෙම පනතට ඇතුළත් කර නොමැති බව සිතන්ට පුළුවනි. නමුත් අද ගම්සභාවල පාලන කටයුතු දෙස බලනවිට අපට පේනව ගම් සභාවල එක් එක් කොට්ඨාශයට විවිධ බදු අය කෙරෙන බව. ගම් සභාවල තිබෙනව දියුණු කළ ප්‍රදේශ —built up areas—යනුවෙන් කොටසක්. ඒ ප්‍රදේශවල සිටින ජනතාව ඉඩකඩම් සඳහා එහෙම විශේෂ වරිපනම් බද්දක් ගෙවන්ට ඕනෑ. වෙන වෙනත් කොට්ඨාශවලට වෙන වෙනත් සේවා නිසා වෙන වෙනත් බදු ක්‍රම යෙදීම නිසා අපේ ගම් සභාවලට මුහුණ පාන්ට සිදු වී ඇති කරදර ගිරිහැර නගර සභාවලටත් විඳින්ට සිදු විය හැකි බව පේනව. මීට පෙර ගම්සභාවලට බදු අය කර ගැනීම සඳහා සකස් වී තිබුණ වැඩ පිළිවෙළට වඩා වෙනස් ස්වරූපයක් අද තිබෙනව. පාරවල් නඩත්තුව සඳහා, කසල සෝදීමේ කටයුතු සඳහා, එහෙම නොයෙකුත් අන්දමේ වියදම් කරන්ට අද ගම්සභාවලට සිදු වී තිබෙනව. ලංකාවෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

ඈත ප්‍රදේශවල පිහිටි ගම්සභාත් කොළඹ අවට ගම්සභාත් දෙස බලන විට අපට කිසි සේත්ම සන්තෝෂ වෙන්ට ඉඩක් නැහැ. ඒව ගැන කල්පනා කරන විට අප තුළ ලොකු ප්‍රශ්නයක් උද්ගත වෙනව, ඇත්ත වශයෙන්ම මේ රටේ පළාත් පාලන සේවාව කරගෙන යන්නෙ රටට සේවයක් සැලසීමේ අදහසින්ද නැද්ද යන කාරණය උඩ. අද පළාත් පාලන ආයතනවල ආදායම ක්‍රමානුකූලව අඩු වෙගන යනව. විශෙෂයෙන් ගම්සභාවල එම තත්ත්වය පවතිනව. කොළඹ අවට, ඒ කියන්නෙ බස්නාහිර පළාතෙ ඇති ගම් සභාවල ආදායම හා වියදම දෙස බලන විට අපට එය හොඳින් වැටහී යනව.

1963-64 පාලන වාර්තාවට අනුව ආඩි අම්බලම ගම් සභාවට ආදායම වශයෙන් ලැබී තිබුණෙ රුපියල් 1,60,000යි. ඕතර පළාතෙ ගම්සභාවෙ ආදායම රුපියල් 2,00,000යි. මීගමුව පැත්තෙ පිහිටි තලාහේන ගම්සභාවේ ආදායම රුපියල් 16,000 යි. ගොඩගම පළාතෙ ආදායම රුපියල් 98,000යි. එයට අයිති වෙනව, දිවුලපිටිය ආසනයෙන් බාගයකටත් වඩා. මිනුවන්ගොඩට කොළඹ සිට සැතපුම් 20ක් වත් නැහැ. එහෙ ආදායම රුපියල් 30,000 යි. උඩුගම්පොල-මාබෝදල ගම්සභාවේ ආදායම රුපියල් 86,000 යි. මීරිගම ඡන්දදායක කොට්ඨාශයෙන් බාගයක් අයිති උඩුගහ ගම්සභාවේ ආදායම රුපියල් 76,000 යි. යටිගහ ගම්සභාවේ ආදායම රුපියල් 64,000 යි. ගම්පහ රුපියල් 43,000 යි. මහර රුපියල් 1,40,000 යි. නාරම්මල රුපියල් 69,000 යි. ඔය විධියට ඉතාමත්ම අඩු ආදායම් ලබන පළාත් පාලන ආයතන තිබෙනව. ඒවායේ ආදායම් මාර්ග ක්‍රමානුකූල නැහැ. එයට හේතු ගණනාවක් තිබෙනව. ඉස්සර නම් කරත්ත බයිසිකල් ආදියෙන් ආදායමක් ලබා ගත්ත. එහෙත් දැන් කරත්ත පාවිච්චිය සම්පූර්ණයෙන්ම පාහේ නැති වී ගොස් තිබෙනව. කරත්ත වෙනුවට දැන් පාවිච්චි කරනු ලබන්නේ ට්‍රැක්ටර්. ගම්සභාවලට කිසිම ආදායමක් ට්‍රැක්ටර්වලින් ලැබෙන්නෙ නැහැ. ගම්සභා පාරවල මෝටර් රථ ගමන් කරන නමුත් ඒ පාරවල් නඩත්තු කිරීමටවත් ආදායමක් මෝටර් රථවලින් ගම්සභාවලට ලැබෙන්නෙ නැහැ. මෝටර් රථවලින් ලැබෙන බදු මුදලින් එක්තරා කොටසක් ඒ ඒ ගම්සභාවලටත් දිය යුතුය කියන අදහසක් පසුගිය ආණ්ඩුව දැරුව.

දැන් සිදු වන්නේ ක්‍රමානුකූලව ආදායම පහත වැටීම පමණක් නො වෙයි, ඒ ඒ ගම්සභාවල එදිනෙදා කටයුතු කරගෙන යෑමේ වියදමත් වැඩි වීමයි. ආදායම් ඕවර්සියර්වරුන් වුවමනා කරනව; වැඩ ඕවර්සියර්වරුන් වුවමනා කරනව; තවත් නොයෙකුත් නිලධාරීන් වුවමනා කරනව. කාර්ය මණ්ඩලය දෙස බලන විට ගම්සභාවල ආදායම කෙලින්ම ඒ සඳහා වැය වන අතර මූලික පරමාර්ථයන් වශයෙන් තිබෙන සේවාවන් සලස්වන්නට පුළුවන්කමක් නැති බව පෙනී යනව. ඒ නිසා මහ ආණ්ඩුවෙන් ලබා ගන්නා යම් මුදලකින් යම්කිසි සේවයක් කරනවා මිස ඊට වඩා සේවයක් සැලසීමට මේ රටේ තිබෙන කිසිම ගම්සභාවකට අවසථාවක් ලැබෙන්නේ නැහැ. යම් සේවයක් කරන්නට බලාපොරොත්තු වුණොත් ඒ සඳහා තවත් ණයවීමට සිදු වෙනව. කාර්යාල ගොඩනැගිල්ල හදගන්නත් ණය වෙනව; විදුලි එළිය දෙන්නත් ණය වෙනව; ජල පහසුව දෙන්නත් ණය වෙනව; පාරවල තාර දමන්නත් ණය වෙනව. හැම දෙයක්ම කරන්නට සිදු වී තිබෙන්නේ ණය වෙලයි. දැනට ගම්සභා ණය වී තිබෙන ප්‍රමාණය අනුව බලන විට තව අවුරුදු 10ක් ගිය තැන මේ වගේ දෙගුණයක් ණය වීමට ගම්සභාවලට සිදු වෙනව. ඒ නිසා පළාත් පාලන ආයතන එන්න එන්නම ණය බරින් මිරිකා තබන්නේ නැතිව මොකක් හෝ සැලැස්මක් ඇති කර ආදායම් මාර්ග වැඩි කර ගැනීමේ ක්‍රමයක් ඇති කළ යුතුයි කියන එක අපි මූලික වශයෙන් කල්පනා කළ යුතුයි. මෙවැනි පනතක් මගින් ආදායම් මාර්ග වැඩි කර ගන්නට පුළුවන්ය කියා ගරු ඇමතිතුමා කල්පනා කරනවා නම් එය නිවැරදි කල්පනාවක් නොවෙයි.

යම්කිසි මාර්ගයකින් යම් සේවයක් කිරීමට අපට පුළුවන් වුණොත් ඒ මගින් සැහෙන සහණයක් ලබාගන්නට ඒවායේ ජීවත් වන අයට පුළුවන් වෙනව. නගර සභාවල දැනට තිබෙන තක්සේරු කිරීමේ වැඩ පිළිවෙළ අනුව එක වැඩකට තක්සේරු දෙකක් කෙරෙනව. උදාහරණයක් වශයෙන් අපේ ප්‍රදේශවල තිබෙන කොහු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෝල් පෙන්වන්නම්. කොහු මෝල්වලට වෙනමත් මට්ටවලට වෙනමත් බදු අය කරනව. අනන්ත අප්‍රමාණව එසේ සිදුවී තිබෙනව. කොහු මෝලත් මට්ට වළත් එකිනෙකට සම්බන්ධ කොටස් දෙකක්. මට්ට වළක් නැතිව කොහු මෝලක් වැඩ කරවන්න බෑ; කොහු මෝලක් නැතිව මට්ට වළකින් නියම විධියට ප්‍රයෝජන ගන්න බෑ. නමුත් පළාත් පාලන ආයතනවලින් මේ කොටස් දෙකට බදු අය කරන්නෙ වෙන් වෙන් වශයෙනුයි. මේ අන්දමට යම් යම් ප්‍රදේශවල පළාත් පාලන ආයතන මඟින් බදු අය කිරීමේ පරස්පර විරෝධතාවක් තියෙනව.

මේ සංශෝධන පනතෙනුත් එක් එක් ප්‍රදේශවලට නොයෙකුත් විධියෙ වරිපණම් බදු පනවන්නට බලාපොරොත්තු වෙනව. පළාත් පාලන ආයතන මඟින් සපයනු ලබන සේවාවන් අනුව බදු පැනවීමේදී එම සේවාවන් පෞද්ගලික වශයෙන් සපයා ගන්නා අය එම බදුවලින් ඇත්ත වශයෙන්ම නිදහස් විය යුතු තත්ත්වයක් තියෙනව. යම් නගර සභා කොට්ඨාශයක, පෞද්ගලික වශයෙන් යන්ත්‍රයක් මඟින් විදුලි ආලෝකය ලබා ගන්නා යම් නිවසක් තිබෙනව නම්, එසේම, ඩ්‍රෙනේජ් ක්‍රමය පෞද්ගලික වශයෙන් යොදා ගත් නිවසක් තියෙනව නම්, ඒ අය එම බදුවලින් නිදහස් කිරීමට ඇමතිවරයට බලය තියෙනව. පළාත් පාලන ආයතනයකින් කිසිම සේවාවක් නොලබා පැල්පත්වල ජීවත්වන අය ගෙනුත්, සේවාවන් ලබන අයගෙනුත් එකම විධියට බදු අය කෙරෙන පිළිවෙළකට ඉඩ තැබීම සුදුසු නැහැ. එම නිසා, යම් යම් බදු අය කිරීමේදී එක් එක් පුද්ගලයින්ගෙ ආදායම් තත්ත්වය උඩ ඒව අය කිරීමට පිළිවෙළක් යොදතොත් එය දැන් තිබෙන ක්‍රමයට වඩා හොඳ බව අප සිතට ගත යුතුයි. වැඩි ආදායම් ලබන අයගෙන් වැඩි බද්දකුත් අඩු ආදායම් ලබන්නන්ගෙන් අඩු බද්දකුත් අය කිරීම මේ සංශෝධන වැඩ පිළිවෙළට වඩා හොඳ බවයි මගෙ විශ්වාසය.

එම නිසා, මේ සම්බන්ධව මීට වඩා පළල් වශයෙන් කල්පනා කොට, ඒ ඒ පළාත් පාලන ආයතනවලට සාධාරණ ලෙස බලපාන විධියටත්, ක්‍රියාත්මක කරන්නට පුළුවන් අන්දමටත්, ඒවායෙ නඩත්තුව ගෙනයා හැකි හැටියටත් බදු සංශෝධන ඇති කිරීම මීට වඩා වටිනා බව මම අවසාන වශයෙන් මතක් කරන්න කැමතියි.

අ. භා. 4.46

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පනත අදාළ වන්නෙ මහ නගර සභාවලටත් සුළු නගර සභාවලටත් පමණයි. ගම්සභා ගැන මෙහි කිසිවක් සඳහන් වී නැහැ. පසුගිය කාල සීමාව තුළදී, ගම්සභා ප්‍රදේශ ගණනාවකම—ඒ ඒ ගම්සභා ප්‍රදේශයට අයත් සීමාවන් තුළම—සුළු නගර සභා පැනනැංගා. මේ සුළු නගර සභා ඇතිකිරීම සිදුවී තිබෙන්නෙ ඉතාමත් පුදුම ආකාරයකටයි. හිටිහැටියෙම මේ ගරු සභාවට පනතක් ගෙනත් එකපාරටම ගම්සභාවක් සුළු නගර සභාවක් බවට පත් කරනව. කුලියපිටියෙ සුළු නගර සභාව එවැනි එකක්. මුළු ඡන්ද සංඛ්‍යාව 600 කට වැඩිය නැහැ. එක කොටසකට ඡන්ද 25 ක් 30 ක් පමණ ඇති. රුවන්වැල්ල, යටියන්තොට, සුළු නගර සභාත් ඒ විධියයි. යටියන්තොට සුළු නගර සභා කොට්ඨාශයෙ තිබෙන්නෙ ඡන්ද 700 යි. තමන් මේව දිනාගත්තයි කියල එක්සත් ජාතික පක්ෂය කෑ ගහනව. මේ සුළු නගර සභාවල තත්ත්වය ඔය විධියයි. එහෙත්, ඡන්ද දාහට වැඩිය තිබෙන ගම්සභා අපේ ප්‍රදේශවල තිබෙනව. හිටිහැටියෙ සුළු නගර සභා පැන නැඟී තිබෙන්නෙ ඔය විධියටයි. මේ විධියේ සුළු නගර සභා අද ඇති කර තිබෙනව. ඒවා බෙදා තිබෙන්නෙ පුදුමාකාර විධියටයි. ගම්සභාවලින් සුළු නගර සභාවලට කඩා ගත්, මේ පනතෙන් තමුන්නාන්සේ වරිපණම් බදු අය කරගන්ට යන, සමහර ගෙවල් පිහිටා තිබෙන්නෙ මේ විධියටයි: ගෙයක් ඇතුළෙ මිනිහෙක් නිදා ගත්තම ඔහුගේ ඔළුව තිබෙන්නෙ ගම්සභා ප්‍රදේශයෙ; කකුල් දෙක තිබෙන්නෙ සුළු නගර සභා ප්‍රදේශයේ. සමහර සුළු නගර සභා සීමා වෙන් කර තිබෙන්නෙ ඒ විධියටයි. කඩිනමින් සුළු නගර සභා බෙදල වෙන් කිරීම සඳහා පනතක් ගෙනෙන්ට හිටපු පළාත් පාලන ඇමති මහානාම සමරවීර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

මහත්මයා ක්‍රියා කළේ මොන කාරණයක් නිසාදැයි මා දන්නෙ නැහැ. එහෙත්, මේ වරද හරිගස්සන්ට සිදු වී තිබෙනව.

පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා අපෙන් අහනව, සුළු නගර සභා ප්‍රදේශයක් ගම්කාර්ය සභා ප්‍රදේශයක් බවට පරිවර්තනය කරන්නෙ කොහොමද කියා. අද තිබෙන ව්‍යවස්ථා අනුව ඒක කරන්ට බැරිකමක් තිබෙනව. ඒක බරපතල ප්‍රශ්නයක්. සුළු නගර සභාවක් නැවත ගම්කාර්ය සභාවකට පරිවර්තනය විය යුතුව තිබෙනව නම් ඒක විය යුතුයි. ගම්සභාවක් සුළු නගර සභාවක් විය යුතුව තිබෙනව ඒකත් විය යුතුයි. අපි දෙපක්ෂයේම මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත් කරගෙන මේ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කර යම්කිසි තීරණයකට බැහැ ගන්න ඕනෑ. අද තිබෙන නීතියෙන් කරන්ට බැරි දේ කරන්ට පුළුවන් වන අන්දමට අප සැම දෙනාම එකතු වී වැඩ පිළිවෙළක් සකස් කර ගන්ට ඕනෑ. එසේ නැත්නම් මේ විධියේ වරිපණම් බදු පනත් සම්මත කර ක්‍රියාවේ යෙදවීමෙන් සිදු වෙන්නෙ සාමාන්‍ය මහජනයාට හිරිහැරයක්.

දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) කිව්ව වගේ පැරණි ක්‍රමය අනුව බදු අය කිරීම නවත්වන්න ඕනෑ. තවමත් බදු අය කරන්නෙ, තිරික්කලෙන්, බයිසිකලයෙන්, තේ කඩයෙන්, බේකරියෙන්. බදු අය කරන මාගී ඔවයි. ලෝකයේ වෙනත් රටවල ක්‍රියාවේ යොදන දියුණු අළුත් බදු ක්‍රමයක් මේ රටේ නගර සභා සුළු නගර සභා ආදියේ ක්‍රියාවේ යෙදවීමට තවම වැඩ පිළිවෙළක් සකස් කර නැහැ. එක වරක් බදු ක්‍රම ගැන සොයා බලන්න චොක්සි කොමිසම පත් කළා. චොක්සි වාර්තාව ඉදිරිපත් වුණා. එහෙත් අද වන තුරුත් චොක්සි වාර්තාවේ නිර්දේශ අනුව බදු අය කිරීමේ ක්‍රමයක් සකස් කර නැහැ.

අද අපට නගර සභාවක් තුළ තිබෙන ගුවන් විදුලි යන්ත්‍රයකට බලපත්‍රයක් නිකුත් කරල බද්දක් ලබා ගන්ට පුළුවන් කමක් නැහැ. ඒකත් අයිති මහ ආණ්ඩුවට. නගර සභා, සුළු නගර සභා ප්‍රදේශයක් තුළ තිබෙන වාහනයකින් බද්දක් අය කර ගන්ට පුළුවන්කමක් තිබෙනවද? ඒකත් මහා ආණ්ඩුවට. නගර සභා, සුළු නගර සභා තුළ පදිංචිව සිටින නීතිඥවරුන්ගෙන් හා අධිනීතිඥවරුන්ගෙන් බද්දක් අය කරන්ට පළාත් පාලන ආයතනවලට බලය දෙන්න. යම්කිසි අළුත් බදු ක්‍රමයක් සකස් කර, මේ වරිපණම් ක්‍රමයෙන්ම නගරසභා සුළු නගර සභා ආදිය පවත්වාගෙන යාමේ තත්ත්වය වෙනස් කළ යුතුව තිබෙනව.

අද මේ ඉදිරිපත් කර තිබෙන පනතෙ හැටියට සභාපතිවරුන් අමාරුවෙ වැටෙනව. නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේ සුළු නගර සභාවක සභාපතිකෙනෙකු යයි හිතමු. මේ පනතෙ හැටියට තමුන්නාන්සේට පුළුවනි, තමුන්නාන්සෙට හිතවත් උදවියට අයිති ගෙවල්වලින් අඩුවෙන් බදු අය කරන අතර තමුන්නාන්සෙගෙ පක්ෂයට හෝ තමුන්නාන්සෙට විරුද්ධ උදවියට අයිති ගෙවල්වලින් වැඩිපුර බදු අය කරන්න. ඒ නිසයි මා කියන්නෙ මෙතැන දූෂණයට තුඩු දෙන වැඩ පිළිවෙලක් තිබෙනවා කියා. තමන්ට ද්‍රෝහීකම් කරන උදවියගෙන් වැඩියෙන් බදු අය කර ගන්ට මේ පනත අනුව සභාපතිවරුන්ට පුළුවන්කම ලැබෙනව. කාගෙන් නහනමක්ද? ප්‍රජාතන්ත්‍රවාදීව සුළු නගර සභාවකට හෝ නගර සභාවකට වැඩි ඡන්දයෙන් තේරී පත්වන සභාපතිවරයකු මේ අන්දමේ පහත් ක්‍රමයකට පරිවර්තනය වීමට ඉඩ තබන්න හොඳ නැහැ. ඒ නිසා පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා ඉල්ලා සිටිනව, මේ සභාවේ දෙපාර්ශ්වයේම මන්ත්‍රීවරුන්ගෙන් සැදුණු කමිටුවක් මගින් මේ ප්‍රශ්න නැවත වරක් සාකච්ඡා කර අද රටේ පැන නැගී තිබෙන ප්‍රශ්න විසඳීමට පුළුවන් ක්‍රියාමාර්ගයක් සකස් කරන්න කියා. අහෝසි කළ යුතු සුළු නගර සභා මොනවාදැයි සොයා බලා, ඒවායේ පාලනය අහෝසි කිරීමටත්, සුළු නගර සභා තත්ත්වයට උසස් කළ යුතු ගම්සභා මොනවාදැයි සොයා බලා ඒවා ඒ තත්ත්වයට උසස් කිරීමටත් යම්කිසි ස්ථිර වැඩ පිළිවෙලක් යොදනවා නම් ඒ සුළු නගර සභා හා නගර සභා තුළ ජීවත්වන ජනතාවට මීට වඩා යහපතක් සිදු වෙනව. මීට ප්‍රථමයෙන් සුළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නගර සභාවලටම, ගම්කාර්ය සභාවලට, විදුලි බලය දී ආදායමක් ලබා ගැනීමේ අයිතිය තිබුණා. දැන් ඒකත් නැහැ. විදුලි බල අමාත්‍යාංශය මගින් දැන් සෑම ස්ථානයක වම විදුලිය සැපයීමේ වැඩ පිළිවෙලක් යොදා තිබෙනව. එම නිසා දැන් විදුලිය සැපයීමෙන් ලැබුණු ආදායමත් නැති වී තිබෙනව. ඇත්ත වශයෙන්ම මේක ඉතා මත්ම ගැටලු ප්‍රශ්නයක්. මහ නගර සභා වලට, සුළු නගර සභාවලට ගම් කාර්ය සභා වලට ආදායම් ලබා ගත යුත්තේ කුමන විධියේ මාර්ගවලින්ද, එම ආදායම් මාගී සකස් විය යුත්තේ කුමන ආකාරයකට ද, යන කරුණු ගැන සාකච්ඡා කර තීරණ යකට එළඹිය යුතුයි. මහජනතාවට හිරි හැරයක් කරදරයක් නොමැතිව ජීවත් වීමට වැඩ පිළිවෙලක් සකස් කළ යුතු නම් මේ පනත් කෙටුම්පත ඉවත් කරගෙන සාකච්ඡාවක් පවත්වා අළුත් වැඩ පිළි වෙලක් සකස් කර ගන්නට ඕනෑ.

දැන් සමහර විට පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් තුමා කිය න්ට පුළුවන්, මීට පෙර තිබුණු ආණ්ඩු වක ඇමතිවරයකු මේ අන්දමට නගර සභා හෝ සුළු නගර සභා කොට්ඨාශ වෙන් කර තිබෙන නිසා, ඒ බර දැන් අප කර පිට වැටී තිබෙන නිසා මේ විධියෙ පනත් කෙටුම්පතක් සම්මත කර නොගෙන ඒ නගර සභා සහ සුළු නගර සභා පවත්වා ගෙන යන්ට නොහැකිය කියා. ඒ තත්ත් වය මා පිළිගන්නව. ඇත්ත වශයෙන්ම සුළු නගර සභාවක් හෝ මහ නගර සභා වක් ගෙන යන්නට යම් ආදායමක් තියෙ න්ට ඕනෑ. නමුත් ඒ ආදායම ලබා ගන්න ක්‍රමවලින් සාමාන්‍ය මහජනතාවට හිරිහැර යක් කරදරයක් නොවිය යුතුයි. දැන් පවතින තත්ත්වයේ හැටියට සමහර සුළු නගර සභාවලට මොන විධියකටවත් ආදා යමක් ලබා ගන්ට පුළුවන්කමක් නැහැ. සෑම දෙයකටම මහා ආණ්ඩුවෙන් ආධාර ඉල්ලන්නටයි සිදු වී තිබෙන්නෙ. සෑම දෙයක්ම ණයට කරන්නටයි සිද්ධ වී තිබෙන්නෙ. එම නිසා මේක වැදගත් ප්‍රශ්නයක්. මහ නගර සභා ප්‍රදේශයක් හෝ සුළු නගර සභා ප්‍රදේශයක් ගම්කාර්ය සභා ප්‍රදේශයකට පරිවර්තනය කරන්ට පුළුවන්කමක් නැති බව අප දන්නව. නමුත් මේ තත්ත්වය වෙනස් කරන්ට අප සුදුසු පියවරවල් ගන්නට ඕනෑ. ඒ අනුව වැඩ පිළිවෙලක් සකස් කරන මෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 4.56

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභාව ඉදිරිපිට තිබෙන මෙම පනත් කෙටුම්පත සම්බන්ධව වචන දෙක තුනක් පමණයි මා කථා කිරීමට බලාපොරොත්තු වෙන් නෙ. මට පෙනෙන හැටියට, ප්‍රධාන වශ යෙන්ම මේ පනත් කෙටුම්පතෙන් අද හස් කරන්නේ නගර සභාවක හෝ සුළු නගර සභාවක සීමාව තුළ තිබෙන විවිධ ප්‍රදේශවලින් අය කරන බදු ප්‍රමාණය වෙනස් කිරීමට බලයක් දීමටයි. විවිධ ප්‍රදේශ යනුවෙන් වැඩි වශයෙන්ම මෙහි අදහස් කරන්නෙ, මහ නගර සභාවක හෝ සුළු නගර සභාවක පැරණි සීමාවක් තුළ තිබෙන ප්‍රදේශවලට වඩා, අළුතෙන් යම් ප්‍රදේශ ඒ පැරණි ප්‍රදේශයට යා කර ගත්තාද, අන්න ඒ අළුත් ප්‍රදේශයි. ඒ අළුත් ප්‍රදේශවලින් යම් කාලයක් ගත වන තුරු අඩු බදු ප්‍රමාණයක් අය කිරීම ටයි අදහස් කරන්නෙ.

ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නය පැන නැගෙන්නෙ අළුත් ප්‍රදේශයක් තිබෙන ප්‍රදේශයකට යා කළාමයි. විශාල වශයෙන් සුළු නගර සභා ප්‍රදේශවලට සහ මහ නගර සභා ප්‍රදේශවලට අළුත් ප්‍රදේශ ඇතුළු කිරීමත්, මට ප්‍රථමයෙන් කථා කළ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙකුම කියා සිටියා වාගේ, ගම් කාර්ය සභා ප්‍රදේශ අරගෙන සුළු නගර සභා ප්‍රදේශවලට යා කිරීමත් වැනි ක්‍රියාවල් කිරීමට විශේෂ යෙන්ම ඕනෑකමක් තිබෙන්නෙ පළාත් පාලන දෙපාර්තමේන්තුවටයි. අතීතයේදී යම් ඇමතිවරයකු යටතේ දේශපාලන හෝ පෞද්ගලික බලපෑම් කරණකොට ගෙන නුසුදුසු අන්දමකට සමහර ගම් කාර්ය සභා ප්‍රදේශ, විශේෂයෙන්ම කඩ මණ්ඩි අවට ප්‍රදේශ, අරගෙන සුළු නගර සභා ඇති කළාය යන්න මා පිළිගන්නට සූදානම්. නමුත් ඒ කටයුත්ත ඒ තරම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

පහසුවෙන් කරන්ට ඉඩ ලැබී ඇත්තේ පළාත් පාලන දෙපාර්තමේන්තුව ඒ විධියෙ දේවල් අනුමත කළ නිසාය කියා මට කියන්නට සිද්ධ වී තිබෙනවා. මේ මගේ සාමාන්‍ය හැඟීමයි මා කියන්නෙ.

පළාත් පාලන දෙපාතීමේන්තුව පළාත් පාලන ක්‍රමය දියුණු කිරීම පිළිබඳව යම් කිසි ප්‍රමාණයක වැරදි අදහසක් ඇති කර ගෙන තිබෙන බවයි, මට නම් පෙනෙන්නෙ. පළාත් පාලන ක්‍රමය දියුණු කිරීම යනුවෙන් ඔවුන් නිතරම අදහස් කරන්නෙ මොකක් ද? ගම් කාර්‍ය්‍ය සභාවක් සුළු නගර සභා තත්ත්වයට උසස් කිරීම, සුළු නගර සභාවක් පළාත් ආණ්ඩු සභා තත්ත්වයට උසස් කිරීම, පළාත් ආණ්ඩු සභාවක් මහ නගර සභා තත්ත්වයට උසස් කිරීම තමයි, ඔවුන් පළාත් පාලන ක්‍රමයේ දියුණුව හැටියට සලකන්නෙ. ඒ නිසා බොහෝ විට ඉහළින් බලපෑම් කර ඒ ප්‍රදේශවල නගරාධිපතිවරුන් වන්නට කැමති උදවිය තෝරා ගෙන ඔවුන් ලවා පෙත්සම් අත්සන් කරවා ගෙන මේ වැඩ පිළිවෙළ ගෙන යන්ට උත්සාහ කරනවා. මේක තමයි පළාත් පාලන ක්‍රමයෙ දියුණුව හැටියට ඔවුන් සලකන්නෙ.

මේ මාර්ගයෙන් පළාත් පාලන ක්‍රමය දියුණු වේය කියා මම නම් හිතන්නෙ නැහැ. මේ විධියට පළාත් පාලන ආයතන උසස් කරන්ට පුළුවන්කම ලැබෙන්නෙ ඒ ප්‍රදේශයෙ ආර්ථික දියුණුවක් ඇති වීම කරණකොටගෙන පමණයි. ඒ පදනමෙහි නොපිහිටා මේ විධියට පළාත් පාලන ආයතන උසස් කිරීමෙන් එම ප්‍රදේශයේ කිසිම දියුණුවක් ඇති වන්නෙ නැහැ. එයින් සිදු වන්නෙ, මහජනයා පිට වැඩියෙන් බදු බර පැටවීම පමණයි.

ඇත්ත වශයෙන්ම අද කළ කථාවලින් ගරු මන්ත්‍රීවරු කීප දෙනෙක්ම පෙන්නුම් කර දුන්න, පළාත් පාලන ආයතන මුහුණ පා ඇති ප්‍රධානතම ප්‍රශ්නය ආදායම් වැඩි කර ගැනීමේ ප්‍රශ්නය බව. එසේ පළාත් පාලන ආයතනවල ආදායම් වැඩි කර ගත හැකි මාර්ග කීපයකුත් සමහර ගරු මන්ත්‍රීවරුන් විසින් යෝජනා කරන්ට යෙදුණ. විශේෂයෙන් එම ආදායම් මාර්ග සඳහා මූලික සංශෝධන කීපයක් කළ යුතුය කියාත් සඳහන් කෙරුණ. ඒ සියල්ලක්ම සත්‍යයක් වන අතර මා ඉදිරිපත් කරන්නෙ, ඊට වඩා බොහොම සුළු කාරණයක් බව මතක් කරන්ට කැමතියි.

තිබෙන ආදායම් මාර්ග උඩම වුවත් එම පළාත් පාලන ආයතනවලට තම වැඩ කටයුතු හරියාකාරව කර ගෙන යාමට අද පළාත් පාලන දෙපාර්තමේන්තුව ඉඩ දෙන්නෙ නැහැ. මම හරියටම දන්නෙ නැහැ, එය පළාත් පාලන දෙපාර්තමේන්තුවෙ වරදක් ද එහෙම නැත්නම් ගරු පළාත් පාලන ඇමතිතුමාගෙ වරදක් ද කියා. නමුත් නාන්සෙ දන්නවා ඇති, ඒ වාගේම පළාත් පාලන ඇමතිවරයාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමාත් පිළිගන්නව ඇති, හොඳට වැඩ කටයුතු කර ගෙන යන පළාත් පාලන ආයතන කීපයක්ම අපේ රටේ තිබෙන බව. ඒවායේ වැඩ කටයුතු හරියාකාරව කිරීමට නම් එම ආයතනවල දෛනික වැඩ කටයුතු කිරීම සඳහා අවශ්‍ය නිලධාරීන් එම ආයතනවලට ලබා දිය යුතුයි. නමුත් අවශ්‍ය නිලධාරීන් ලබා ගැනීම සඳහා ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගෙන් හෝ ප්‍රධාන කොමසාරිස්ගෙන් හෝ ඉල්ලීමක් කළාම ඊට අනුමැතිය ලබා ගැනීම බොහොම අමාරුයි.

මම එක නිදර්ශනයක් ඉදිරිපත් කරන් නම්, මගේ ප්‍රදේශයේ තිබෙන කෙසෙල් වත්ත සුළු නගර සභාව බොහොම හොඳට වැඩ කටයුතු කර ගෙන යන පළාත් පාලන ආයතනයක්. කලින් එම ආයතනය විසින් ලොකු ණයක් ගෙවිය යුතුව තිබුණ. දැන් එම ණයෙනුත් නිදහස් වී බොහොම හොඳින් වැඩ කටයුතු කරගෙන යන බව පළාත් පාලන දෙපාර්තමේන්තුවත් පිළිගන්නව. එම කෙසෙල්වත්ත සුළු නගර සභාව 2 වන ශ්‍රේණියේ ලිපිකරුවන් 3 දෙනෙක් ඉල්ලා දැන් අවුරුද්දකුත් පහුවුණා. එම නිලධාරීන් ඉල්ලුවෙ එම ආයතනයෙ වැඩ කටයුතු ඉතා අධික නිසයි. දැනට සිටින නිලධාරීන් කොහෙත්ම ප්‍රමාණවත් නැහැ. ඒ නිසයි, 2 වන ශ්‍රේණියේ ලිපිකරුවන් 3 දෙනෙක් වුවමනා බව දැන්නුවෙ. ඉල්ලුවාට ලැබුණෙ නැහැ. වුවමනා කරන නිලධාරීන් දෙන්නෙ නැත්තෙ මොන හේතුවක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසාද කියා මට නම් තේරෙන්නෙ නැහැ. පළාත් පාලන ආයතන දියුණු කරන්ට බලාපොරොත්තු වෙනව නම් ඇයි, අවශ්‍ය නිලධාරීන් සපයන්නෙ නැත්තෙ? ඉල්ලා තිබෙන ලිපිකරුවන්ගෙ මූලික පඩිය කෙසෙල්වත්ත සුළු නගර සභාවෙන් ගෙවනව. හැබැයි, ඔවුන් එල්. ජී. එස්. සී. එකේ සේවකයන් වන නිසා ඒ ලිපිකරුවන්ගෙ ජීවනාධාර රජයෙන් ගෙවන්ට සිදු වී තිබෙනව. මට පෙනෙන හැටියට නම් මේ ලිපිකරුවන් සුළු නගර සභාවට සැපයීම අනුමත නොකරන්නෙ, එසේ රජයෙන් යම්කිසි මුදලක් වියදම් වන නිසයි. එයින් සිදු වන්නෙ, දැනට සිටින ලිපිකරුවන්ට අතිකාල දීමනා වශයෙන් විශාල මුදලක් දී වැඩ කටයුතු කරවා ගැනීමටයි. නමුත් එසේ අතිකාල දීමනා ගෙවීමෙන් එම වැඩ කටයුතු හරියාකාරව කෙරෙන්නෙ නැහැ. ඇත්ත වශයෙන් එසේ කරන්නත් බැහැ. අන්තිමට සිදු වන්නෙ මොකක් ද? "සුළු නගර සභාව හරියාකාරව වැඩ කර නැත, එහි පාලනය අදක්ෂය" කියා ගරු ඇමතිතුමා විසින් එම ආයතනය විසුරුවා හරිවී. නමුත් හරියාකාරව වැඩ සිදු නොවීම සුළු නගර සභාවෙ වරදක් නොවෙයි. සුළු නගර සභාව සූදානම්, මේ ලිපිකරුවන් 3 දෙනාගෙ වැටුපත් ගෙවන්ට. නමුත් අවසරය දෙන්නෙ නැහැ. ඇයි? මහා ආණ්ඩුවෙන් අර ජීවනාධාර මුදල ගෙවන්න සිදු වන නිසා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම පළාත් පාලන ආයතන දියුණු කිරීමට මේ රජයේ බලාපොරොත්තුවක් තියෙනව නම්, මෙවැනි දේවලට මුදල් නැත කියා මට පිළිගන්න බැහැ. මේ රටේ මුදල් සෑහෙන ප්‍රමාණයක් තියෙනව. මෙතන විදේශ විනිමය ප්‍රශ්නයක් තියෙනව නම් මට ඒක තේරුම් ගන්න පුළුවන්. විදේශ විනිමය පිළිබඳ අර්බුදයක් —අමාරුකමක්—අද තියෙනව. විදේශ විනිමය ප්‍රශ්නය නිසා යම් වියදමක් දරන්න බැරිය කියා රජය කියනව නම් අපි ඒ කීම පිළිගන්න ඕනැ. නමුත් මෙතැන විදේශ විනිමය ප්‍රශ්නයක් නැහැ. මේ රට ඇතුළෙම කෙරෙන වැඩ සඳහා මේ රජයට මුදල් නැත කියන්න බැහැ. ඒ සඳහා සෑහෙන ප්‍රමාණයක් මුදල් තියෙනව. භාල් සලාකය සේරුවකින් සැපුවාට පසු පෙරට වඩා කෝටි 20 ක පමණ මුදලක් භාණ්ඩාගාරයට ලැබෙනව. ඒ නිසා කරන්න පුළුවන් මේ විධියේ වැඩ කරන ලෙස මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනව. මේ අන්දමට හොඳින් වැඩ කරන පළාත් පාලන ආයතනවලින් සාමාන්‍ය වැඩ කරන්න ලිපිකරුවන් ඉල්ලුවම ජීවනාධාර මුදල් ගෙවන්න සිදු වෙනවාය කියා ලෝභකමට ඒ පළාත් පාලන ආයතනවලට අවහිර කරන්න එපායයි මම ඉල්ලා සිටිනව.

අ. භා. 5.5

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்னே)*
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධව මමත් වචන ස්වල්පයක් කථා කිරීමට බලාපොරොත්තු වෙනව. මා හිතන අන්දමට, අප කාගේත් අදහස අනුව මහා නගර සභා, සාමාන්‍ය නගර සභා, සුළු නගර සභා සහ ගම්සභා යන පළාත් පාලන ආයතනවලට අයිති ප්‍රදේශ දියුණු වන්නේ හෝ පරිහාණියට පත් වන්නේ මූලික ප්‍රතිපත්ති අනුවයි. ඒ මූලික ප්‍රතිපත්ති සම්පාදනය කරන්නේ මහා ආණ්ඩුව මගින්. මේ වර මා මේ ගරු සභාවට පැමිණ මාසයක් පමණ වෙනව. මේ කාලය තුළ මේ ආණ්ඩුව විසින් නොයෙකුත් යෝජනා මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ කොහොම හරි පොඩි මිනිහාගෙන් මුදල් ලබා ගන්නයි. මේ සංශෝධන පනතෙන් අයබදු වැඩි කරන්න යනවාද, අඩු කරන්න යනවාද, කියා අපට පෙනෙන්නෙ නැහැ. මා හිතන අන්දමට, මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුව නම් විශේෂයෙන්ම සුළු නගර සභාවල සහ ගම්සභාවල, ඒ වගේම නගර සභාවල සිටින සාමාන්‍ය ජනතාවගේ බදු අඩු කිරීමක් වෙන්නෙ නැහැ. එම නිසා මා සිතන අන්දමට—භාණ්ඩාගාරයේ තියෙන මුදල් මහජන වුවමනා සඳහා කෙළින්ම යොදවා මහජන ප්‍රශ්න විසඳන්නේ නැතිව—මේ සංශෝධන පනත් ගෙනැත් තිබෙන්නේ සාමාන්‍ය ජනතාවගෙන් නැවතත් බදු අය කර ගැනීමටයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොම්පැණිවලින්, පොහොසත් උදවියගෙන්, නොයෙක් අන්දමින් ගත් බදු මුදල්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

මේ රජය ආපසු ගෙවා තිබෙන බව දන් අපි කව්රුත් දන්නවා. ගරු පළාත් පාලන උප ඇමතිතුමා නළල ටිකක් රැලි කරනවා. ගරු මුදල් ඇමතිතුමාගේ පළමුවැනි අයවැය කථාව අනුවම කෝටි 7 ක පමණ සහනයක් ධනපති කොම්පැණිවලට දුන් බව අපි දන්නවා. විදේශ විනිමය වශයෙන් කොයි තරම් මුදලක් පිටරට යවන්න ඉඩ දී තිබෙනවද යන්නත් අපි දන්නවා. ඒ අතරම රජයට ගෙන තිබූ නොයෙක් ව්‍යාපාර ආපසු දීම නිසාත් නොයෙක් අන්දමේ පාඩු විදින්නට රජයට සිදු වී තිබෙනවා. ඒ නිසා සාමාන්‍ය ජනතාව ඉතිරි කර තිබෙන ඉතිරි කිරීමේ ව්‍යාපාර වලිනුත් මුදල් ගැනීමට යත්න දැරූ බව ගිය මාසයේ අපට දැන ගන්න ලැබුණා. මේ විධියේ සංශෝධන පනත් ගෙනෙන්නේ මහජනතාවගෙන් පුළුවන් තරම් මුදල් ලබා ගැනීමට පමණයි.

අපේ පළාත් පාලන ආයතන වර්ග 4 ක් තිබෙනවා. ඒවා තමයි, මහා නගර සභා, නගර සභා, සුළු නගර සභා සහ ගම්සභා. මේ සංශෝධන පනතේ නගර සභා සම්බන්ධව ඉදිරිපත් කර තිබෙන වගන්තිය මහ නගර සම්බන්ධයෙන් දැනටත් ඒ විධියටම තිබෙනවා.

"The Council may",—under this Section—"impose different rates for different areas or parts of the towns according to the services provided by such Council for each such area or part."

අපි මේ අන්දමේ උස් පහත් කිරීම්වලට විරුද්ධ වෙන්නෙ නැහැ. එක් ශ්‍රේණියක සිට තවත් උසස් ශ්‍රේණියකට හෝ පහත් ශ්‍රේණියකට දැමීම ගැන අපි ඒ තරම් කල බල වන්නෙ නැහැ. අපට ඕන වැඩ සිදු වෙන්ටයි. නමුත් මේ විධියට සංශෝධන කිරීමෙන් සිදු වන්නෙ ඇතැම් පළාත්වල වාසය කරන උදවියට දරන්ට බැරි බදු ක්‍රම වලට මුහුණ දෙන්ට සිදු වීමයි. යම් විධිය කින් කොළඹ හතට බදු මුදලක් වැඩි කළාය කියා සිතමු. කොළඹ හතේ වුණාට මුඩුක්කුත් තියෙනවා. ඒ මුඩුක්කුවල සිටින උදවියටත් එම බද්දම ගෙවන්ට සිදු වෙනවා. එම නිසා බදු අය කිරීමෙදී මිනිසා ගේ වටිනාකම, වත්කම, ගැන සලකා බලා මිස වෙනත් ක්‍රමයකින් බදු අය කිරීම යුක්ති සහගත නැතෙයි කියා අපි කල් පනා කරනවා.

පළාත් පාලන ඇමති අංශයෙන් පළාත් පාලන ආයතනවලට දෙන ආධාර යථා පරිදි ලැබෙන්නෙ නැහැ. ඒ බව ඔප්පු කරන්ට උදාහරණයක් පෙන්වන්ට පුළුවනි. පාසැල් පොත් ලබා දීම සඳහා කොලොන්නාව නගර සභාවට මුදල් ලැබුණෙ බොහොම ප්‍රමාද වෙලයි. ඒ සඳහා ඉල්ලුම් පත් යැව්වේ 1966 දෙසැම්බර් 16 වනදායි. මුදල් ලැබී තිබෙන්නෙ 1967 පෙබරවාරි 10 වන දයි. එතකොට දුප්පත් උදවිය පොත් පත් අරගෙන ඉවරයි. ඒ වගේම එම මුදල් ලැබී තිබෙන්නෙ පුද්ග ලික ආයතනවලින් ලබා ගත හැකි පොත් පත් සඳහා පමණයි. පසුගිය ආණ්ඩුවෙන් නොයෙකුත් පොත් පත් නිකුත් කළ බව අපි දන්නවා. ඒව ගැනීමට මුදල් වෙන් වී නැහැ. ආණ්ඩුවෙන් මුද්‍රණය කරන පොත් පත් පළාත් පාලන ඇමති අංශයෙන් කෙලින්ම අරගෙන ඒ ඒ ආයතනවලට ලබා දුන්නොත් සුදුසු පරිදි බෙදා දෙන්ට පුළුවනි. මේ දක්වාම, ඒ කියන්නෙ මාර්තු අන්තිම වන තුරුත්, පොත් නිසියාකාර බෙදා දී නොමැති බව පේනවා.

මුල්ලේරියාව සුළු නගර සභාව මගින් පාලනය වන්නෙ බොහොම වැදගත් ආය තන පිහිටි ප්‍රදේශයක්. මානසික රෝහල වැනි ආයතන එහෙ තියනවා. ඒ සුළු නගර සභාවට මධ්‍යම ආණ්ඩුවෙන් ගෙවිය යුතු මුදල් තවම ලැබී නැහැ. ඒ කොට්ඨාශය තුළ ආණ්ඩුවේ ආයතන වාගේම ආණ්ඩුවෙ ඉඩම්ද තිබෙනවා. ඒ ආයතන සහ ඉඩම්වලින් බදු අය කරන්ට පුළුවනි. ඒ සුළු නගර සභාව මගින් ලක්ෂ තුන කුත් ගණනක් ඉල්ලා යවා තිබෙනවා. [බාධා කිරීමක්] කෝටි තුනද ලක්ෂ තුනද කියන්ට මට හරියට මතක නැහැ. තවමත් ඒ මුදල ලැබී නැහැ. විදුලිය සම්පාදනය පිණිසත් ඉල්ලුම් පත්‍රයක් යවා තිබෙනවා. එය ගෙවිය යුතුය කියා විදුලි බල දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර කර තිබෙනවා. එම සුළු නගර සභාවට ආණ්ඩුවෙන් ලැබෙන්ටම වුවමනා මුදල් ප්‍රමාණය ලැබුණොත් අර වැඩ කටයුතු හුඟක් දුරට සාර්ථක වෙනවා. එම නිසා අය බදු අය කිරීම සම්බන්ධ ක්‍රම සම්පාදනය කරන ගමන්ම පළාත් පාලන ඇමති අංශයෙ යුතුකම්ද හරියාකාර ඉටු කළොත් හුඟක් දුරට සහන සැලසෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොට්ටාවත්ත සුළු නගර සභාවේ ජල සම්පාදන කටයුතු පිළිබඳව ඉල්ලුම් පත්‍ර යක් එවා තිබෙනව. ඒ වගේම විදුලි බලය වැඩි කිරීමට ඉල්ලා තිබෙනව. ඒවා යථා අන්දමට කෙරෙන්නෙ නැහැ.

අපේ ක්‍රීඩා පිළිබඳ ඇමතිතුමා පසුගිය කාලෙ ඒ ප්‍රදේශයෙ හොඳට සංචාරය කළ නිසා මේ අඩුපාඩුකම් පිළිබඳව එතුම හොඳා කාර දන්නව ඇති. ඒ කාලෙ මැති ඇමති වරුන්ට ඒ අඩුපාඩුකම් පිළිබඳව නොයෙ කුත් ආයාචනා ඉදිරිපත් කළ බව අපි දන්නව. ඒවා ගැන උණුසුම් අන්දමට ක්‍රියා කළොත් අයබදු අය කිරීම ආදී කට යුතු තව ටිකක් පරක්කු වුණත් අපට සැනසෙන්ට පුළුවනි.

හුඟක් පළාත් පාලන ආයතනවලට අයත් ප්‍රදේශවල ආණ්ඩුවෙ ඉඩම් තිබෙ නව. මා සන්තොෂයෙන් කියන්ට කැම තියි, මේ ආහාර වගා කිරීමෙ ප්‍රතිපත්ති වලට අනුව ගම්මු ගිහින් ආණ්ඩුවෙ ඉඩම් අල්ලා ගත් විට ඒ උදවියට නඩු නොදමා ඉඩම් ලබා දෙන්ට යනවාය කියන කාර ණය පත්‍ර මාර්ගයෙන් දුටු බව. නගර සභා සුළු නගර සභා ප්‍රදේශයන්හි ඉඩම් හිඟය නිසා ආණ්ඩුවේ ඉඩම්වල පදිංචි වී සිටින් නන් ගැනද කල්පනා කර බලා, ආණ්ඩු වට වුවමනා නොකරන ඉඩම් ඇත්නම් ඒවා ඒ දුප්පත් මිනිසුන්ට පවරා දෙන හැටියට මතක් කරනවා. කොලොන්නාව කොට්ඨාශය තුළ ඇති පරණ සුසාන භූමි යක සමහරුන් ගෙවල් හදාගෙන පදිංචිව සිටිනු මා දක්කා. ඒ ස්ථානය යළිත් සුසාන භූමියක් බවට පත් කරන්නට බැහැ. ඒ නිසා ඒ බිම ගෙවල් සාදා ගැනීම සඳහා පවරා දෙනොත් ලොකු ප්‍රයෝජන යක් සිදු වෙනවා.

ඒ ඒ ප්‍රදේශයන්හි සලසන සේවාවන් අනුව අයබදු ගන්නට ගියහොත් නොයෙ කුත් දේශපාලන බලපෑම් මතු වීමෙන් අකටයුතු සිදු වන්නට පුළුවනි. විශේෂ යෙන්ම මැතිවරණවලින් පසුව ඒ වගේ අයුක්තිසහගත වැඩ ඇති වන්නට පුළු වනි. කොලොන්නාවේ අතුරු මැතිවරණ යෙන් පසුව එහි සමහර ඉඩම් හිමියන් ගෙවල් කුලී වැඩි කර තිබෙනවා. එහෙත් ආණ්ඩු පක්ෂයට වැඩ කළ උදවියගේ ගෙවල් කුලී නම් වැඩි කර නැහැ. කොටින්ම වන්නේ, තුඩාව බුත්ගමුවේ ඒ වගේ සිද්ධින් තිබෙනවා. එසේ හෙයින් පළාත් පාලන ආයතනවලට මේ වගේ බලතල දෙන විට ඒ බලතල පාවිච්චි කොට සාධාරණය ඉෂ්ට කරනු ඇද්දැයි සැලකිලිමත් විය යුතුයි. මේ වගේ සංශෝධන පනත් සම්මත වීමෙන් පසුව විපක්ෂයට හිතවත් අයගෙන් වැඩි බදු අය කරන්නටත් අනික් අයගෙන් අඩු බදු අය කරන්නටත් ඉඩ තිබෙනවා. මැද කොළඹ ගරු මන්ත්‍රීතුමා ආණ්ඩුවට විරුද්ධ කෙනකු නම් කොළඹ නගර සභාව මැද කොළඹට වැඩි බදු බර පට වන්නට ඉඩ තිබෙනවා. මෙවැනි අකටයුතු වැඩ සඳහා නීතියෙන් ඉඩ සලසා දුන්නොත් එය පව් කිරීමට අනුබල දීමක් වන හෙයින් දේශපාලන වාද භේද නොතකා සාධාරණ ලෙස වැඩ කරගෙන යන ලෙස ඉල්ලා සිටිනවා.

අ. භා. 5.16

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා වැඩි වේලාවක් කථා කරන්නට අදහස් කරන් නේ නැහැ. මට කලින් කථා කළ කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමාගෙන් (ඉලංගරත්න මයා.) ප්‍රකාශ වූ අදහස් මා අනුමත කරන බව සඳහන් කරන අතරම මේ පනත ක්‍රියාත්මක කළහොත් පළාත් පාලන ආයතනවලින් සාධාරණය යුක්තිය ඉටු නොවන බව කියන්නට කැම තියි. ඊට පිළියමක් වශයෙන් වර්ග කළ අය බදු ක්‍රමයක් ඇති කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එවැනි අයබදු ක්‍රමයක් ඇති කිරීමෙන් කාටත් සාධාරණය ඉෂ්ට වෙනවා ඇති.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ආයතනවල කටයුතු ආදි කාලයේ පැවති තත්ත්වයෙන්ම ඉදිරියටත් ගෙන යන්නටයි, සිදු වී තිබෙන්නේ. එංගලන්තය අනුව යමින් ඒ රටේ තිබෙන ක්‍රමය මේ රටේ තහවුරු කිරීමටයි, මෙපමණ කලක් තිස්සේ ක්‍රියා කර ඇත්තේ. මේ ක්‍රමය වෙනස් කොට ලංකාවට ගැළපෙන පොදු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම අවශ්‍යයි. තවද නගර දියුණු කිරීම සම්බන්ධයෙන් එක එක නගර සභාවට හිතෙන හිතෙන හැටියට වැඩ කර ගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

යන්නට ඉඩ නොදී නගර නිර්මාන ශිල්පීන්ගේ උපදෙස් හා ඔවුන්ගේ සැලැස්මවල් අනුව නගර දියුණු කිරීමේ පොදු ක්‍රියා මාර්ගයක් ඇති කිරීම ඉතාමත්ම වැදගත් කාරණයක් හැටියට සඳහන් කරන්නට කැමතියි. පළාත් පාලන ආයතන මගින් ඒ ඒ ප්‍රදේශයන්හි ජල පහසුකම්, විදුලිය පහසුකම් ආදිය ඇති කරනු ලබන විට ඇත්තෙන්ම ඒවායින් වැඩි ප්‍රයෝජනය ලබන්නේ දුප්පත් ජනතාව නොව ධනපති පන්තියේ උදවියයි. එසේ හෙයින් ඒ උදවියගෙන් වැඩි බද්දක් අය කිරීමෙහි වරදක් නැහැ. මාතර නගරයේ පොදු ජල සම්පාදන ක්‍රමයක් තිබුණත් තවමත් දුප්පත් බොහෝ දෙනාට එයින් ප්‍රයෝජනයක් ලබන්නට පුළුවන් වී නැහැ. ඒ පිරිස තවමත් තම තමන්ගේ මිදුල්වල ඇති ළිංවලින් නුයි, ජලය ලබා ගන්නේ. එහෙත් නගර සභාවෙ බද්ද ගෙවීමට ඔවුන්ටද සිදු වී තිබෙනවා. මාතර නගරයේද මහ නගරයක වගේ සියයට 20ක බද්දක් අය කරනවා. එහෙත් සාමාන්‍ය නගර සභාවකින් ලැබිය යුතු අයිතිවාසිකම්වත් නොලැබෙන බව කනගාටුවෙන් කියන්නට සිදු වී තිබෙනවා. පසුගිය දවස්වල මාතර නගර සභාව මගින් ගෙවල් බෙදීමක් සිදු කළා. දානවත්ත කියන ඉඩමේ ගෙවල් 18ක් පළාත් පාලන ආයතනය මගින් තැනුව. ඒ ඉඩම ගෙවල් තැනීම සඳහා පවරා ගන්නා අවස්ථාවේ දුප්පත් අයගෙ ගෙවල් හතකුත් එහි තිබුණා. ඒ නිසා ඒ හත්දෙනාට ගෙවල් දීමට නගර සභාව බැඳී සිටි හෙයින් ගෙවල් 7ක් ඒ අයට දුන්න. ඉතිරි ගෙවල් 11 බෙදූ ආකාරය නම් හරිම පුදුමයි. මාතර නගර සභාව එක්සත් ජාතික පක්ෂයේ පාලනය යටතේ තිබෙන එකක්. එහි සිටින නියෝජිතයින් 11 දෙනාගෙන් 9 දෙනෙක්ම එක්සත් ජාතික පක්ෂයේ අයයි. ඒ නගර සභාව මගින් මේ ගෙවල් 11 බෙදුවේ කොහොමද? දුප්පත් අය ගැන සලකා බැලුවෙත් නැහැ; ගෙවල් නැති අය ගැන සලකා බැලුවෙත් නැහැ; පැල්පත්වල සිටින අය ගැන සලකා බැලුවෙත් නැහැ. වෛද්‍ය නිලධාරියාගේ උපදෙස් අරගෙන ඔහුගේ නිර්දේශයන් අනුව බෙදුවෙත් නැහැ. ඒ ගෙවල් එකොළහ නගර සභාවේ නියෝජිතයින් 11 දෙනා අතරේ බෙදා ගත්ත. ඔවුන් අතරේ ගෙවල් ටික බෙදාගෙන ඔවුන්ට වුවමනා විධියට ඔවුන්ගේ හෙංචයියලාට ගෙවල් ටික දුන්න. කොයි තරම් අසාධාරණද? කොයි තරම් වැරදි විධියට මහජන බදු මුදල් පාවිච්චි කර තිබෙනවද? මහජන මුදල්වලින් සෑදූ ගෙවල් තම තමන්ගේ දේශපාලන බලය තහවුරු කර ගැනීම සඳහා ඔවුන්ගේ හෙංචයියලාට දීමට ඉඩ දෙනවාද කියා ගරු පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා ප්‍රශ්න කරනව. එය නගර සභාවේ වාර්තා පොත්වලත් වාර්තාගත වී තිබෙනව. ඒ විධියටයි කටයුතු කරගෙන යන්නෙ. මේ විධියේ නීති සකස් කර බදු අය කිරීමට නගර සභාවලට ඉඩ දුන්ණොත් කොයි විධියේ සෙල්ලම් පෙන්වාවිද කියන එක තමුන්නාන්සේට තේරෙනව. වර්ග කළ බදු ක්‍රමයක් ඇති කිරීමෙන් මාතර නගර සභාවට මීට වැඩි ආදායමක් ලබා ගන්නට පුළුවන් වෙනව.

එමෙන්ම පුරහලක් නැතිකම මාතර නගරයට ඇති විශාල අඩුවක්. මහ නගර සභා තත්ත්වයෙන් බදු අය කරන නමුත් පුරහලක් නැහැ. මේ අලුත් ආණ්ඩුව බලයට පත් වුණාට පසුව මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පවා සීමා කරන්නට කටයුතු කර තිබෙනව. වෘත්තීය සමිතියක හෝ ගුරු සංගමයක හෝ මහජන සංවිධානයක හෝ රැස්වීමක් තබන්නට වුවමනා වුණොත් ඒ සඳහා එළිමහන් පිට්ටනියක් හැර වෙනත් ස්ථානයක් ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. පාසැල් ගොඩනැගිලි දෙන්නේම නැහැ. මහජන රැස්වීමකටවත් වෘත්තීය සමිති රැස්වීමකටවත් පාසැල් ගොඩනැගිලි ලබා ගන්න බැහැ. මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය එකයි. [බාධා කිරීමක්] ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා කියනව එහෙම නොවෙයි කියල. එහෙත් මෙවැනි රැස්වීම්වලට පාසැල් ගොඩනැගිලි දෙන්නට එපාය කියා ගරු අධ්‍යාපන ඇමතිතුමා කියා තිබෙනව. ගුරුවරුන්ගේ රැස්වීමකටවත් පාසැල් ගොඩනැගිල්ලක් දෙන්නේ නැහැ. ගුරු පෙරමුණේ රැස්වීම් පැවැත්වීමට පමණක් ඉඩ දෙනව. එහෙත් ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමයේ රැස්වීම්වලට ඉඩ දෙන්නෙ නැහැ. ගුරු පෙරමුණ අධ්‍යාපන ඇමතිතුමාට පන්දම් අල්ලන නිසා ඒ අයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පමණක් රැස්වීම් පැවැත්වීම සඳහා පාසැල් ගොඩනැගිලි ලබා දෙනවා. අධ්‍යාපන ඇමති වරයාගේ වැරදි ප්‍රතිපත්තිවලට විරුද්ධව සටන් කරන අයට ඒ අයිතිය දෙන්නේ නැහැ. එය බොහොම අසාධාරණ වැඩක්. ඒ නිසා මාතර නගරයේ වැසියන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ජීවිතය ආරක්ෂා කරන්න වුවමනා නම් වහාම මාතරට පුරහලක් දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. කොළඹට හා ගාල්ලට පුරහලවල් ඇතත් මහ නගර සභා තත්ත්වයෙන් බදු අය කරන මාතරට එවැන්නක් නැහැ. මේ කරුණ මේ යෝජනාවට සම්බන්ධ නැති වුණත් ඒ ගැන කල්පනා කර බලා ඒ අවශ්‍යතාවය ඉටු කර දීමට කටයුතු කරන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

සකස් කළ යුතුව ඇත්තේ බදු ක්‍රම පමණක් නොවෙයි. වැඩිවන ජනගහනය අනුව අලුතෙන් කොට්ඨාශ බෙදා වෙන් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමත් ඉතාමත්ම අවශ්‍ය වී තිබෙනවා. මාතර නගර සභාවට අයත් ඡන්දදායක කොට්ඨාශ 11 ක් තියෙනවා. එයින් පළමු වැනි කොට්ඨාශය කොටුව යි. කොටුවෙ ඓතිහාසික තාප්පයෙන් සීමා වන ප්‍රදේශය එක් ඡන්දදායක කොට්ඨාශයක් බවට පත් කර ඒ වෙනුවෙන් නියෝජිතයෙක් නගර සභාවෙ පෙනී සිටිනවා. කොටුව කොට්ඨාශයෙ ඡන්දදායක සංඛ්‍යාව 600 යි. නමුත් කොටුවෙගොඩ කොට්ඨාශයෙ ඡන්දදායකයන් 1,600 ක් සිටිනවා; වෙලේගොඩ කොට්ඨාශයෙ 1,900 ක් පමණ සිටිනවා. මේ අනුව බලන විට, එක තැනක ඡන්දදායකයින් 600 ක් වෙනුවෙන් එක් නියෝජිතයෙක් පෙනී සිටින අතර, තව තැනෙක ඡන්දදායකයින් දෙදාහකට කිට්ටු ගණනක් වෙනුවෙනුත් එක නියෝජිතයෙක් පෙනී සිටින බව පෙනී යනවා. මාතර නගර සභාවෙ අද පවතින මේ තත්ත්වය අනුව එක් කොට්ඨාශයක ඡන්ද සංඛ්‍යාව තවත් කොට්ඨාශයක ඡන්ද සංඛ්‍යාව මෙන් තුන් ගුණයකටත් වැඩියි. මේවගෙ දේවල් සම්බන්ධයෙන් රජයේ විශේෂ සැලකිල්ල දක්වා නගර සභාත් මහ නගර සභාත් කෙරෙහි පොදු ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

බදු අය කිරීම සම්බන්ධයෙනුත් වෙනසක් කළ යුතුයි. මේ පිළිබඳ මෙතෙක් කල් පවත්වාගෙන ආ පිළිවෙළ තවදුරටත් පවත්වාගෙන යාම සාධාරණයයි මා කල්පනා කරන්නෙ නැ. එම නිසා ඒ ගැනත් රජයේ සැලකිල්ල යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. මීට වඩා කථා කරන්න මම අදහස් කරන්නෙ නැ.

අ. භා. 5.26

**බී. එච්. බණ්ඩාර මයා.** (බදුල්ල)
*(திரு. பி. எச். பண்டார—பதுளை)*
(Mr. B. H. Bandara—Badulla)

ගරු සභාපතිතුමනි, පළාත් පාලන කටයුතු පිළිබඳ ගරු උප ඇමතිතුමා විසින් මහ නගර සභාත් සුළු නගර සභාත් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධන පනත ගැන මාත් අදහස් කීපයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. දැනට මේ මහ නගර සභාවලත් සුළු නගරසභාවලත් බදු අය කිරීම් ඉතාමත් අසාධාරණ ක්‍රමයකට සිදුවන බව අප කවුරුණුත් පිළිගත යුතු කාරණයක්. සමහරවිට මිනිසුන් වාසය කරන නිවෙස්වල ගොඩනැගිල්ලේ තත්ත්වය අනුව බදු අය කරන අවස්ථා තිබෙනවා. ඒ වගෙ දේවල් නිසා බොහෝවිට දුප්පත් පන්තියෙත් මධ්‍යම පන්තියෙත් බදු ගෙවන්නන් තැලෙන පොඩිවන අවස්ථා ඇති වෙනවා. මේ සම්බන්ධයෙන් උදාහරණයක් ගරු උප ඇමතිතුමාට මේ අවස්ථාවේ පෙන්වා දෙන්න කැමතියි. වෙළෙඳාමක් කරන යම්කිසි පුද්ගලයෙක්, ඔහුට ඒ වෙළෙඳාමෙන් වාසි ලැබෙන කාලයෙ හොඳ ගෙයක් දොරක් හදා ගන්නවා. කිසියම් හේතුවකින් ඒ වෙළෙඳාම බංකොලොත් වී ඔහුගෙ අය තත්ත්වය පහල වැටුණොත්, කලින් ගෙවූ පිළිවෙළටම බදු මුදල් ගෙවන්නට ඔහුට පුළුවන් කමක් නැහැ. ඔහුගෙ ආදායම ඊට ප්‍රමාණවත් වන්නෙ නැ. නමුත් නගර සභාවෙ නීති රීති හා බල කිරීම උඩ ඔහු නියමිත ගණනටම බදු මුදල් ගෙවිය යුතුමයි. නොගෙව සිටියොත් ඔහුගෙ කඩේ තිබෙන බඩුමුට්ටු විකටත් තට්ටු වෙනවා. මෙන්න මේවගෙ සිදුවීම් බොහෝ නගර සභා හා සුළු නගර සභා සීමා තුළ ජීවත්වන දුප්පත් පන්තියෙත් මධ්‍යම පන්තියෙත් අය බදු බරින් මිරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

කෙමින් ඉතාමත් කරදරකාරී තත්ත්වයක ජීවත් වන බව අප කවුරුනුත් දන්න කරුණක්.

මේ තත්ත්වය උඩ, සමහර නගර සභා මැතිවරණවලදී එක් එක් දේශපාලන පක්ෂ, "අපට බලය ලැබුණොත් බදු මුදල් අඩු කරනව, විදුලි බල ගාස්තුව අඩු කරනව" ආදී වශයෙන් ඡන්දදායකයින්ට නොයෙක් නොයෙක් පොරොන්දු දෙනව. "මේ වාරයෙවත් අපට හරි යාදෝ" යන විශ්වාසයෙන් ඡන්දදායකයන් ඒ ඒ දේශපාලන පක්ෂ කෙරෙහි විශ්වාසය තබා කටයුතු කරනව. [බාධා කිරීමක්] එක්සත් ජාතික පක්ෂයත් කොළඹ නගර සභා මැතිවරණයෙදී ඒ විධියෙ පොරොන්දු කොපමණවත් දී තිබෙනව. වෙනත් පක්ෂයකට බලය ගියොත් මේ වතාවෙවත් කොහොම නමුත් පිහිටක් ලබාගන්නට පුළුවන් වේයයි, බදු බරින් මිරිකී සිටින ඡන්දදායකයින් බලා පොරොත්තු වෙනව. බලය ලැබුණායින් පසු මහජනතාව පෙළන ඒ ප්‍රශ්න විසඳන්න කවුරුවත් ඉදිරිපත් වෙන්නෙ නැහැ. එම නිසා ඉතාම කරදරකාරී තත්ත්වයකයි, නගර සභා සහ සුළු නගර සභා පෙදෙස් තුළ ජීවත්වන අහිංසක ජනතාව පසු වෙන්නෙ. මේ බදු ක්‍රමය වෙනස් කර කෙනෙකුගේ ආදායම් තත්ත්වය හෙවත් වත්කම අනුව බදු අය කිරීමේ ක්‍රමයක් සකස් කරනවා නම් වඩාත් සාධාරණ බව පාර්ලිමේන්තු ලේකම්තුමාට මා මතක් කරන්ට සතුටුයි. මුදල් හදල් තිබෙන ධනපති උදවියගෙන් සෑහෙන බද්දක් අය කර ගත්තට වරදක් නැහැ. ණයතුරුස් වී හෝ තමන්ට ගෙයක් දොරක් හදාගන්ට කවුරුත් කැමතියි. ඒ අන්දමට ණයතුරුස් වී ගෙයක් දොරක් හදා ගත් කෙනෙකුට සුළු නගර සභාවට හෝ නගර සභාවට වරිපනම් බදු වශයෙන් විශාල මුදලක් ගෙවන්ට සිදු වන විට කුලීයට ගෙයක ජීවත් වෙනවාට වඩා වෙනසක් ඇත්තෙ නැහැ. පාර්ලිමේන්තු ලේකම්තුමා නගර සභාවක දීර්ඝ කාලයක් පෙනී සිටි නිසාත්, එතුමා ඡන්දදායකයින් සමග නිතර ආශ්‍රය කරන නිසාත්, මේ තත්ත්වය හොඳකාර දන්නවා ඇති. මේ බදු ක්‍රමය නිසා පීඩා විඳින විශාල සංඛ්‍යාවක් සිටිනව. එම නිසා මා පළමු කී අන්දමට වත්කම අනුව, ආදායම් තත්ත්වය අනුව, බදු අය කිරීමේ ක්‍රමයක් සකස් කිරීම වඩාත් යෝග්‍ය යයි, වඩාත් සාධාරණ යයි, මා විශ්වාස කරණව.

නගර සභා සුළු නගර සභා ප්‍රදේශ ක්‍රමයෙන් පළල් වීගෙන යනව. ආසන දහය පහළොව තිබෙන නගර සභා සුළු නගර සභා ආදියට ගම්කාර්ය සභාවලින් කොටස් ඇදාගෙන නගර සභා සීමා පළල් කර ගන්නව. නගර සභාවලට ගම්කාර්ය සභා ප්‍රදේශ ඇතුළත් කර ගැනීමෙන් පසු තමන්ට වරිපණම් බදු ගෙවන්ට සිදු වන නිසා ගම්සභා ප්‍රදේශවල පදිංචි ජනයා ඊට විරුද්ධත්වය ප්‍රකාශ කරනව. අපි නොයෙක් අවස්ථාවලදී කොයිතරම් විරුද්ධත්වය ප්‍රකාශ කළත් ගම්කාර්ය සභා ප්‍රදේශ නගර සභා ප්‍රදේශවලට ඇතුළත් කර ගන්නව. එසේ ඇතුළත් කර ගැනීමෙන් පසු අළුතින් නගර සභා ප්‍රදේශ බවට පත් වූ ප්‍රදේශවලිනුත් සමාන වරිපණම් මුදලක් අය කර ගන්නව. ඒ අළුතින් ඇතුළත් වන ප්‍රදේශවලට කිසිම පහසුකමක් නොමැතිවත් බද්ද සමානව අය කර ගන්නව. ජල පහසුව, විදුලි බල පහසුකම්, ආදි කිසිම ප්‍රශ්නයක් නොවිසඳා ඇතුළත් කර ගත්ත පලියට ඒ අයත් නියමිත බද්ද ගෙවන්ට ඕනෑ. බොහෝ විට මහජනයාට මේ සම්බන්ධයෙන් කරන්ට කියන්ට දෙයක් නැහැ. කාට කියන්ටද? අන්තිමේදී ඔවුන්ගෙ ඉඩකඩමට තට්ටු වෙනව. ගේදොර විකිණී යනව. කොහොම නමුත් ණයතුරුස් වෙලා හරි බදු මුදල ගෙවන්ට ඕනෑ. මෙයින් පීඩා විඳින විශාල සංඛ්‍යාවක් සිටින බව ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා හොඳින්ම දන්නව. මේ ප්‍රශ්නය ගැන සුළුවෙන් නොහිතා, රිදෙන තැන් හොඳ හැටි සොයා බලා, ඒ රිදෙන තැන්වලට ප්‍රතිකාරයක් යොදන්ට ක්‍රියා කළොත් වඩාත් සාධාරණ යයි මා මතක් කරනව.

මේ පනත බල පාන්නෙ සුළු නගර සභා හා මහ නගර සභාවලටයි. අද ලංකාවේ මහජනතාවගෙන් වැඩි දෙනෙක් ඇතුළත් වෙන්නෙ ගම්කාර්ය සභා ප්‍රදේශවලටයි. කලින් ගම්කාර්ය සභා හාර සියය ගණනක් තිබුණා. මේ අළුත් බෙදීම් කිරීම් උඩ——

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
510 ක්.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
දැන් ගම්කාර්ය සභා විශාල සංඛ්‍යාවක් තිබෙනවා. එම නිසා සුළු නගර සභා සහ මහ නගර සභාවලට වඩා අප විසින් සැලකිල්ලක් දැක්විය යුතුව තිබෙනවා, දුප්පත් ජනතාව විශාල වශයෙන් පදිංචිව සිටින ගම්කාර්ය සභා ප්‍රදේශ ගැන. සෑහෙන ආදායමක් ඇති ගම්කාර්ය සභා තිබෙන්නෙ ඉතා සුළු සංඛ්‍යාවක්. අවුරුද්දකට රුපියල් හාර පන්දාහක ආදායමක් ලැබෙන ගම්කාර්ය සභා සුළු ගණනක් තිබෙනවා. අවුරුද්දකට ගම්කාර්ය සභාවට ලැබෙන ආදායමෙන් එක ගම්සභා ආසනයකට රුපියල් 200 ක් වැය කරන්ටවත් බැරි තරම් පහත් ආදායම් ලබන ගම්කාර්ය සභා බොහොමයක් තිබෙනවා. ඉතාම සුළු මුදලක් තමයි ඒ ගම්කාර්ය සභා කොට්ඨාශයකට වැය කරන්ට පුළුවන් වෙන්නෙ. මේ තරම් සුළු මුදලකින්, රුපියල් එක සිය ගණනකින් නැත්නම් දෙසිය ගණනකින් ඒ ගමේ කරන්ට පුළුවන් දේවල් මොනවාද? ළිඳක් කපන්න පුළුවන්ද? ගල් පඩි පෙළක් දමන්න පුළුවන්ද? පාරක් හදන්න පුළුවන්ද? ජල නලයක් සවි කරන්න පුළුවන්ද? ඒ කිසිම දෙයක් මෙවැනි සුළු මුදලකින් කරන්ට පුළුවන්කමක් නැහැ. ගම්කාර්ය සභා කීපයකම මේ තත්ත්වය පවතින බව මා දන්නවා. මහ නගර සභා හා සුළු නගර සභා ප්‍රදේශවල සිටින ජනතාවට වඩා දුක් විඳින ජනතාවක්, පහසුකම් කිසිවක් නැතිව දුක් විඳින ජනතාවක් තමයි ගම්කාර්ය සභා ප්‍රදේශවල ඉන්නෙ. සමහර විට ගම්කාර්ය සභාවට ලැබෙන්නෙත් වර්ෂයකට එක ග්‍රාන්ට් මුදලයි. රුපියල් අටදාහක් දහදාහක් තරම ලැබෙනවා. වැඩිම වුණොත් රුපියල් දොළොස්දාහකට වඩා ලැබෙනවාද කියා මා දන්නෙ නැහැ. මගේ කොට්ඨාශයෙ ගම්කාර්ය සභාවලට නම් එපමණ මුදලක් ලැබී නැහැ. ඒ අනුව කොට්ඨාශ දහයක් පහළොවක් තිබෙන ගම්කාර්ය සභාවක එක කොට්ඨාශයකට වැය කරන්ට පුළුවන් වෙන්නෙ ඉතාම සුළු මුදලක්. ඒ සුළු මුදලින් කිසිවක් කරන්ට බැහැ.

අප කවුරුත් ප්‍රජාතන්ත්‍රවාදය අනුව, සාධාරණව අපේ හැම ගමක්ම දියුණු කරන්ට ඕනෑය යන අදහස දරණවා නම් රජයෙන් දැනට දෙන මුදලට වඩා වැඩි ආධාර මුදලක් ආදායම් මාර්ග අඩු ගම්කාර්ය සභාවලට වෙන් කළ යුතුයි. දැනට පවතින තත්ත්වයේ හැටියට ගම්කාර්ය සභා කොට්ඨාශවලින් තවත් බදු අය කිරීමේ ක්‍රම ඇති කරන්ට පුළුවන්ය කියා මා විශ්වාස කරන්නෙ නැහැ. තවත් බදු ගන්න දෙයක් නැහැ. තේ වතුවලිනුත් දැනට අක්කරයකට සෑහෙන මුදලක් ගන්නවා. වෙනත් බදු ක්‍රමයක් ඇති කරන්ට පුළුවන්කමක් නැහැ. වැඩි වශයෙන් දුප්පත් ජනතාවයි ඒ ප්‍රදේශවල වාසය කරන්නෙ. එම නිසා රජයෙන් දැනට වෙන් කරන මුදලට වඩා වැඩි ආධාර මුදලක් ආදායම අඩු ගම්කාර්ය සභාවලට දුන්නොත් ඒ ප්‍රදේශ දියුණු කළ හැකි වන බව මා පෙන්වා දෙන්ට සතුටුයි. ඇත්ත වශයෙන්ම අද ඒ ගම්කාර්ය සභාවලට ලැබෙන සුළු මුදලින්වත් යම් යම් ප්‍රශ්න නිසා වැඩක් කරගන්ට බැරි තත්ත්වයක් තිබෙනවා. මගේ කොට්ඨාශයේ වූ සිද්ධියක් උදාහරණයක් වශයෙන් පෙන්වන්ට සතුටුයි.

එක ගමකට ජල නළයක් ලබා ගනීමට මුදල් අනුමත කර තිබුණා. නමුත් වර්ෂ දෙකක් ගතවන තුරුත් ජල නළය ගන්න බැරි වුණා. හේතුව මේකයි. ගමකට ජල නළයක් ලබා ගැනීමේදී ඒ ජලය ලබා ගන්නා ස්ථානය රජයට අයිති නම් පළමුවෙන් දිසාපතිවරයාගෙන් අවසරය ලබා ගත යුතුයි. දිසාපතිවරයාගෙන් ලැබෙන අවසරය ඉඩම් කොමසාරිස්වරයා අනුමත කර එවිය යුතුයි. මේක කල් ගත වන පිළිවෙළක්. මගේ කොට්ඨාශයෙ රිල්පල ගම්කාර්ය සභාවෙ මැදගම කොටසෙ බුදමේ කඳුර ජල යෝජනා ක්‍රමය ගැනයි මා සඳහන් කරන්නෙ. මුදල් වෙන් කර අවුරුදු දෙකක් ගතවෙලත් ජල නලය සවි කර ගන්ට පුළුවන්කමක් නැහැ. හේතුව ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමතිය ලබා ගැනීමට බුඩමනා වීමයි. සමහර විට මේ අන්ද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

මට කල්ගත වීම නිසා මුලින් වෙන් කළ මුදලින් පසුව ඒ කාර්යය ඉෂ්ට කිරීමට නොහැකි වන අවස්ථාත් තිබෙනව. එවැනි සිඞීන් කීපයක් ගැනත් මා දන්නව. බුදමෙ කඳුර ජල යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් වරයාට ලියුම් ලියනව, ලියනව. වර්ෂ දෙකක් ගතවී තිබෙනව. කොහොමවත් අනුමතිය ලැබෙන්නෙ නැහැ. එමනිසා යල් පැනපු මේ ක්‍රම වෙනස් කළයුතුව තිබෙනව. මීට වඩා ශීඝ්‍රයෙන් මේ වැඩ කිරීමට නම් වෙනස් වැඩ පිළිවෙළක් සකස් කළයුතුව තිබෙනව. ඇත්ත වශයෙන්ම අද පවතින මේ යල් පැනපු ක්‍රම නිසා ලැබෙන සුළු මුදලින්වත් වැඩක් කිරීමට අසිරු තත්ත්වයක් උදාවී තිබෙනවා. එමනිසා දනට අනුගමනය කරන ක්‍රම වෙනස් කර අළුත් ක්‍රම ඇති කිරීම වඩාත් සුදුසුය කියා මා අදහස් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බදුල්ල නගර සභාව ඌව ප්‍රදේශයේ එකම මහ නගර සභාවයි. ඒ නගර සභාවට සෑහෙන බදු මුදලක් ලැබෙනව. නමුත් ඒ නගර සභා ප්‍රදේශයට අයත් ජනතාව ජලය හිඟකමින් අවුරුදු ගණනාවක් තිස්සේ දුක් විඳිනව. ජල සම්පාදනය සම්බන්ධයෙන් එම නගර සභාවට ප්‍රමුඛස්ථානය දී තිබෙනවා. නමුත් ඒ ප්‍රමුඛස්ථානය නැවතත් ආපස්සට ගිහින්. ඊට හේතුව මොකක්ද කියන්න මම දන්නෙ නැහැ. නොයෙකුත් හිතවත්කම් හා වෙනත් බලපෑම් උඩ නොවෙයි, ප්‍රදේශයෙ ජල ප්‍රශ්නයෙ උග්‍රකම සලකාගෙනයි ජලය සැපයීම පිළිබඳව කටයුතු කළ යුත්තෙ. මෙම ක්‍රමය වෙනස් කරන්ට; බදුල්ලට ලැබිය යුතු ප්‍රමුඛස්ථානය නැති කරන්ට කිසිම හේතුවක් නැහැ. ඒ නිසා බදුලු මහ නගර සභාවට ලැබිය යුතු ප්‍රමුඛස්ථානය දී එම ප්‍රදේශයෙ ජල ප්‍රශ්නය විසඳන හැටියට මා ඉල්ලා සිටිනව.

බදුල්ල පළාත් ආණ්ඩු සභාව දැන් මහ නගර සභා තත්ත්වයට උසස් කර තිබෙනව. වෙළඳ ඇමතිතුමාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමාත් බදුල්ලෙ නගරාධිපති වශයෙන් කටයුතු කර තිබෙනව. මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවෙ මයා.) ඉල්ලා සිටියා වාගේම බදුල්ලටත් පුරහලක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනව. පුරහලක් නැතිව කටයුතු කිරීම ඉතාමත් අසීරුයි. විශේෂයෙන් මහ නගර සභාවලින් පුරහලක් නැත්තෙ බදුල්ලෙ මහ නගර සභාවට පමණක්ය කියා මා හිතනව. එම නිසා එම ඉල්ලීම ඉටු කර දෙන හැටියට මා ඉල්ලා සිටිනව.

අ. භා. 5.40

**එස්. ඒ. පීරිස් මයා. (වාණිජ හා වෙළඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. எஸ். ஏ. பீரிஸ்—வர்த்தக, வியாபார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. S. A. Peeris—Parliamentary Secretary to the Minister of Commerce and Trade)

නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විවාදයට සහභාගි වන්ට මා කලින් අදහස් කර ගෙන සිටියෙ නැහැ. නමුත් යම් තර්ක දෙකක් ඉදිරිපත් වී තිබෙන නිසා මේ ගැන යමක් කිව යුතුව තිබෙනව. මේ පනත් කෙටුම්පතට විශේෂයෙන් අදාළ වන බදුලු මහ නගර සභාවත්, ලුණුගල සුළු නගර සභාවත් පිළිබඳව කරුණක් සිහිපත් කරන්ට කැමතියි. යම් යම් හේතූන් නිසා පසුගිය රජය විසින් බදුලු පළාත් ආණ්ඩු සභාව මහ නගර සභා තත්ත්වයට උසස් කරන්ට යෙදුණා. එම රජය බලාපොරොත්තු වුණා, ඒ මඟින් යම් කරුණක් ඉටු කර ගන්ට. නමුත් එහි පාලන බලය අත් වුණේ වෙනත් පක්ෂයකටයි. ඒ අවස්ථාවෙ බදුල්ලෙ නගරාධිපති වරයා වශයෙන් කටයුතු කළ මට පෙනී ගියා, බදුල්ල මහ නගර සභාවක් කිරීම සඳහා කලින් තිබුණු පළාත් ආණ්ඩු සභාවට අළුතින් කොටස් දෙකක් අවට ගම් කාර්ය සභාවකින් එකතු කර තිබෙන බව. ඒ අවස්ථාවෙ අපට වැටහී ගිය කරුණක් තමයි, මහ නගර සභාවට අයත් දියුණු කොටස්වලින් අය කරන බදු ප්‍රමාණයම අර කලින් සඳහන් කළ නොදියුණු කොටස් දෙකෙනුත් අය කිරීම ඉතාමත් අසාධාරණ බව. එම නිසා මහ නගර සභාව තීරණය කළා, ඒ නොදියුණු කොටස් දෙකෙන් අය කර ගන්නා බද්ද යම්කිසි සියයට ප්‍රමාණයකින් අඩු කළ යුතුය කියා. ඒ සඳහා අපි එවකට තිබුණු රජයෙන් බලය ඉල්ලුව. එහිදී අප විසින් රජයට පෙන්නුම් කර දුන්න, කොළඹ මහ නගර සභාවට අයත් කිරුළපනේ කොට්ඨාශයෙන් අඩු බද්දක් අය කර ගන්ට බලය දී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනව වගේම එම නොදියුණු කොටස් දෙකෙනුත් අඩු බද්දක් අය කර ගැනීමට බලය දීම සාධාරණය කියා. ඒ සඳහා එවකට සිටි ගරු පළාත් පාලන ඇමතිතුමා හමුවන්ට ගියත් එය කර ගන්ට ලැබුණෙ නැහැ. මේ ජාතික රජය බලයට පත් වෙලත් අවුරුදු 2 ක් ගත වී තිබෙන නමුත් අයුතු විධියට ඒ නොදියුණු කොටස් දෙකෙන් බදු අය කර ගැනීම නැති කරන්ට පුළුවන්කම ලැබුණෙ නැහැ. එම නිසා වර්තමාන පළාත් පාලන ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටියා, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන හැටියට.

මා කලින් සඳහන් කළ විධියටම පට්ටි පොල කෝරළේ නොදියුණු කොටස් දෙකක් ලුණුගල සුළු නගර සභාවට එකතු කර තිබෙනව. ඒ ප්‍රදේශයෙ වැසිකිළි පහසුකම් ආදී පහසුකම් කිසිවක් නැහැ. නමුත් ලුණුගල සුළු නගර සභාව ඒ කොටස්වලිනුත් අනෙකුත් දියුණු කොටස්වලින් අය කරන බද්දම අය කරනව. ඒ අසාධාරණ බදු ඉවත් කිරීමට නැත්නම් අඩු කිරීමට තමයි, මේ පනත් කෙටුම්පතින් බලය ඉල්ලන්නෙ. ඒ නිසා මේ පනත් කෙටුම්පතට විරුද්ධ වන්නට කිසිම හේතුවක් නැහැ. කොළඹ මහ නගර සභාවට බලය දී තිබෙනව, කිරුළපනේ කොට්ඨාශයෙන් අඩු බද්දක් අය කර ගැනීමට. නමුත් ඒ බලය අනෙකුත් පළාත් පාලන ආයතනවලට ලැබී නැහැ. ඒ බලය ලබා දීමයි, මේ පනත් කෙටුම්පතින් අදහස් කරන්නෙ. ඒ නිසා මෙයට සහයෝගය දක්වන ලෙස මා ඉල්ලා සිටිනව.

අ. භා. 5.44

**ප්‍රේමදාස මයා.**

*(திரு. பிரேமதாச)*

(Mr. Premadasa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස කථා කරන්න බලාපොරොත්තු වන්නෙ නැහැ. නමුත් වැදගත් කරුණු කීපයක් මතු කළ නිසා ඒවා ගැන සුළු පිළිතුරක් දෙන්න මම බලාපොරොත්තු වෙනව. මේ පනත් කෙටුම් පත ගැන දීර්ඝ ලෙස කථා කළේ මා මිත්‍ර දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) යි. එතුමාගේ කථා වේදී වැඩි වශයෙන් ඉදිරිපත් කරන්නට යෙදුනේ කොළඹ නගර සභාවේ අදාළ ප්‍රශ්න කීපයක්. ඒ ප්‍රශ්න එතුමා ඒ අන්දමට ඉදිරිපත් කළේ කුමක් නිසාද කියා අපට තේරෙනව. දීර්ඝ කාලයක සිට කොළඹ නගර සභාවේ මන්ත්‍රීවරයකු හැටියට ක්‍රියා කරන එතුමා කොළඹ නගරය තුළම වූ ප්‍රදේශයක් වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරයකු වශයෙන් ඒ ඉදිරිපත් කළ කරුණු මමත් සම්පූර්ණයෙන්ම අනුමත කරන බව එතුමාට ප්‍රකාශ කරන්න සතුටුයි. නමුත් එතුමා ඉදිරිපත් කළ මේ කරුණු ගැන පළාත් පාලන අමාත්‍යාංශයේ සැලකිල්ල පසුගිය අවුරුදු දෙකේ කාලය තුළදී යොමු වුනේ නැත කියන්නට පුළුවන්කමක් නැහැ.

එතුමා ඉදිරිපත් කළ වැදගත්ම කාරණය නම් ප්‍රදේශ වශයෙන් වෙනස් බදු ක්‍රමයක් අය කරනවාට වඩා ඒ ඒ ස්ථාන වෙනුවෙන් වර්ගික බදු ක්‍රමයක් අය කිරීමට වැඩ පිළිවෙළ යෙදීම අවශ්‍ය බවයි. මේ කාරණය පළාත් පාලන ආයතන ගැන සැලකිල්ල දක්වන හැම දෙනාගේම වාගේ අවධානයට යොමු වෙලා තියෙනව. ඒ අනුව මෙය විශාල උද්ඝෝෂණයකට හේතු වී තිබෙන ප්‍රශ්නයක්. එතුමා ප්‍රකාශ කළ අන්දමට, පළාත් පාලන අමාත්‍යාංශයේ මේ සම්බන්ධයෙන් ඇති ලිපිගොනුවල ආරම්භ කර තිබෙන ක්‍රියා මාර්ග අපිත් ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යනව. චොක්ෂි කොමිෂන් සභාවේ නිර්දේශ අනුවයි ඒ වැඩ පිළිවෙළ පැනනැගී තිබෙන්නෙ. යම් පළාත් පාලන ආයතනයකට වර්ගික වෙනස් බදු ක්‍රමය ඇති කිරීම අවශ්‍යය කියා වැටහුනාම පළාත් පාලන ඇමතිතුමාගේ අවසරය ඇතුව ඒ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සුදුසුය කියන සංශෝධනයක් වරිපනම් සහ වටිනාකම් පිළිබඳව ඇති පනතට ඉදිරිපත් කරන්න යෝජනා කොට තිබුණා. ඒ සංශෝධනය ගැන අපි සැලකිල්ලක් දැක්වුවේ නැත කියන්නට බැහැ. ඒ මන්ද? ඊට අවශ්‍ය පියවර කීපයක් මේ රජය ගෙන තිබෙනව. වැඩි කල් නොගොස්ම ඒ සංශෝධනය ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනව.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

මගේ කීපීම ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
ඔව්.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
දැක්කම නමයි, මම ඒක විශ්වාස කරන්නෙ. ඒ වන තෙක් විශ්වාස කරන්නෙ නැහැ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
යාපයන්තොට ගරු මන්ත්‍රීතුමා කවදාවත් හිතුවෙ නැහැ, කොළඹ නගර සභාවට මහා ආණ්ඩුවෙන් ලැබිය යුතු රුපියල් තිස් ලක්ෂය ලැබේය කියා. නමුත් මේ රජය ඒ මුදල ලබා දුන්නා. එතුමා නගරාධිපති හැටියට සිටිද්දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ—

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
යූ. ඇන්. පී. ආණ්ඩුවෙන් දුන්නෙත් නැහැ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
1956 ට පෙර ඉල්ලුවා, ලැබුනෙ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවෙන් ඉල්ලුවා; ලැබුනෙ නැහැ. එතුමත් සම්බන්ධ වී සිටි සභාග ආණ්ඩුවෙන් ඉල්ලුවා; ලැබුනෙත් නැහැ. නමුත් අපට පුළුවන් වුනා ඒ තිස් ලක්ෂය දෙන්න.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
අපි මහනුවරට දුන්නා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
ඔව්; මහනුවරට දෙන්න ඇත්තේ කොලොන්නාවේ මන්ත්‍රීතුමත් ඒ කාලයේ ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙක් නිසා වෙන්න ඇති. අපි කොළඹ නගර සභාවට ඒ මුදල දුන්නා පමණක් නොවෙයි, රුපියල් සියයට අඩුවෙන් කුලී ගෙවන ගෙවල්වල පදිංචි උදවියටත් සහනයක් ලබා දුන්නා. 1962 සිට මෙම පනත ඉදිරිපත් කරන අවස්ථාව වන තුරු 21,000ක් පමණ ගෙවල් කුලී ගෙවන අයට දෙව්ට බහින්න වෙලා තිබුණ. [බාධාකිරීම්] සුප්‍රීම් උසාවියට ගියා. මේ පනත වැරදිය කියා යම් යම් අය කරුණු කීව. නමුත් සුප්‍රිම් උසාවිය තීන්දු කළා පනත නීත්‍යනුකූලය කියා. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා මතක් කර තිබෙනව සම් මත වෙච්ච පනත සුප්‍රිම් උසාවියෙදි විසි වෙන්න යනව වාගෙ පේනවිය කියා. නමුත් වාසනාවකට වාගෙ ඒ සහනය ලබා දෙන්ට පුළුවන් වුණා. රජය කල්පනා කරනව මේ වර්ගික බදු ක්‍රමය ඉතාම අවශ්‍ය දෙයක් හැටියට. එම නිසා මා මේ සභාව ඉදිරියෙහි ප්‍රකාශ කරන්ට සතුටුයි යම් යම් අවස්ථා පසු කර කැබිනට් මණ්ඩලයෙ අනුමතියක් ලබාගෙන පුළුවන් තරම් ඉක්මණින් ඊට නියමිත පනත මෙම සභාවට ඉදිරිපත් කරන්ට බලාපොරොත්තු වන බව.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මාස ගණනක් බැහැ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) සිටි ආණ්ඩුවට අවුරුදු නවයකින් කරන්ටත් බැරි වුණා. නමුත් අපෙන් අහනව එහෙම. [බාධාකිරීම්] මගේ අතේ එය තියෙනව. ඒ මන්ත්‍රීතුමා උදව් කර තිබෙන බව පේනව. එතුමට බොහොම ස්තුති කරනව. යම් යම් අවස්ථාවලදී අපි එතුමගෙන් තවත් උදව් බලාපොරොත්තු වෙනව. අපි මේ කටයුතු පුළුවන් තරම් ඉක්මණින් කරන්ට බලාපොරොත්තු වෙනව. එම නිසා මේ පනත අවශ්‍ය නැතෙයි කියා තර්ක කිරීම වැරදියි. සමහරු කීව මෙම පනත උඩ යම් යම් නගර සභාපතිවරුන්ට එහෙම පළිගැනීමේ චේතනාවන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උඩ නොයෙකුත් අන්දමේ පියවර ගන්ට ඉඩ තිබෙනවය කියා. ඒවා කරන්ට පුළුවනි. දැනට තිබෙන විවිධ පළාත් පාලන ආයතනවල බල පවත්නා යම් යම් බලතල අනුව වුවත් සභාපතිවරුන්ට එසේ කරන්ට පුළුවන්කම තියෙනව. නගර සභාවලට, සුළු නගර සභාවලට, පළාත් ආණ්ඩු සභාවලට සහ ගම් සභාවලට එහෙම දැනටත් පුළුවනි, අයුතු ලෙස බලය යොදන්ට. යම් යම් ආණ්ඩුවලට මේ රටේ නගර සභා කීපයක් විසුරුවා හරින්ට සිදු වුණා නම්, ඒවයෙ සභාපතිවරුන් ඉවත් කරන්ට සිදු වුණා නම්, එසේ සිදු වුණේ ඒ අන්දමේ වැරදි ක්‍රියා කළ නිසයි. මෙම පනත යටතෙ සිදු වන්නෙ දැනට පළාත් ආණ්ඩු සභා පනතට පමණක් දී ඇති යම් අයිතිවාසිකමක් මහ නගර සභා සහ සුළු නගර සභාවලටත් දෙන්ට, එනම්, ප්‍රදේශ වශයෙන් වෙනස් බදු ක්‍රමයක් දෙන්ට නියම කිරීමයි.

පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) මේ අවශ්‍යතාව ඔප්පු වෙන ප්‍රකාශයක් කළා. එතුම කීව, මේක ක්‍රියාත්මක කරන විට වැඩි වශයෙන්ම අළුතින් යම් යම් පළාත් පාලන ආයතනවලට ආදාගන්න කොටස් වෙනුවෙන් මෙය පාවිච්චි කරන්න පුළුවන්ය කියා. එය සම්පූර්ණ ඇත්ත. හුඟක් දුරට මේ අවශ්‍යතාව ඇති වී තිබෙන්නෙ එම නිසයි. වෙළඳ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා කීව, බදුල්ල මහ නගර සභාව ඇති කරන විට සමහර ගම්සභා කොටස් ගන්ට සිදු වුණාය කියා. ඒ ගම්සභා කොටස්වලටත් අර දියුණු ප්‍රදේශයෙම බදු ක්‍රමයක් ඇති කිරීම අසාධාරණයි. [බාධා කිරීමක්] නමුත් මහ නගර සභා පනතින් එම පුළුවන්කම ඇති කර නැති නිසා එය කරන්ට පුළුවන්කමක් නැහැ.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කීව, පසුගිය ආණ්ඩුව බොහොම හිතුවක්කාර ලෙස කිසිම වගක් පලක් නැතුව පළාත් පාලන ආයතන උසස් කළාය කියා. ඒවයෙ සීමාවල් කැඩුව. යටියන්තොට ප්‍රදේශය සුළු නගර සභාවක් ඇති කරන්ට හැකි ප්‍රදේශයක් නොවන බව අපි දන්නව. එහෙ ප්‍රධාන මාර්ගයකට තියෙන්නෙ ශිනිගත්හේන මාර්ගය පමණයි. එවැනි ප්‍රදේශයක සුළු නගර සභාවක් පිහිටවූ විට නියම පහසුකම් දෙන්ට පුළුවන් කමක් නැහැ. ඒ ප්‍රදේශයෙ භූමිය සකස් වී තිබෙන ආකාරයට එය කරන්ට අමාරුයි. පහසුකම් දෙන්ට බැරිකම් රාශියක් තිබෙනව. එසේ තිබියදි යටියන්තොට සුළු නගර සභාවය කියා සුළු නගර සභාවක් ඇති කළාම බලවත් අමාරු තත්ත්වයකට මුහුණ දෙන්ට සිදු වෙනව. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කථා කරන විට මේ කාරණා ගැන මොකුත් නොදන්නා බවක් ඇඟෙව්වා. ඇත්තෙන්ම මෙම පනත මෙසේ ඉදිරිපත් කරන්නට සිදු වුණේ පසුගිය රජය පළාත් පාලන ආයතන උසස් කිරීම සම්බන්ධයෙන් කිසිම ප්‍රතිපත්තියක් නැතිව ක්‍රියා කිරීමේ ප්‍රශ්නයට මුහුණ දිය යුතු නිසයි.

සමහර වාර්තා කියවා බලන විට භූමි ප්‍රමාණය ගැනද ජනගහණයේ තරම ගැන ද සලකන්නේ නැතිව, දියුණු නොදියුණු තත්ත්වය ගැන මෙන්ම සවාභාවික මායිම් ගැන ද සලකන්නේ නැතිව පාසල් යන ළමයින් සිතියම් ගෙන ඒවායේ ඉරි ගසා යම් යම් කොටස් වෙන් කරන්නා සේ සමහර පළාත් පාලන ආයතන ඇති කොට තිබෙන බව පෙනී යනවා. වරදක් සිදු වී ඇත්නම් එය නිදෙස් කළ යුතු බව කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) ප්‍රකාශ කළා. ඔව්, ඒ වරද වහාම වෙනස් කළ යුතු බව අප පිළිගන්නවා. නමුත් වෙනස්කම ඇති කරන්නට යන වේලාවේදී ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්නටද සිදු වන බව අප කල්පනාවට ගත යුතුයි. සමහර ගම්කාර්ය සභා ප්‍රදේශ පවා මහ නගර සභාවලට ඈදා තිබෙනවා. මේවා නැවත සකස් කරන්නට යන විට රට මුළුල්ලේම ඇති තත්ත්වය ගැන සැලකිල්ල දක්වා රට පුරාම පොදු ක්‍රියා මාර්ගයක් ඇති කළ යුතුයි. එසේ නැතිව තැනින් තැන පමණක් එකින් එක වෙනස් කරන්නට ගියහොත් ලොකු අවුල් ජාලයක් ඇති වෙනවාට සැකයක් නැහැ.

පළාත් පාලන ආයතනවලට ආධාර දීමේ ප්‍රශ්නයද මේ කාරණයටම සම්බන්ධයි. පළාත් පාලන අමාත්‍යාංශය යටතේ හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ හෝ කිසියම් සාකච්ඡාවක් ඇති වන හැම අවස්ථාවකදීම වාගේ පළාත් පාලන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

ආයතනවලට ආධාර දීම පිළිබඳවද කියැවී තිබෙනවා. හැම කාර්යයක්ම සම්බන්ධයෙන් අද ඇත්තේ එක ප්‍රමාණයක ආධාර ක්‍රමයකුයි. කුමන රජයක් බලයට පැමිණියත් පළාත් පාලන ආයතනවලට ඒ රජය දෙස බලාගෙන සිටින්නට සිදු වන බව දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මයා.) සඳහන් කළා. පාරක් තොටක්, වෙළෙඳ පොළක් සම්බන්ධයෙන් හෝ වේවා, විදුලිය පහසුකම් නැත්නම් ජල පහසුකම් සම්බන්ධයෙන් හෝ වේවා, වෙනත් කාරණයක් සම්බන්ධයෙන් හෝ වේවා කිසියම් වැඩ පිළිවෙලක් ඇති කිරීම පිණිස ආණ්ඩුවේ "ග්‍රාන්ට්" එක ලැබෙන තෙක් බලාගෙන ඉන්නට සිදු වී ඇති බව ඒ ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා. දැනට පළාත් පාලන දෙපාර්තමේන්තුව ගම්කාර්ය සභා ආදියට ආධාර දෙන්නේ සථාවර ක්‍රමයකටයි. පාරවල් සම්බන්ධයෙන් ආධාර දෙනවා නම් හැම ගම්කාර්ය සභාවකටම එක සමාන ගණනක ආධාරයක් දෙනවා. මෙය සාධාරණ නැහැ. ඒ ආධාර ක්‍රමයේ අඩු වැඩි බවක් තිබෙන්නට ඕනෑ. ඒ ඒ ප්‍රදේශයේ ජනගහණය අනුව, ඒ ඒ පළාත් පාලන ආයතනයට ලැබෙන ආදායම අනුව දෙන ආධාර ක්‍රමයත් අඩු වැඩි වන්නට ඕනෑ. විශාල ආදායම් ලැබෙන පළාත් පාලන ආයතනයටත් අඩු ආදායම් ලැබෙන පළාත් පාලන ආයතනයටත් අද ලැබෙන්නේ එක තරමේ ආධාරයකුයි. මෙය සම්පූර්ණයෙන්ම අසාධාරණයි. එසේ වුවද ජනගහණය හා ආදායම අනුව සලකා අලුතින් ආධාර දෙන්නට යන විට ඒ ඒ කොටස්වලට වාසි වන විධියට වැඩ කළා යයි චෝදනා එල්ල වන්නට ඉඩ තිබෙනවා. එසේ හෙයින් මගේ පෞද්ගලික කල්පනාව අනුව ගරු ඇමතිතුමාට දන්වා තිබෙන්නේ හැකි නම් මේ ගරු සභාවේ දෙපාර්ශ්වයේ සිටින ගරු මන්ත්‍රීවරුන්ගෙන් සෑදුම් ලත් විශේෂ කාරක සභාවක් මඟින් පළාත් පාලන ආයතනවලට මුහුණ දෙන්නට සිදු වී ඇති පළාත් පාලන ක්‍රමයේ සංවර්ධනයට අවශ්‍ය ප්‍රධාන ප්‍රශ්න කීපයකට පිළිතුරු සපයා නිර්දේශ කිරීමට ඉඩ සැලසිය යුතු බවයි. මගේ කල්පනාව නම් මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ කාරක සභාවකට තරම් හොඳට ඒ කරුණු පිළිබඳව නිසි පරිදි සොයා බලා උපදෙස් දෙන්නට වෙන පිරිසකට අපහසු බවයි. ඊට වඩා සුදුසුකම් ඇති පිරිසක් තවත් නැහැ. ගරු මන්ත්‍රීවරුන්ට පළපුරුද්දක් තිබෙනවා. අත්දැකීමක් තිබෙනවා. ඒ වගේම ගරු මන්ත්‍රීවරුන්ගේ විශේෂ කාරක සභා මඟින් ඉදිරිපත් කරන ලද වැඩ පිළිවෙළවල් බොහොමයක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන්නට පුළුවන් වී තිබෙනවා. මම එක නිදර්ශනයක් කියන්නම්. ඒ මැතිවරණ නීති සංශෝධනය කිරීමයි. එය කොමිෂන් සභාවකට දුන්නා නම් ගිය වර කෙරුණු ප්‍රමාණයවත් මේ දක්වාත් කෙරෙන්නෙ නැහැ. හේතුව මේකයි: මෙ වැනි කරුණුවලදී කාරක සභාවක් හැටියට වාඩි වී කටයුතු කිරීමේ යුතුකමක් මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට තිබෙනව. කරුණු ගැන දන්නව; අත්දැකීම් තිබෙනව. එමෙන්ම මෙය එක පක්ෂයකට හෝ දෙකකට අයිති ප්‍රශ්නයක් නොවෙයි. රටේ පළාත් පාලන සංවර්ධනය යන්න රටේ ජාතික ප්‍රශ්නයක්.

අපේ සංවර්ධනය ඒ ඒ නගරවලට පමණක් සීමා කළොත් මේ රට උසස් තත්ත්වයකට පත් කර ගන්නට අපට බැරි වේවි. මේ සංවර්ධනය රට පුරාම ඇති වන්නට ඕනෑ. අද ගම්බද ප්‍රදේශවලට ආදායම් මාර්ග අඩු වී තිබෙනවා නම් එයට හේතුව මොකක් ද? දියුණු වෙනවාය කියන නගර කරා අද මහජනයා සංක්‍රමණය වෙනව. ව්‍යාපාරිකයන් පැමිණ ව්‍යාපාර පටන් ගන්නේ දියුණු වෙනවාය කියන නගරවලයි. ජල පහසුව නැත්නම්, විදුලි බල පහසුව නැත්නම්, මාර්ග පහසුව නැත්නම් ව්‍යාපාර ආරම්භ කරන්නේ කොහොමද? කර්මාන්ත ආරම්භ කරන්නේ කොහොමද? ඒ ප්‍රදේශ සංවර්ධනය වන්නේ ඒවා ආරම්භ වුණොත් පමණයි. කර්මාන්ත ව්‍යාපාර ආරම්භ වුණොත් ආදායම් මාර්ගත් වැඩි වෙනව; සංවර්ධනයත් ඇති වෙනව. දියුණුවක් ඇති වන්නේ එවිටයි. අද කඩතොළු වශයෙන් අපි යම් යම් දේවල් ඇති කරනවා නොවෙයි. ඒවායේ පදනම අර සාමූහික පොදු සංවර්ධනයක් ඇති කිරීමයි. ගල් ඔය ප්‍රදේශය වැනි කිහිපයක් හැරෙන්නට මුළු රටම වැළඳගෙන තිබෙන පළාත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාලන සභාවල සංවර්ධනය පිණිසයි, අපි ඒවා කරන්නෙ. ඒ නිසා අපි දෙපක්ෂයේම ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් විශේෂ කාරක සභාවක් පත් කර මෙන්න මේ කරුණු ගැන සලකා බැලීම ඒ කාරක සභාවට බාරදිය යුතුය කියන එක මා තරයේ විශ්වාස කරන දෙයක්.

මොනවද ඒ කරුණු? පළමුවැනි කරුණ මේකයි: නැවත වරක් රටපුරාම තිබෙන පළාත් පාලන ආයතනවල සීමාවන් ගැන කල්පනා කර යම් යම් කොටස්වල පළාත් පාලන ආයතන වර්ග කිරීමයි. ඒ සඳහා නොයෙක් අංශවලින් උපදෙස් ලබා ගැනීම අවශ්‍ය වේවි. ඒවාත් ලබාගෙන නොයෙක් පළාත් පාලන ආයතනවල අදහසුත් ලබාගෙන අලුත් නීති අවශ්‍ය නම් ඒ නීතිත් ඇති කරගෙන ඒ කට යුත්ත කරන්නට ඕනෑ. එසේ වර්ග කර ඒ ප්‍රදේශ ගැන යම් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීම ප්‍රධාන කරුණයි. දෙවැනි කරුණ නම් පළාත් පාලන ආයතනවලට රජයෙන් ආධාර දීමේදී අනුගමනය කළ යුතු පිළිවෙතත් ඊට අවශ්‍ය ප්‍රතිපත්තිත් ඒ කාරක සභාව මගින් සකස් කිරීමයි.

ඔන්න ඔය විධියේ කරුණු ගැන විශේෂ කාරක සභාවක් මගින් අප දෙගොල්ලම එක් වී යම් වැඩ පිළිවෙළක් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට අපට පුළුවන් වුණොත්, එය මේ ගරු සභාව පිළිගත්තාට පසුව, බොහොම ලෙහෙසියෙන් මතභේද හා විවාද අඩු කරගෙන දේශපාලන කොටුවීම්වලින් තොරව අපට අවශ්‍ය නීති රීති සංශෝධනය කර ගැනීමට පුළුවන් වේවි. මා මේ අදහස මේ අවස්ථාවේදී දෙපක්ෂයේම සැලකිල්ලට භාජන කිරීමට කැමතියි. මෙය පළාත් පාලනයේ සංවර්ධනය පිණිස ඉතාම අවශ්‍ය දෙයක්. මෙය ජාතික ප්‍රශ්නයක්. මෙය එක පක්ෂයකට හෝ එක ආණ්ඩුවකට අයිති දෙයක් නොවෙයි. මෙය සම්පූර්ණයෙන්ම පොදු ප්‍රශ්නයක්. එසේ නො වුණොත් හැමදාමත් මේ ගැන පැමිණිලි කර කර ඉන්ට අපට සිදු වෙනවා මිස මේ ප්‍රශ්නයට නියම පිළිතුරක් දෙන්නට අපට බැරි වේවි.

මේ ගරු සභාවේ කථා කළ මන්ත්‍රීවරුන් කීප පොලක්ම ඒ ඒ ප්‍රදේශ ගැන සඳහන් කරන්න යෙදුණා. කෙහෙල්වත්ත සුළු නගර සභාව ගැන පානදුරේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. ඒ ඉල්ලා සිටි ලිපිකරුවන් දෙදෙනාගෙන් එක් කෙනෙක් සති දෙකකට පමණ පෙර එම සේවයට පත් කර සිටින බව එතුමාට මතක් කරන්නට කැමතියි. පළාත් පාලන ආයතන විසින් ඉල්ලා සිටින සේවකයින් ඒ ඒ ආයතනවලට දීම අප නියම කර තිබෙන්නෙ පළාත් පාලන සේවා කොමිෂන් සභාවටයි. එහෙත්, සේවකයන් දීමේදී ඒ දෙන ප්‍රමාණයට සෑහෙන වැඩ කටයුතුත් පළාත් පාලන ආයතනවල තිබෙනවද යන කාරණය කල්පනාවට ගැනීම පළාත් පාලන සේවා කොමිෂන් සභාවෙ යුතුකමක් බව ගරු මන්ත්‍රීවරුන් පිළිගන්නව ඇති. කෙසෙල්වත්තෙ සුළු නගර සභාව විසින් ඉල්ලා සිටින ලද ලිපිකරුවන් දෙදෙනාගෙන් එක් කෙනකු දනට සති දෙකකට පෙර පත් කළ බව නැවතත් පෙන්වා දෙන්න කැමතියි.

කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමත් (ඉලංගරත්න මයා.) ප්‍රකාශ වූ අදහස් ඉදිරිපත් කළා. ඒ ගැන මම සොයා බලනව. එහෙත් පාසල් පොත් ප්‍රශ්නය සම්බන්ධයෙන් මට ලැබී තිබෙන තොරතුරු මෙසේයි: පාසල් පොත් සඳහා ආධාර වශයෙන්, පළාත් ආණ්ඩු සභාවට දෙන්නට පුළුවන් ප්‍රමාණයට වඩා වැඩි මුදලක් අවශ්‍ය වුණොත් ඒ සඳහා ඇමතිතුමාගෙ අවසරය ලබා ගන්නට පළාත් ආණ්ඩු සභාවට සිදුවෙනව. ආණ්ඩුවෙන් ඊට ආධාර මුදලක් දෙන්නෙ නෑ. ගරු මන්ත්‍රීතුමාම කියන හැටියට, මේ අවසරය දී තිබෙන්නෙ 1966 දෙසැම්බර් මාසයෙදියි. දෙන්න පුළුවන් ප්‍රමාණයට වඩා වැඩි මුදලක් වැය කිරීම සඳහායි ඒ. එසේ නැතිව ආධාර මුදල් දීමේ ක්‍රමයක් නැහැ.

මාතර නගර සභාවේ ගෙවල් වගයක් බෙදා දීම සම්බන්ධයෙන් මාතර ගරු මන්ත්‍රීතුමා (බී. වයි. තුඩාවෙ මයා.) කරුණු ඉදිරිපත් කළා. එතුමා කී විධියටම ඒ ගෙවල් බෙදීම සිදු වුණාද යන්න ගැන මා ඒ අවස්ථාවෙදි පුදුමයට පත් වුණා. නගර සභිකයින් 11 දෙනෙක් ගෙවල් 11 ක් බෙදාගෙන ඊට පසු ඒවා ඒ නගර සභිකයින්ට ඕනෑකරන පිරිසකට බෙදා දුන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]
නම් එය සම්පූර්ණයෙන්ම වැරදි වැඩ පිළිවෙළක්. ඒ කෙසේ වෙතත්, ඒ ගැන පරීක්ෂා කර බලන්නට මා මේ අවස්ථාවෙදි පොරොන්දු වෙනව.

මාතර නගරයට පුරහලක අවශ්‍යතාව ඊළඟට එතුමාගෙ කථාවෙදි පෙන්වා දෙන්නට යෙදුණා. මේ ගැන මාතර පළාත් ආණ්ඩු සභාව උනන්දු වී රජයෙන් යම් ආධාරයක් ඉල්ලුවොත් ඒ අනුව ක්‍රියා කරන්නට අපි බලාපොරොත්තු වෙනව. මේ කෙටුම්පත් පනතෙන් අප බලාපොරොත්තු වන්නෙ, ප්‍රදේශ අනුව වෙනස් බදු ක්‍රම පනවන්නට දැනට පළාත් ආණ්ඩු සභා පනත අනුව තිබෙන පුළුවන්කම, මහ නගර සභා පනතටත් සුළු නගරසභා පනතටත් ඇතුළත් කිරීම පමණයි. ඒ අනුව, විශේෂයෙන්ම අලුතෙන් ඇදෙන කොටස් සම්බන්ධයෙන් යම් වෙනස් බදු ක්‍රමයක් ප්‍රදේශ වශයෙන් ඇති කරන්නට මේ පනතෙන් පුළුවන්කම ලැබෙනව. ඒ හැර, ඒ ඒ ස්ථාන සම්බන්ධයෙන් වර්ගීක බදු ක්‍රමයක් පැනවීමට පුළුවන් වන විධියේ නීති සම්පාදනය කරන්නට රජය බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින් මේ පනත පිළිගන්නා ලෙස ඉල්ලා සිටිනව.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**කෙටුම්පත් පණත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.**

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, மசோதா இரண்டாம் முறையாக மதிப்பிடப்பெற்றது.

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

**මතු පළ වන යෝජනාව සභාසම්මත විය.**

" කෙටුම්පත් පණත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවට පැවරිය යුතුය. "—[ප්‍රේමදාස මයා.]

பின்வரும் பிரேரணை ஏற்றுக் கொள்ளப்பட்டது.

" மசோதா முழுச்சபைக் குழுவுக்குச் சாட்டப்படுமாக ".—[திரு. பிரேமதாச].

*Resolved* :

" That the Bill be referred to a Committee of the Whole House. "—[*Mr. Premadasa*].

**කාරක සභාවෙහිදී සලකා බලන ලදී.**

**[කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.]**

முழுச் சபைக் குழுவில் ஆராயப் பெற்றது.
[குழுக்களின் உப அக்கிராசனர் தலைமை தாங்கினார்].

*Considered in Committee.*

[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.*]

**1 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

1 ஆம் வாசகம் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

*Clause 1 ordered to stand part of the Bill.*

CLAUSE 2.—(*Amendment of section 230 of Chapter* 252).

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்சா)*
(Mr. Bernard Soysa)

I have an amendment to Clause 2. I move,

" In page 1, after line 19, to add :

'Provided that in every instance in which a Municipal Council in the exercise of the power conferred by this sub-section makes a rate for any area which is lower than the rate made for any other area within the Municipality, it shall be the duty of the Council with the least possible delay to provide for such area that service or services the non-provision of which is the reason for the lower rate'. "

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

It comes to the same thing.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

Where you fix the lower rate for a particular area because certain services are not provided, it shall be the duty of the Municipal Council to provide those services for that area.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

You say, " it shall be the duty ", but you do not mention any specific feature.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்஼ா)
(Mr. Bernard Soysa)

How can we mention it ? That is a matter for the Council. All we can do is to point out to the Council that there is an obligation to liquidate the difference that exists. That is why I want this proviso included.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Prior to this, every time you came before this House and wanted a differential rate we asked the question, " When are you going to bring the Kirillapone area up to scratch ? " Therefore there was an obligation on your part to prove to our satisfaction that efforts were being made to bring it up to standard. Now, what is going to happen if you do not make provision for it ?

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

Surely the hon. Member will concede that the Colombo Municipal Council is doing its best to bring the Kirillapone Ward up to standard.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Agreed. I am not denying that. All that I am saying is, we must have a provision which makes it obligatory on them not merely to continue with the differential rates but also to raise the ward as fast as possible to the same level as the other wards.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

I agree.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

All right, we will accept the amendment.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

But there is one difficulty. This Bill has come from the Senate. If it is amended, we will have to send it back to the Senate and it will have to come here once again.

Let us take the case of the Kirillapona Ward. The Colombo Municipal Council has made an honest attempt to bring it to standard. The hon. Member will concede that fact.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்஼ா)
(Mr. Bernard Soysa)

I am not disputing anybody's honesty. The hon. Parliamentary Secretary must admit—and I think my Colleague from Colombo South will also agree—that the Kirillapone Ward was taken over in 1950 and that elections were held in 1951. It is now sixteen years since then, but there are areas which are unsewered, areas which have no water mains provided—

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

That is being done.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்஼ா)
(Mr. Bernard Soysa)

—and there are some areas in which the existing scavenging services are not properly operated.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

Those are simple administrative matters. The hon. Member is so influential that he can get these things done.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is not the point.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

You are speaking of certain services like scavenging.

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

Let us take drainage and water service.

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

Of course they have water service.

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

There are certin areas which have not got water service.

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

I think the hon. Member will agree with me.

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I understand the difficulty of the hon. Parliamentary Secretary is that this Bill came from the Senate. That is a difficulty which I appreciate.

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

I want to tell you another thing. The postponement of elections to the Batticaloa Municipal Council is also due to this fact: certain village council areas have been brought within this new demarcation. There is much opposition there against the constitution of a municipal council because they are quite rightly under the impression that the municipal council cannot levy differential rates.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

When is the Senate meeting again ?

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

I do not know.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

All that you have to see is that the amendment is passed.

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

Even then you have to come before this House again.

බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

You are reversing the slogan and saying " No representation without taxation. "

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

This applies to the town councils also ?

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

I can give an assurance that we will see to it that they will make an honest attempt to provide these amenities.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Our difficulty is this: so far as the Municipal Council of Colombo is concerned there is a certain amount of publicity given because it is the premier local authority in the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Island. Where town councils are concerned they will ignore these other provisions. They will say, "We are not providing these services; we are only charging rates," and go on like that. That is what we want to avoid.

The whole idea of bringing in new areas is to see that they are developed to the level of others. In point of fact, I am much more concerned about this amendment going into the other portion dealing with town councils rather than to the portion dealing with municipal councils. That is the important point.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

We will take note of that.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I have no objection to the Bill being passed as it is if you really think that it is very urgent. But I think that some sort of safety valve like this is necessary in order to make local authorities realize their obligations.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

I have no objection to accepting the amendment, but the difficulty of coming before this House again is there.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

You can pass the Bill in one Sitting in the Senate.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

There is an amendment to the next sub-clause.

කාරකසභා නියෝජ්‍ය සභාපති
(குழுக்களின் உப அக்கிராசனர்)
(The Deputy-Chairman of Committees)

We have not finished with Clause 2 still.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

In the next sub-clause there is a very pernicious aspect which I want to remove. We have not yet come to Clause 3, but if you would not mind it I would like to advise the hon. Parliamentary Secretary to refer to Clause 3. It refers to "different immovable properties" which means for instance that assessment number 136 can have one rate and assessment number 138 which is next door can have another rate. That is what it means.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

Will you read that?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Clause 3 (1A) says:

"The Town Council of a town may, in pursuance of its powers under sub-section (1), impose and levy different rates for different immovable property . . ."

What it means is that you can levy different rates on different immovable properties—assesment number 136 can have one rate and 138 which is next door can have another rate. That there are different species of immovable property I can understand. Now, there are commercial premises in one way and residential premises in another way. That I can understand. That is an accepted principle. How can two buildings adjoining each other have one rate for one building and another rate for the other building? For what conceivable reason, I just cannot under-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

stand, unless of course you say that you relate it to the assessed annual value. If you relate it to the assessed annual value which is based on a graded system or relate it to the income of a person, I can understand that. Here no principle is given. You are just arbitrarily fixing one rate for one building and another rate for the next building. I am only asking the hon. Parliamentary Secretary to delete that portion. It is unnecessary. Species, yes; different rates for different species of immovable property, I can understand.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

There again this difficulty arises. I can agree to your amendment—

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Precisely!

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

I do not think that it can be interpreted in that way.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

It can be; in all honesty I am telling you that.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

Unless there is justification you cannot do that.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

You do not need to have a justification for that. This is purely a subjective matter.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

You are dealing with town councils.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Some of them are thoroughly irresponsible people. I am not saying that about all of them, but some of them are. This is a dangerous clause.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

I can give you this assurance. They will have to obtain the approval of the Minister. At the end of the same clause you will find:

"..subject to all the limitations, qualifications and conditions referred to in that sub-section, and also to the approval of the Minister."

You can rest assured that we will see to it that this will not be enforced in such a way.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What guarantee is there that the Minister will continue for all time?

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

The hon. Parliamentary Secretary will continue.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

For all time?

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

We know that you joined the S. L. F. P.! We have this practical difficulty of having to come before this House.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy-Chairman of Committees)

Are you pressing the amendment?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

No. I have stated my case.

2 වන වගන්තිය කෙටුම්පත් පනතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

2 ஆம் வாசகம் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

*Clause 2 ordered to stand part of the Bill.*

3 වන වගන්තිය කෙටුම්පත් පනතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය කෙටුම්පත් පනතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

කෙටුම්පත් පණත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.

3 ஆம் வாசகம் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

சட்டமாகு வாசகமும் தலைப்பும் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

மசோதா திருத்தமின்றி ஏற்றுக் கொள்ளப்பட்டதாக அறிவிக்கப்பட்டது.

*Clause 3 ordered to stand part of the Bill.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported without Amendment.*

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

I move,

"That the Bill be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව තුන්වනවර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, மசோதா மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப் பெற்றது.

*Question put, and agreed to.*

*Bill accordingly read the Third time, and passed.*

## රක්ෂණ පාලන (සංශෝධන) පණත් කෙටුම්පත

### *காப்புறுதிக் கட்டுப்பாடு (திருத்த) மசோதா*

## CONTROL OF INSURANCE (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.

*இரண்டாம் பதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I move,

"That the Bill be now read a Second time."

The Parliamentary Secretary to the Minister of Commerce and Trade will explain the Bill.

ප. භා. 6.19

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

This Act vests the supervision of life insurance companies in the Director of Commerce. Even though life insurance business has been nationalized, life insurance companies can continue to do whatever business they had earlier. Twelve such companies have been badly mismanaged. In such cases, the Controller either appoints an administrator or applies for winding them up.

Section 79 of the Act vests the Controller with the power to sequester the properties of directors or other officials who have mismanaged such companies if the administrator so reports. The Attorney-General has held that this is a judicial function which must properly be exercised by the courts. An amendment is, therefore, being introduced that, wherever the Controller is satisfied that there has been wilful and *mala fide* mismanagement, he should make his application to the court for the seizure of the properties of the directors and officials responsible for the mismanagement. There have been several cases which have come to the knowledge of the Controller where the management of insurance companies had collected

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඒ. පීරිස් මයා.]

policy moneys and then used them for their own purposes. There is no way of restricting or controlling such abuses under the present Act. The amendment is necessary so that the Controller may make an application to court and get a court order for the payment of compensation or the restoration of the property. It is for that purpose that this amending Bill has become necessary. There have been several complaints, and the Minister has not been able to help any of the people who have made these complaints. This amending Bill really seeks to help life policy holders.

අ. භා. 6.23

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සංශෝධන අනපනත් සම්බන්ධව වචන සවල්පයක් කථා කරන්ට මා බලාපොරොත්තු වෙනව. වෙළඳ කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ප්‍රකාශ කළ පරිදි, එක්තරා අන්දමකින් මෙය වැදගත් සංශෝධන කීපයක් අඩංගුව තිබෙන පනතක්. නමුත් ඒ හැමෙකක්ම අපට පිළිගන්ට බැහැ. එකක් දෙකක් පිළිගන්ට පුළුවන්. විශේෂයෙන් මුල් පනතෙ 46 වෙනි වගන්තියෙ (අ) කොටසත් 77 වෙනි වගන්තියෙ (අ) කොටසත් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන සංශෝධන අපට පිළිගන්ට පුළුවනි. අනික් ඒවා පිළිගන්ට අපට බැරි මන්ද යන්න අදහස් ප්‍රකාශ කරමින් ඔප්පු කරන්ට බලාපොරොත්තු වෙනව.

ඔබතුමා දන්නවා අපි රක්ෂණ පාලන අණපනත් ඇති කළේ 1962 දී බව. 1962දී ඒ ආඥ පනත් ඇති කරන්නට හේතු වූ පසුබිම ගැන ටිකක් මතක් කළ යුතුව තිබෙනව. මම කම්කරු ඇමති අංශයේ සිටින කාලයේ රක්ෂණ ව්‍යාපාරයේ යෙදී සිටි සේවකයින් රෑ දවල් බලන්නෙ නැතිව ශ්‍රාවස්තියට මා හමු වන්ට ඇවිත් මට නිතර නිතර කරදර කළා, රක්ෂණ ව්‍යාපාරයේ යෙදී සිටින සේවකයින්ට කිසිම ආවර්ණයක් නැත කියා. ඒ දුක්ගැනවිලිවලට ආරක්ෂාවක් වශයෙන් අපට කරන්ට පුළුවන්කම තිබුණෙ කම්කරු ඇමති අංශයෙන් සුළු සුළු සංශෝධනා මගින් යම් යම් සහන සැලසීම පමණයි. එහෙත්, වෘත්තීය සංගම්වලට බැදෙන්ට පමණවත් ඒ සේවකයන්ට අවකාශ තිබුණෙ නැහැ. ඒ කාලයේ හිටපු රක්ෂණ ව්‍යාපාරිකයන්—විශේෂයෙන් විදේශීන්—ඒ අය රක්ෂාවලට ඇතුළත් වීමේදී කොන්දේසි ඇති කළා, වෘත්තීය සංගම්වලට බදෙන්ට බැරි හැටියට. ඒ විධියේ අවදානම් තත්ත්වයක් ඒ සේවකයන්ට තිබුණා. ඒ අතරම මුදල් ගෙවා රක්ෂණ ඔප්පු ලබාගත් උදවියගෙනුත් අපට නොයෙක් පැමිණිලි ලැබෙන්ට වුණා, ඔවුන්ට මුහුණ පාන්ට සිදු වී තිබෙන අමාරුකම් ගැන කියා. මේ ප්‍රශ්න නිසයි, වෙළඳ ඇමතිකම අපට ලැබුණු වහාම මේ සම්බන්ධව යුහුසුළු වී ආඥපනතක් අපි ඇති කළේ.

රක්ෂණ පනත ඉදිරිපත් කිරීමේ පරමාර්ථ කීපයක් මතක් කරන්ට කැමතියි: රක්ෂණ ව්‍යාපාරයට ධෛර්‍යය දීම; රක්ෂණ කටයුතුවල දූෂණ නැති කිරීම; රක්ෂණ ව්‍යාපාරවල නියම ප්‍රයෝජන මහජනතාවට ලබා දීම; රක්ෂණ ව්‍යාපාරවල සේවකයන්ට රක්ෂා ආරක්ෂාව ලබා දීම; රක්ෂණ ව්‍යාපාර ජාතික සංවර්ධන ව්‍යාපාරවල අංශයක් කර ගැනීම. මේවා තමයි ප්‍රධාන වශයෙන් අපි පරමාර්ථ කර ගත්තෙ. මේ පරමාර්ථ ඇතිව ඉදිරිපත් කළ ඒ ආඥපනත බොහොම කාලයක් ක්‍රියාවෙ යෙදුණා. එසේ ක්‍රියාත්මක වීමෙන් පසු, 1967 ජනවාරි මාසයේ නිකුත් වූ 1964-65 වර්ෂයේ වාණිජ අධ්‍යක්ෂවරයාගේ පාලන වාර්තාවෙන් අපට මේ සංශෝධන අනපනතේ පිටුතලය බලා ගන්ට පුළුවන්. මොකක්ද ඒ පිටුතලය? වාණිජ අධ්‍යක්ෂවරයාගේ වාර්තාවේ 42 වෙනි පිටුවේ 107 වෙනි ශීර්ෂයේ මේ අන්දමට සඳහන් කර තිබෙනව:

"1962 අංක 25 දරණ රක්ෂණ පාලන පනත ක්‍රියාත්මක වූයේ 1962.11.1 වැනි දින දීය. ඒ පනතේ පරමාර්ථය වූයේ රක්ෂණ ව්‍යාපාර ක්‍රමවත් කිරීම හා පරිපාලනය කිරීමයි. 1963 අංක 11 දරණ මුදල් පනතේ 50 වැනි වගන්තියෙන් සියළුම වර්ගවල රක්ෂණ ව්‍යාපාර පිළිබඳ අළුත් සහතික නිකුත් කිරීමේ බලය 1964.1.1 සිට ක්‍රියාත්මකව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත පැවරුණි. එදින සිට රක්ෂණ පාලන පනත ක්‍රියාවේ යෙදීමට අඩංගු වූයේ 1964.1.1 න් පසුව පරිනත වීමට නියමිතව තිබුණු ජීවිත රක්ෂණ සහතික නිකුත් කරනු ලැබ තිබුණු රක්ෂණ ව්‍යාපාරවල කළමනාව පරිපාලනය කිරීමය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් ඉටු කිරීමට ඇත්තේ ඒ පනතේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

12 වැනි වගන්තිය යටතේ රක්ෂණ කරුවන් විසින් තැන්පත් කර ඇති මුදල් ආපසු ගෙවීම පමණි. 14 වැනි වගන්තිය ප්‍රකාර රක්ෂණ ව්‍යාපාරයක කාලාතික්‍රාන්තවීමේ දින සිට ඇවුරුද්දක් ගත වන තුරු මේ තැන්පත් මුදල් නොගෙවා සිටිය හැකිය.

108. තමන් විසින් නිකුත් කරන ලද ජීවිත රක්ෂණ සහතිකවලට මෙහෙ කිරීම දිගටම කරගෙන යන විදේශීය ජීවිත රක්ෂණකරුවන් 9 දෙනෙක් ද, ලාංකික ජීවිත රක්ෂණකරුවන් 27 දෙනෙක් ද සිටිති. ඒ ව්‍යාපාරවල වත්කම් ඒ පනතේ 22 වැනි වගන්තියේ ප්‍රතිපාදනවලට අනුකූලව ආයෝජනය කර ඇති බවටත්, සහතික හිමියන්ගේ අයිතිවාසිකම්වලට අහිතකරවන්නාවූ මොනම දෙයක්වත් නොකැරෙන බවටත්, වගබලා ගැනීමට හැකි වන පරිදි ඒ රක්ෂණකරුවන්ගෙන් වාර්තා ලබාගනු ලැබේ.

109. ඒ පනත ක්‍රියාත්මක වූ අවස්ථාවේදී නරක අන්දමේ නොමනා කළමනාවෙන් යුතුව පැවති රක්ෂණ ව්‍යාපාර කිහිපයක්ම තිබුණි. මේ සමාගම්වලින් 7 ක් සම්බන්ධයෙන් පනතේ 53 වැනි වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවන් පත් කරනු ලැබ ඇත. ඒ ව්‍යාපාරවල කළමනාව පවත්වා ගෙන ගොස් ඒ රක්ෂණකරුවන්ගේ ව්‍යාපාර අවසාන කර දැමිය යුතුද, එසේ නැතිනම්, සහතික හිමියන්ගේ අයිතිවාසිකම් රැකවරණය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා වෙනත් කුමන ක්‍රියා මාර්ගයක් ගැනීම ප්‍රඥාගෝචරද යන්න පිළිබඳව හැකි පමණ විගසින් වාර්තා කර සිටීම මෙකී අද්මිනිස්ත්‍රාසිකරුවන් විසින් කළයුතු වන්නේය."

රක්ෂණ පාලන පනත ඇති කළේ මක් නිසාද, දැනට එයින් කෙරෙන්නෙ කුමක්ද යන්න එයින් පැහැදිලි වුණා. ජීවිත රක්ෂණය ජනසතු කළාට පසුව, රක්ෂණ සංස්ථාව ඇති කළාට පසුව, පාලක තුමාට තිබුණේ 1964 ජනවාරි 1 වැනිදට අර පරණ රක්ෂණ සමාගම් සමග ඔප්පු ඇති කර ගෙන තිබුණා නම් ඒවා අළුත් වැඩියා කිරීමාදියෙන් ඔවුන් හරියාකාරව ඒ කටයුතු ඉෂ්ට කරනවාද යන්න පිළිබඳව සොයා බැලීම සහ ඒ කටයුතු ඔවුන් හරියාකාරව ඉෂ්ට නො කරනවා නම් සහතික හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමයි. මේ කරුණු ගැන සොයා බලා ගෙන යන විට දෙපාර්තමේන්තුව රක්ෂණ පාලන පනත ක්‍රියාත්මක කිරීමේදී යම් යම් අමාරුකම් වලට මුහුණපා තිබෙන බව පෙනෙනවා. සමහර අවස්ථාවලදී ඒ රක්ෂණ සමාගම් කරුවන් පාලකතුමාගේ දැන්වීම භාර ගන්නෙ නැහැ. දැන්වීම අනුව ඇවිත් පෙනී සිටින්නෙ නැහැ. නොයෙකුත් මාර්ග වලින් මගහරින්නටම උත්සාහ දරණව. මේ තත්ත්වය නිසා තමයි මා මුලින් සඳහන් කළ අර වගන්ති දෙක ප්‍රයෝජන වන්නෙ. ඇනුම් දුන්නාම ඒ සමාගම්කරුවන් තමන් ඉදිරිපිටට ගෙන්වා විභාගාදිය පැවැත්වීමට පාලක තුමාට මේ වගන්ති අනුව බලය ලැබෙනව. නමුත් අප විරුද්ධ වෙන්නෙ ඉතාමත්ම වැදගත් කොටසක් කපා හැර ඒ වෙනුවට තවත් කොටසක් ඇතුළු කිරීම ගැනයි. පාලක තුමා අද්මිනිස්ත්‍රාසිකරුවන් නැත්නම් විසුරුවා හැරීමේ බලධාරීන් පත් කළාට පසුව යම්කිසි සමාගමක් හරියාකාරව තම යුතුකම් ඉෂ්ට කර නොමැති බව පාලක තුමාට පෙනී ගියහොත් එහෙම නැත්නම් ඒ බව වාර්තාවේ තිබුණොත් කෙළින්ම ඇමතිතුමාට පුළුවන් රෙගුලාසි සම්මත කර ඒ මාර්ගයෙන් එවැනි සමාගමක අධ්‍යක්ෂවරුන් සතු ධනය ලබාගෙන අර පාඩුව ලැබූ අයට දෙන්න. ඒ කොටස කපා හැර තිබෙනව. ඒ කොටස කපා හැර ඒ වෙනුවට යොදා තිබෙන්නෙ කුමක් ද? එවැනි තත්ත්වයක් ඇති වුණොත් උසාවියට යා යුතුව තිබෙනව. උසාවිය ඉදිරිපිටට ගිහින් තම අයිතිවාසිකම් කියන්ට සලස්වා තිබෙනව. අපේ අදහසේ හැටියට මේක රක්ෂණ සහතික හිමියන්ට මහත් පාඩුවක්. රක්ෂණ සමාගම් බොහොමයක්ම හරියාකාරව යුතුකම් ඉෂ්ට කර නොමැති බව මේ වාර්තාවේ සඳහන් කර තිබෙන බව අප කවුරුත් දන්නවා. රක්ෂණ සමාගම්කරුවන් තම යුතුකම් හරියට ඉෂ්ට කර නැති නිසා තමයි පාලක තුමා නීති ක්‍රියාත්මක කිරීමට උත්සාහ කර තිබෙන්නෙ.

"ජීවිත රක්ෂණ සහතික හිමියන්ගෙන් හා රක්ෂණ ඒජන්තවරුන්ගෙන් ලැබුණු පැමිණිලි 695 ක් සමාලෝචනයට භාජන වී ඇති වර්ෂය තුළ ගවේෂණයට භාජන කරන ලද්දේ විය."

පැමිණිලි 695 ක් ලැබී තිබෙනව. රක්ෂණ කොම්පැණිකාරයන් හරියාකාර රක්ෂණ සහතික හිමියන්ගේ අයිතිවාසිකම් රකින්නෙ නැත්නම් ඒ පිළිබඳව අද්මිනිස්ත්‍රාත් පාලක මාර්ගයෙන් වාර්තාවක් ඉදිරිපත් කළාම ඇමතිතුමාට රෙගුලාසි ඉදිරිපත් කරන්ට පුළුවන් "රක්ෂණ සහතික හිමියාට මෙපමණ මුදලක් හානි වී තිබෙනව, එය ලබා දිය යුතුයි" කියා. ඒකයි අපේ අදහස. ඒ රෙගුලාසිවලින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

රක්ෂණ කොම්පැණිකාරයන්ට බල කර නව, ඒ මුදල් ගෙවන හැටියට. දැන් ඒ රෙගුලාසි අහෝසි කර දමා තිබෙනව. එසේ කර තිබෙන්නෙ වෙන කිසි හේතුවක් නිසා නොවෙයි, දේශපාලන බලපෑම්වලට මුහුණ දෙන්ට ඇමතිතුමාට ධෛර්යයක් නැති නිසයි.

නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ විරුද්ධ පක්ෂය—පක්ෂ තුනම—හැමදාම ගත්තෙ දුප්පතාගෙ පැත්තයි. ක්‍රමානුකූලව, ප්‍රජාතන්ත්‍රවාදීව, නීත්‍යානුකූලව ඇති නැති අය අතර පරතරය නැති කිරීමට අපි නොයෙකුත් ක්‍රියා මාර්ග ගත්තා. තමුන්නාන්සෙල සියලුම දූෂණ නීත්‍යානුකූල කර අර ලාභය ධනපතීන්ට නැවතත් ලබා දීමට හැම විටම උත්සාහ කරනව.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
නොමිළේ හාල් ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
සෙරෙප්පු දෙකෙන් එකක් නොමිළයේ, අනෙක රුපියල් 15 යි. ඒ වගේ තමයි. [බාධා කිරීම්]

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මා හිතන හැටියට, රාජ්‍ය ඇමතිතුමා පමණයි හාල් ගැන අයථා ප්‍රචාර නොකළේ. මම හිතන්නෙ නැහැ. එතුමා "වෙස්සන්තරකම" අනුමත කරනවාය කියා. එක හාල් සේරුවක් නොමිළයේ ලැබුණත් අනික් හාල් සේරුව ගන්ට සිළිං 3 ක් යනව. මම හිතන්නෙ නැහැ, හාල් සේරුව සිළිං 3 ට දීම රාජ්‍ය ඇමතිතුමා අනුමත කරාවි කියා. ඉස්සර සිළිමට හාල් සේරු 2 යි. දැන් එක හාල් සේරුවක් නිකං ලැබුණට, අනිකට සිළිං 3 ක් විතර යනව. පෝදා පොළෝ අගමැතිතුමා ඉන්න තුරු හාල් සේරුව ශත 80 යි. අගමැතිතුමා අනික් පැත්තට ගිය ගමන් රුපියල් 1. 25 යි.

එම නිසා අපට භාර ගන්ට බෑ, මේ සංශෝධනයෙ ඒ කොටස. මහජනයා වෙනුවෙන් ගිහින් ඉන්න ඇමතිතුමාට මේ විධියෙ බලපෑම්වලට නොබියව මුහුණ දෙන්ට බැරි ඇයි ? මේ ආණ්ඩුව මහජනයාගෙ පැත්ත ගන්නව නම්, සේවකයාගෙ පැත්ත ගන්නව නම්, එසේ කිරීමට ධෛර්‍යයක් තිබෙනව නම්, කොයි තරම් බලපෑම් තිබුණත් මේ රෙගුලාසි පාවිච්චි කරන්ට පුළුවන්. අපට ඒ ධෛර්‍යය තිබුණ නිසා තමයි, 1962 දී ඒ ධෛර්‍යය පාවිච්චි කර ඒ විධියෙ නීති රීති ක්‍රියාත්මක කළේ.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
එක කොම්පැණියකට බල පෑවෙ නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
කොම්පැණිවලට බල පාන්ට එන්නෙ, දනුයි. ඒ කාලෙ අපේ ආණ්ඩුව ඒ රෙගුලාසි ක්‍රියාත්මක කර ගෙන යන විට ඒ බලපෑම්වලට මුහුණ පාන්ට තිබුණු අවසථාවල් මතු වුණේ නැහැ.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
වැන්ගාඩ් ඉන්ෂුවරන්ස් කොම්පැණියෙ කේස් එක ඉදිරිපත් වුණාම, කෙරුවෙ නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
අපි නීත්‍යානුකූලව ඒව කරල ඇති. ඒ අලාභය සම්පූර්ණයෙන් දීල ඒව ක්‍රියාත්මක කරල ඇති.

මම හිතන්නෙ, මෙය පාලනය කරන්නෙ රාජ්‍ය ඇමතිතුමා නොවෙයි, වෙළඳ ඇමතිතුමායි. වර්තමාන වෙළඳ ඇමතිතුමාට එක්තරා විධියක ශක්තියක් තිබෙනව. ඒ අනුව එතුමා කටයුතු කරන්ට ගියා. නමුත් කියන්ට බොහොම කණගාටුයි, මා සමග කථා කළාය කියා එතුමාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බොහොම ලොකු අකරතැබ්බයකට මුහුණ පාන්ට සිද්ධ වුණා. ආණ්ඩුවෙ මන්ත්‍රීවරු බොහොම දෙනෙක් දොස් කීව, එතුමා හිටපු ඇමතිවරයෙකු සමග කථා කළාය කියා. නිලධාරීන් දෙන උපදෙස් හරියාකාර ක්‍රියාත්මක කරන්ට එතුමාට ශක්තියක් තිබෙනව. නමුත් එතුමාට එය කරන්ට බෑ. මේ ආණ්ඩුවට වුවමනා කරන්නෙ ධනපති රාමුවක් තුළ කටයුතු කිරීම නිසයි, එතුමාට එය කරන්ට බැරී. විශේෂයෙන් විදේශ ප්‍රතිපත්තිය එක පැත්තකට පමණක් බරව ගෙන යාමටයි, මේ ආණ්ඩුවට වුවමනා කරන්නෙ. ඒ නිසා වෙළඳ ඇමතිතුමාට ඒ කාර්යය කරන්ට බැරි වුණා. ඊට එක් හේතුවක්, ප්‍රතිගාමී පත්තර එතුමාට නොයෙක් විධියේ දෙස් නැඟීම. අද නම් දොස් කියන්නෙ නැහැ. අද කොත්තමල්ලි නැහැ, පරිප්පු නැහැ, මිරිස් නැහැ; නමුත් පත්තර ඒ ගැන මොකවත් කියන්නෙ නැහැ. ඇයි ඒ? අපේ රාජ්‍ය ඇමතිතුමාට ඒ පත්තර වල අයිතිවාසිකමක් තිබෙන නිසයි. ඔන්න, අපි දෙගොල්ලන්ගෙ වෙනස. මේ වා ක්‍රියාත්මක කිරීමේදී නීතිපතිතුමාට විශාල බලයක් තිබෙන බව තමුන්නාන්සේ දන්නව. "ඇත්ත" පත්‍රයේ කියන හැටියට 'ගෙදර බල්ලා' වගේ සිටින නීතිපතිතුමා අතේ විශාල බලයක් තියෙනව. ඒ දෙපාර්තමේන්තුව මොනවා හෝ නිගමනයක් කර නඩු දමන්න අදහස් කළොත් ඒ සඳහා නීතිපතිතුමාගෙන් අවසර ගන්න ඕනෑ. ඒ අවසරය ඉල්ලුවම නීතිපති කල්පනා කරන්නේ ඒ චෝදනාවට එල්ල වී සිටින පුද්ගලයා කොයි විධියේ පාට කමිසයක් ඇඳ සිටිනවාද යන්නයි. ඔහු කොල පාට කමිසයක් ඇඳ සිටිනව නම් මේකෙ නඩුවක් නැහැ. ඔහු නිල් පාට හෝ රතු පාට කමිසයක් ඇඳ සිටිනව නම් හොඳටම තද කරපන් කියනව. නීතිපතිතුමා නඩු ඉදිරිපත් කරන්නේ ඔය විධියට බව තමුන්නාන්සේලා කව්රුත් දන්නව ඇති. ඒ නිසා දුප්පත් සේවකයන්ටත් දුප්පතුන්ටත් උසාවි යන්නයි සිද්ධ වෙලා තියෙන්නෙ.

හෘදය සාක්ෂියක් ඇති නිර්භීත ඇමතිවරයෙක් සිටියා නම් රෙගුලාසි සම්මත කර රක්ෂණ සමාගම්කාරයන්ට කියයි, "නුඹලාගේ වත්කම් පෙන්වාපල්ලා; නුඹලාගේ වත්කමේ හැටියට ගෙවන්න පුළුවන්; ඒ නිසා ගෙවාපල්ලා" කියා. නමුත් එහෙම ආත්ම ශක්තියක් නැහැ. එක පැත්තකට පන්දම් අල්ලගෙන අනික් පැත්තට බණ කිය කියා සමාජ වාදය අනුව හෝ ජාතික ඌරුව අනුව හෝ ආර්ථික ප්‍රශ්න විසඳන්න බැහැ. අන්න ඒ නිසයි, කෙළින්ම ඇමතිතුමාට ඒක භාර ගන්න බැරිව ඇමතිතුමාව ආරක්ෂා කරන්න දේශපාලන භූමියෙන් නීතිපතිකමට පත් කර ගත් ඒ තැනැත්තාට සම්පූර්ණ බලය දෙන්න මේ වැඩය කරන්නෙ.

මීට පස්සෙ මොකද වෙන්නෙ? මිනිසුන් ඇවිත් කියාවි, කොම්පැනිකාරයන් අපට වන්දි ගෙවන්නෙ නැත, අපේ අයිත්වාසිකම් දෙන්නෙ නැත, කරුණාකර අපට සහනයක් සලසා දෙන්නය කියා. එතකොට නීතිපතිට කියයි, මේ කාරණය සම්බන්ධයෙන් නඩුවක් දමන්න ඉඩ තිබෙනවද කියා සොයා බලන්නය කියා. නීතිපති සම්පූර්ණයෙන්ම ධනපති පැත්ත ගන්න බව අපි කව්රුත් දන්නව. මේ නීතිපතිතුමා ඉදිරිපත් කළ හැම නඩුවක්ම සම්පූර්ණයෙන්ම දේශපාලන පක්ෂග්‍රාහීත්වයෙන් යුතුව ඉදිරිපත් කළ බව අපි කවුරුත් දන්නව. "ජනදින" පත්‍රය සම්බන්ධව මම කියන්න අදහස් කරන්නෙ නැහැ, ඌරු කථා ගැන නඩුවක් තියෙන නිසා. ඒ නඩුව දමන්න ඔක්කොටම වඩා වුවමනා කළේ නීතිපතිතුමාටයි. අල්ලස් චෝදනා පිළිබඳ නඩු හැම එකක්ම ඉදිරිපත් කළෙත් පාට බලලයි. මේ නීතිපතිතුමා යටතේ මේකත් ඒ තත්ත්වයට වැටෙනව. මේ සංශෝධනය නිසා සාධාරණ ඉල්ලුම්කරුවන්ට කිසිසේත් ආවරණයක් ලැබෙන්නෙ නැහැ. නීති ශාස්ත්‍ර ගෙවන්න බැරි නම්, උසාවි යන්න ශක්තියක් නැත්නම්, දේශපාලකයන්ගේ බලපෑම් වලට මුහුණ පාන්න ශක්තියක් නැත්නම් කොලපොත අරගෙන හිඟා කන්නයි, සිදු වන්නෙ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක පුදුමයක් නොවෙයි. අප මේ රක්ෂණ සංස්ථාව ඇති කරන කාලයේ එක්සත් ජාතික පක්ෂයත් ඒ සමග සිටි නොයෙක් විධියේ ධනපති කොටසුත් එකට අත් වැල් බැඳගෙන මෙයට විරුද්ධ වූ බව අපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

කව්රුත් දන්නව. රක්ෂණ සංස්ථාව ඇති කර රක්ෂණ සමාගම්වල සේවකයන්ටත්, එසේම සාමාන්‍ය පොදු ජනතාවටත් සේවය කිරීමට අප ඉදිරිපත් වූ අවස්ථාවේදී විරුද්ධ වූ පක්ෂ දැනුත් මේ විධියට කටයුතු කිරීම පුදුමයක් නොවෙයි. ඒ අවස්ථාවේදී ඒ අය විරුද්ධ වුනා පමණක් නොවෙයි, ඊට පසු අපට කොයි තරම් ගල් පහරවල් ගැසුවාද යන්නත් තමුන්නාන්සේ දන්නවා ඇති. මැතිවරණ කාලයේදී කොම්පැනිකාරයන් ඡන්දදායක කොට්ඨාශවල පදිංචි වෙලා—විශේෂයෙන් මගේ කොට්ඨාශයේ පදිංචි වෙලා—අපට විරුද්ධව වැඩ කළ බව තමුන්නාන්සේ දන්නවා ඇති. මගේ භාර්යාවගේ කොට්ඨාශයේ ලක්ෂ ගණන් දමා වැඩ කළ බවත් තමුන්නාන්සේ දන්නවා ඇති. එපමණක් නොවෙයි. රක්ෂණ පනත අතපසු කරන්නට මැතිණියට කාර් එකක් අල්ලස් දුන්නාය කියා රාජ්‍ය ඇමතිතුමා එතුමාගේ චක් ගෝලයකු ලවා ප්‍රශ්නයක් අස්සවා කොමිටියක් පත් කර එතුමාම ඒ කොමිටියේ සභාපති වී කටයුතු කළා. නමුත් ඒ කොමිටියේ වාර්තාව ඉදිරිපත් කරන විට විරුද්ධ පක්ෂයේ නායිකාව සම්පූර්ණයෙන්ම නිදහස් ය කියන්න එතුමාට ආත්ම ශක්තියක් තිබුනෙ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
වාර්තාව කියවන්න.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මම එදා කිව්වා වගේ, මැතිණියට විරුද්ධව යම් කිසි චෝදනාවක් ඔප්පු වී තිබුනා නම් එය මේ ගරු සභාවේ මොර ගා කියාවි. ඒ වගේම එය ලේක් හවුස් සහ ටයිම්ස් පත්‍රවල ඡායාරූපත් සමග ලොකුවට පළ කරාවි. මේ විධියේ නීතිපති කෙනකු සිටිද්දී කවදාවත් මේ විධියේ සංශෝධන පනත්වත් වෙනත් නීතියක්වත් හරියට ක්‍රියාත්මක කරන්න බැහැ. දැන් මේ "ගෙදර බල්ලා" අයින් කර එතැනට කව්දෝ වෙන කෙනකු පත් කරන්න යනවලු.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
කුමාරස්වාමි පත් කරන විට ඒව නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

තමුන්නාන්සේලත් කුමාරස්වාමිල පත් කරල තියෙනව. තමුන්නාන්සේලගෙ හුඟක් දෙනා කියා තියෙනව එතුම කොතරම් සාධාරණ ලෙස වැඩ කළාද යන්න ගැන. [බාධා කිරීමක්] මේක නඩුකාරකමක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයෙ අය නඩුකාරයන් කී දෙනෙක් පත් කර තිබෙනවද? නීතිපතිකම මේ විධියෙ අවිනීත තත්ත්වයකට අපි කවදාවත් ඇද දමා නැහැ. අගමැතිතුමාගෙ කවුන්ටිං ඒජන්ට් තැන පවා දැන් අධිකරණයෙ [බාධා කිරීම්]

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
කවුද?

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
දැනගන්ට ඕනැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඇමතිතුමාට පුළුවන්කම තිබුණ රෙගුලාසි දමල ඔක්කොම ආපසු ගන්ට. [බාධා කිරීම්].

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
Who is that ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

Weeramantry.—[*Interruption*]. I think Weeramantry is a good choice, but do you criticize Coomaraswamy

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

on the same footing? Is Weeramantry not a politician? Did he not take part in the elections? Of course, he did.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Counting agent.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

More than a counting agent.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

What was Ameer doing? Addressing meetings also.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

I think Weeramantry is a good choice. It is equally unfair to criticize Coomaraswamy.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

If you oppose Coomaraswamy on political grounds, we oppose Weeramantry on political grounds.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

රක්ෂණ පාලකතුමාට බලය තියෙනව අනිකුත් රක්ෂණවල සිටින ව්‍යාපාරිකයන් සම්බන්ධව ඕනෑම කටයුත්තක් කරන්ට. රක්ෂණ සංස්ථාව ගැන එතුමාගෙ යුතුකම හරියාකාර ඉටු කර නොමැති බව කනගාටුවෙන් කියන්ට සිදු වී තිබෙනව. එහි සේවකයන් ස්ට්‍රයික් කර දැනට දින 35ක් පමණ වෙනව. රක්ෂණ අනපණත්වලට අනුව ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්ට එතුමාට බලතල තියෙනව. වෙළඳ ඇමතිතුමාට බලය දෙයාකාරයකින් ලැබෙනව ඒ ගැන ක්‍රියා කරන්ට. එතුම තමයි රක්ෂණ සංස්ථාව භාර තැනැත්ත. ඒවගෙම එතුම තමයි රක්ෂණ පාලන දෙපාර්තමේන්තුව අයිති තැනැත්ත. ඒ බලතල දෙකම පාවිච්චි කර රක්ෂණ සංස්ථාවෙ සේවකයන්ට සිදු වී තිබෙන අකරතැබ්බය ගැන විභාග කිරීමට එතුමාට සම්පූර්ණ අයිතිය තියෙනව. නමුත් එතුම ඒ යුතුකම පැහැර හැර තිබෙනව. ඒ වැඩ වර්ජනය කර තිබෙන අය ඉදිරිපත් කර තිබෙන ඉල්ලීම් 10 මේ ආකාරයි: සමාන පරිදි සීඝ්‍ර ලෙස උසස් කිරීම, වැටුප් විෂමතා නැති කිරීම, කාර්යාල සහායකයන් වශයෙන් කොම්පැනි කාලයේදී සේවය කළ අයට ඒ තනතුරුම සංස්ථාවේ දීම, ආණ්ඩුවේ නිවාඩු දවස් සංස්ථාවේ සේවකයන්ට දීම—ආණ්ඩුවෙ නිවාඩු දවස් සංස්ථාවෙ සේවකයන්ට දෙන්නෙ නැහැ ; නමුත් ආණ්ඩුව කියා පානව කරුණාකර අනික් සේවකයනුත් අපව අනුගමනය කරන්ට කියල, සංගම් නියෝජිතයන් ඇතුළු මණ්ඩලයකින් සේවක මාරුකිරීම් සංවිධානය කිරීම, 1963 වැටුප් සංශෝධන අනුව 1 වන ශ්‍රේණියේ අයට වැටුප් දීම, උසස් ශ්‍රේණියේ කණිෂ්ඨ තනතුරුවල පුරප්පාඩු සංස්ථා සේවකයන්ගෙන් පිරවීම, සංස්ථා සේවකයන්ට නිවාස ණය දීම, යූනියන් පෙදෙසේ සේවකයන්ට සේවා සැප පහසුකම් දීම, සංස්ථා සේවකයන් උදෙසා විනය නීති මාලාවක් සකස් කිරීම. මේව ගැන ක්‍රියා කරන්ට පාලකතුමාට ඉඩ දෙන්නෙ නැහැ වෙළඳ ඇමතිතුමා. [බාධා කිරීමක්].

මා මීට වඩා දීර්ඝ ලෙස කතා කරන්ට අදහස් කරන්නෙ නැහැ. මම සංක්ෂේපයෙන් මගේ විරුද්ධතාවය පල කළා. ඇමතිතුමාට තිබෙන රෙගුලාසිවලින් සාමාන්‍ය ජනතාවට දෙන්ට හැකි ආරක්ෂාව නීතිපතිතුමාට පවරා ජනතාවගෙ අයිතිවාසිකම් ආරක්ෂා නොවන විධියට සංශෝධන පනතක් ඉදිරිපත් කිරීම ගැන අපි සම්පූර්ණයෙන්ම විරුද්ධ වෙනව.

අ. භා. 6.48

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

May I first of all draw attention to the original purpose of the Control of Insurance Act? The original

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

purpose was to control the insurance companies in various ways. It is true that they were allowed to continue their life insurance business and to wind up their work in life insurance. They were not allowed to do any new business. They were expected to wind up what they had already done.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

Only in respect of past premia.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரோரா)
(Dr. N. M. Perera)

Yes.

What was the experience ? I must say, in fairness, most of the British companies were fairly satisfactory in the sense that they looked after the insured. They had substantial assets and, therefore, were in a position to meet their obligations. We cannot say the same of a good number of Indian companies. We cannot say the same of a good number of Ceylonese companies. The position with regard to a certain section of these companies was unsatisfactory.

In what way did we try to safeguard the insured ? There are various sections in the Act. First of all, we set up a Controller to act as Controller of Insurance, and he had certain obligations to perform in the sense of seeing that this Act was properly implemented, the basic position being to safeguard the rights of the insured. Now, it was the duty of the Controller to see that such actions as were necessary were taken for the purpose of safeguarding the interests of the insured persons.

I think it is within the experience of a number of hon. Members on both sides of this House that policy holders have come and complained that there is absolutely no chance of getting their moneys from a number of these insurance companies. They have had no replies to the various representations made in a number of cases where the policies had matured and there were no signs of the insurers paying up. In a number of cases the companies have vanished. There are no traces of the people concerned or the directors have swallowed up all the money, the premia. What has been done up to date with regard to these people ? The Hon. Minister might have enlightened us on the actual working of this Act.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

Kindly correct what the hon. Member for Kolonnawa (Mr. Ilangaratne) said. Section 79 is being amended to tighten up the law to enable recovery of money.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரோரா)
(Dr. N. M. Perera)

That is only one aspect of it. There is also another aspect of it, and it is to that aspect that the hon. Member for Kolonnawa drew your attention. You are pointing out only one aspect.

I would like to know what precisely had been done with regard to these matters.

Let me take Section 46 of the original Act. Section 46 refers to the power to order inspections. Where the Controller has reason to believe that the interests of the policy holders of an insurer are in danger, or that any insurer is unable to meet his or its obligations, or has made default in complying with any of the provisions of this Act, or that an offence under this Act has been or is likely to be committed, then the Controller has the power to take action in any such case.

Section 46 continues :

" (b) receives a requisition supported by an affidavit and signed by not less than fifty policy holders holding policies of life assurance which have been in force

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

for not less than three years and which on maturity will be of a total value of not less than fifty thousand rupees, that an investigation into the affairs of the insurer be held ; or

(c) receives a similar requisition in the case of an insurance company signed by not less than one-tenth of the shareholders of that company who shall not have less than one-tenth of the whole share capital,

the Controller may, subject to the provisions of sub-section (2), after giving the insurer reasonable notice and an opportunity to be heard, order an investigation of the affairs of the insurer to be made . . . . . "

The Controller has full powers to order a full investigation into the affairs of an insurance company, if he has reason to believe that this insurance company is likely to default in making good their obligation by the policy holders. Why have these powers not been utilized ? If these powers had been fully utilized, we would not have received these complaints from time to time from the policy holders.

Sub-section (2) says :

"The Controller may, as a condition precedent to the ordering of an investigation upon a requisition being sent therefor either by policy holders or by shareholders of an insurance company as provided in sub-section (1), require the persons making the requisition to furnish security in such amount as he may deem sufficient to meet the cost to the insurer of the investigations.

What I am trying to point out is that the Controller has full powers to hold this investigation. Now, under this amending Bill, the Minister introduces a new Section 46A which runs as follows :

"46A. For the purposes of this Act, the Controller or other person authorized in that behalf by him in writing may hold an inquiry into the working and financial condition of any insurer which is a company incorporated under any law for the time being in force, and accordingly every director, manager or other officer or employee of such company, whether past or present shall, whenever required to do so by notice in writing by the Controller or such other person—

(a) furnish such information in regard to the affairs of such company and produce such books, accounts or documents in his custody as the Controller or such other person may require ;

(b) attend at such place and on such date and at such time as may be specified in such notice to be examined by the Controller or such other person in regard to any matter relating to the working and financial condition of such company. "

Apparently, Section 46A has been introduced in order to complete and supplement the powers that already exist.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*
**(Mr. Shelton Jayasinghe)**

Because they were insufficient in the first instance.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
**(Dr. N. M. Perera)**

It would have been very helpful if the Minister had told us that in practice this has been so. As I see, the original Section 46 is sufficiently wide. I am prepared to accept the Minister's statement that it is necessary to make the position clearer.

If you look at Section 46 (5) of the original Act, it says :

"The Controller may by written notice require the insurer to comply within such time as may be specified therein . . . with such directions . . . as may in the opinion of the Controller be necessary for remedying the defects disclosed by any investigation made under this section. "

The Controller has the right to order an investigation by an auditor or actuary appointed for the purpose by the Controller provided the auditor or actuary is not in the employ of the insurer. Therefore, I do not know why this amendment is necessary.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

Anyhow, I have no objection to increasing the Controller's powers. My fear is that the Controller has not been sufficiently alive to the extent of the powers that he already has.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

The Controller can settle a dispute where the sum does not exceed Rs. 2,000.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I am talking of the powers he has under the Act to carry out an investigation. Anyway, we have no complaint in regard to the amendment proposed as Section 46A.

Then we have the amendment proposed to Section 62 of the principal Act. That is in regard to Winding-up Tribunals. Section 62 of the principal Act says,

"The Minister may, for the purposes of this Act, appoint one or more Winding-up Tribunals; each such Tribunal shall consist of three members appointed by the Minister, of whom one shall be a person who is or has been a Judge of a District Court, and such person shall be the Chairman of the Tribunal."

I suppose it is a question of language, and I have no quarrel about that.

Then we come to Clause 4 whereby a new section, Section 72A, is sought to be added to the principal Act. Section 72 of the principal Act makes it a penal offence for a person to solicit insurance business on behalf of unauthorized persons.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

The original Section 72 did not make it a penal offence. The amendment proposed makes it so.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What are you talking? Look at the last portion of Section 72—"shall be guilty of an offence and shall, on conviction after summary trial before a Magistrate, be liable to a fine . . ." and so on.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

The original section is not wide enough. We have now amplified it.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is why I say it would have been helpful if the hon. Parliamentary Secretary explained these matters in a little more detail.

එකල්හි වේලාව අ. භා. 7 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1967 අප්‍රේල් 5 වන බදාදා පවත්වනු ලැබේ.

அப்போது பி.ப. 7 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது.

விவாதம் 1967 ஏப்றில் 5 ஆம் தேதி புதன்கிழமை மீள ஆரம்பமாகும்.

*It being 7 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Wednesday, 5th April 1967.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු ජේ. ආර්. ජයවර්ධන].

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக".—[கௌரவ ஜே. ஆர். ஜயவர்தன] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed, "That the House do now adjourn".—[The Hon. J. R. Jayewardene].*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. ජේ. ජී. ද මැල් මයා. (දෙවිනුවර)**
*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)*
(Mr. R. J. G. de Mel—Devinuwara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දෙවිනුවර අතුරු මැතිවරණයේදී ඇති වූ සිද්ධීන් කීපයක් ගැන තමුන්නාන්සේගේත්, මේ ගරු සභාවේත් අවධානය යොමු කරවන්නට කැමතියි. මා මේ කථා කරන්නේ කෝපයෙන් නොව කනගාටුවෙනුයි. මැතිවරණයට පෙර ඇති වූ දේවල් ගැන මා ප්‍රථමයෙන් මතක් කරන්නට අදහස් කරනවා.

දෙවිනුවර අතුරු මැතිවරණය සඳහා නාම යෝජනා භාරගෙන දවස් කීපයකට පසු මාතර දිසාපති පීටර්ස් මහතා හදිසියේම වෙනත් ප්‍රදේශයකට මාරු කර යවන්නට යෙදුණා. ආණ්ඩුවේ නිලධාරීන් ගැන මේ තරම් භය ඇයි? ඊළඟට දික්වැල්ලේ පොලිස් ස්ථානාධිපති මොහාන් ජයසූරිය මහතා මාරු කර යවන්නට යෙදුණා. ඔහු අවංක නිලධාරියෙක්. මැතිවරණ පටන් ගන්න කාලයේදී විදුලි පණිවුඩයකින් මාරු කර යවනු ලැබූ ඔහු වෙනුවට එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක මහතකුගේ ඉතාම කිට්ටු ඥාතිවරයකු වන ඉන්ස්පෙක්ටර් චාල්ස් මහතාට දික්වැල්ලේ පොලීසියේ භාරකාරත්වය පැවරුවා. ඒ අතර පොලිස් නිලධාරීන් කීප දෙනකුද ගමනාගමන මණ්ඩලයේ නිලධාරීන් කීප දෙනකුද, කච්චේරියේ නිලධාරීන් කීප දෙනකුද මාරු කළා. මේ නිලධාරීන් හුඟ දෙනකුම මාරු කර යවන ලද්දේ විදුලි පණිවුඩ මාර්ගයෙනුයි. තවද කච්චේරියේ ලිපිකරුවකු වන ආරියදාස මහතාගේ වැඩ තහනම් කළා. විවාහ රෙජිස්ට්‍රාර් තේනබදු මහතාගේද වැඩ තහනම් කළා. ගන්දර ගම්කාර්ය සභාපති තැන්පත් සෝමපාල මහතා පාලමක් කැඩීමේ චෝදනාවක් උඩ අත් අඩංගුවට ගත්තා. ගන්දර ගම්කාර්ය සභික ඩැනි සහෝදරයාද එම චෝදනාව උඩම අත් අඩංගුවට ගත්තා. හිටපු සාම මණ්ඩල සභාපතිනිය වන, එමෙන්ම අපේ පක්ෂයේ කාන්තා පෙරමුණේ දෙවිනුවර කොට්ඨාශයේ සංවිධායිකාව වන, සෝමා අබේවර්ධන මහත්මිය පොලිස් අත් අඩංගුවට ගන්නට ලෑස්ති වුණා. එසේ කරන්නට ලෑස්ති වුණේ ගරු අගමැතිතුමා විවේචනය කිරීමේ චෝදනාව උඩයි.

කල් තැබීම

ඊළඟට මැතිවරණය දාට පෙර දිනත්, මැතිවරණයට පෙර රාත්‍රියේත් ඇති වූ දාමරිකකම් කීපයක් ගැනද කනගාටුවෙන් සඳහන් කරන්නට ඕනෑ. වරක් දැදිගම කොට්ඨාශය වෙනුවෙන් මේ ගරු සභාවේ පෙනී සිටි මෛත්‍රීපාල හේරත් මහතාගේ 1 ශ්‍රී 7733 දරන ඔපල් රෙකෝඩ් මෝටර් රථය ගිනි තැබුවා. එය කෙළේ රත්මලේ ප්‍රදේශයේ මහා මාර්ගයේදියි. පිටින් පැමිණි සියයක පමණ දාමරික පිරිසක් ඒ මෝටර් රථය ගිනි තැබීමේ ක්‍රියාවට සම්බන්ධ වුණා. එක් පිරිසක් ජීප් රථයකින් පැමිණ එය ඉහත කී මෝටර් රථයට ඉස්සර කොට නැවැත්වූ අතර, ඊට පිටුපසින් ලොරියක් ආවා. අර මෝටර් රථය එකී ජීප් රථයටත් ලොරියටත් මැදි කොට ඊට පහර දෙන්නට පටන් ගත්තා. මෛත්‍රීපාල හේරත් මහතා—මේ ගරු සභාවේ සිටි මන්ත්‍රීවරයෙක්—ඒ අවස්ථාවේ එතනින් පැන දිව් නිසා යන්තම් පණ බේරා ගෙන යන්නට පුළුවන් වුණා. ඊට පසුව ඒ ජීප් රථයේ සිටි දාමරික පිරිස පැමිණ පැට්‍රල් ටැංකියක් අරගෙන ගොස් කාර් එකට දමා එය ගිනි තැබුවා. දැන් එහි ඉතිරිව තිබෙන්නේ යකඩ ටික පමණයි. දැන් දික්වැල්ල පොලිස් භූමියේ එය ප්‍රදර්ශනය කරනව. මොකක්ද මේ ජීප් එකේ නොම්මරය? මේ සිද්ධිය දුටු සාක්ෂිකරුවන් ඒ ජීප් එකේ නොම්මරය ඉදිරිපත් කර තිබෙනව. එම ජීප් එකේ නොම්මරය 4 ශ්‍රී 1828. ඒ සමග අර ලොරියේ නොම්මරයත් ඉදිරිපත් කර තිබෙනව. ඒ ලොරියේ නොම්මරය 22 ශ්‍රී 2050. අද වන තුරු මේ ජීප් එක පොලිස් භාරයට අරගනෙ නැහැ. අපේ ආරංචියේ හැටියට නම් පොලිස් ස්කොඩ් එකත් සමග—පොලිස් ආරක්ෂාව ඇතිව—එම ජීප් එක දෙවිනුවර සිට කොළඹට ගෙනැවිත් අයිතිකරුට බාර දී තිබෙනව. අද වන තුරු මේ ජීප් එක පොලිස් භාරයට අරගෙන නැත්තේ ඇයි? එම ජීප් එක එළවූ රියැදුරා අරගෙන නැත්තේ ඇයි? ඒ වාහනවල සිටියේ දෙවිනුවර අය නොවෙයි. ඒවායේ සිටියේ පිට පළාත්වලින් ගිය අයයි. ඒ ලොරිය පොලිස් භාරයට නොගත්තේ ඇයි? එය කාගේ ලොරියක්ද කියන එක අපි දන්නව. කාර් එකක් පුච්චා දමා එහි හිටපු මන්ත්‍රීවරයකුගේ ජීවිතය හානි කරන්නට පවා තැත් කළා. එහෙත් මෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]
රම් දාමරිකකමක් කිරීම ගැන අද වනතුරුත් කිසිම පරීක්ෂණයක් හෝ විභාගයක් හෝ පවත්වා නැහැ. මේ සිඹීන් ගැන පරීක්ෂණයක්වත් නොපවත්වන්නේ මක් නිසාද කියා අපි ප්‍රශ්න කරනව. මේ ලොරියත් ජීප් එකත් අයිතිකරුවන් කවුරුන්ද? ඒ කාරණය අපට කියන්නට බැරි ඇයි?

ඊළඟට තවත් සිද්ධියක් ගැන කියන්න කැමතියි. ගරු වලපනේ මන්ත්‍රීතුමාගේ (ටී. බී. එම්. හේරත් මයා.) කාර් එක හරස් කර—මා කලින් සඳහන් කළ ජීප් එක හා ලොරියමයි—දාමරික ක්‍රියාවක් කර තිබෙනව. වලපනේ ගරු මන්ත්‍රීතුමා පණ බේරා ගෙන ගොස් ඇත්තේ ඉතා අමාරුවෙන්. දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමාගේ (ආර්. ජී. සේනානායක මයා.) "බෙන්ස්" කාර් එකට ගල්වලින් ගසා වින්ඩ්ස්ක්‍රීන් එක ඇතුළුව වීදුරු සියල්ලක්ම පාගේ පොඩි කර තිබෙනව. තංගල්ලේ අධිනීතිඥ ජයසිංහ මහත්මයාගේ කාර්එකටත් ගල් ගසා පොඩි කර තිබෙනව. එමෙන්ම තංගල්ලේ අධිනීතිඥ වෙනිසන් එදිරිසූරිය මහත්මයාගේ "fපියට්" කාර් එකටත් ගල් ගසා පොඩිකර තිබෙනව. තංගල්ලේ කේ. ඩී. සිල්වා මහතාගේ කාර් එකට කළ දේ ඊළඟට බලන්න. ඉස්සර ග්‍රීක්වරු රෝමන් කාරයින්ගේ යුද හමුදාවලට බැටරිං රැම් වලින් රැම් කරනවාය කියා එකක් තිබුණා. අන්න ඒ වගේ මේ සඳහන් කළ ජීප් එක ගොස් ඒ කාර්එක රැම් කර තිබෙන අන්දම පුදුමාකාරයි. ඉස්සරහින්, පස්සෙන්, දකුණෙන් වමෙන් ආදී වශයෙන් එක එක පැත්තෙන් ඇවිත් රැම් කර තිබෙනව. දොඩම්පහළ සුදස්සී කියන ස්වාමීන් වහන්සේට කර තිබෙන්නේ මොකක්ද? ඒ ස්වාමීන් වහන්සේ අපට පක්ෂව වැඩ කළ කෙනෙක්. ඒ ස්වාමීන් වහන්සේ ඡන්දය දමන්නට යන විට එක්සත් ජාතික පක්ෂයේ මැරවරයින් විසින් ඒ ස්වාමීන් වහන්සේට කම්මුල් පහරක් ගසා තිබෙනව. ඒ පිළිබඳව දික්වැල්ල පොලිසියට පැමිණිල්ලකුත් කර තිබෙනව. තමුන්නාන්සේලා ආගම ආරක්ෂා කරනවාය කියන්නේ මේ අන්දමටද කියා ඉතා කනගාටුවෙන් අහන්නට සිදු වී තිබෙනව. එක්සත් ජාතික පක්ෂයෙ මහ කෙරුම් කාරයෙක්—මාතර ප්‍රදේශයෙ [illegible]



හිට්ලර්, දහයිය සීසර්—හිටපු මන්ත්‍රීවරයෙක්, මේ අතුරු මැතිවරණයට කලින් දවසෙ මෙසේ කියා තිබෙනව: "අපි දැන් පරාදයි; අපි දැන් ඉතින් අතින් පයින් ගහමු; අත් බෝම්බවලින් ගහමු; නැත්නම් අපට දිනාගන්න බැ." මේ මැරවරකම් සියල්ලක්ම කෙළේ සංවිධානය කරන ලද මැරවර සැලැස්මක් අනුව බව මා කියන්න කැමතියි. එක්කෝ අපේ සංවිධායක මහත්වරුන් පොලිස් අත් අඩංගුවට ගැනීමට, එහෙම නැත්නම් ඡන්ද විමසීම පැවැත්වෙන දවසට කලින් අපේ සංවිධායක මහත්වරුන්ට තුවාල කොට ඔවුන් ස්පිරිතාලයට යැවීමට, එහෙමත් නැත්නම්, අපේ සංවිධායක මහත්වරුන් මරා අනෙක් ලෝකයටම පිටත් කිරීමට මේ මැරවර සැලැස්ම සංවිධානය කළ බව අපට පැහැදිලියි. මා මෙම කරුණු ඉදිරිපත් කරන්නෙ ඉතාම කනගාටුවෙන්. මේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නෙ මෙහෙම දැයි මා අහන්න කැමතියි.

ප්‍රජාතන්ත්‍රවාදයෙ විශේෂ ලක්ෂණයක් හැටියට එදා ඇරිස්ටෝටල් Nothing in excess යයි කියා තිබෙනව. නමුත් මේ අතුරු මැතිවරණයෙදී රජය ගෙන ගිය හැම ව්‍යාපාරයක්ම in excess. මැරකම් කිරීමත් in excess. සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍ර විරෝධි ව්‍යාපාරයක් ගෙන ගියෙ. මැතිවරණ කාලය තුළදී ඒ කොට්ඨාශයෙ සෑම තැනකම, මැතිවරණ නීතිරීතිවලට සම්පූර්ණයෙන්ම විරුද්ධ අන්දමට හැම ගෙදරකම, හැම බිත්තියකම, හැම පොල් ගහකම අලිය ලකුණ—සමහර තැන්වල කතිරයත් සමගම—ප්‍රදර්ශනය කළා. පාර අයිනෙත් පොදු ස්ථානවලත් පෞද්ගලික තැන්වලත් කොළපාට කොඩි එල්ලුණා. ගරු අගමැතිතුමත් මේව දකින්න ඇති. මේව ගැන අපි පැමිණිළි කළත් පොලිසිය ඒ පැමිණිලි ගැන කිසිම සැළකීමක් කෙළේ නැහැ. වාසනාවකට වගේ බිත්තිවලට, පොල්ගස්වලට ඡන්දය තිබුණෙ නැ. තිබුණනම් මගෙ ඇපෙත් නැති වෙනව. දෙවිනුවර අතුරු මැතිවරණය ගෙන ගියේ ඔය විධියටයි. බොහොම කැතයි.

ඒ විතරක් නොවෙයි. ජාතික සමගිය ආරක්ෂා කරනවාය කියන මේ පිරිස කුල භේදයත් ඇවිස්සුව. පී. පී. වික්‍රමසූරිය මහත්මයාවත් එක්සත් ජාතික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පක්ෂයටවත් නොව අපේ කුලයට ඡන්දය දෙන්නයයි එක් පිරිසක් තලල්ලට ගොස් එහි ජනතාවට කිව්ව. රත්මලේට ගිය තවත් පිරිසක් "අපේ කුලයට ඡන්දය දෙන්න" යයි එහි ඡන්ද දායකයින්ට කිව්ව. කොළඹ නගර සභාවෙ උප නගරාධිපති කෙනෙක් හේමත් තවත් ප්‍රදේශයකට ගිහින් එහි මිනිසුන්ට කිව්ව, අපේ කුලයට ඡන්දය දෙන්නය කියා. මේක තමයි අලුත් ජාතික සමගිය.

අගලවත්තෙ අතුරු මැතිවරණය සඳහා නාමයෝජනා බාර දෙන දවසෙ මා එහාටත් ගියා. එදා එහි හොඳ ලස්සන ප්‍රදර්ශනයක් තිබුණ. අමුඩ ගහගෙන කැති උදලු ගත් ගොවි පිරිසක් ඒ ප්‍රදර්ශනයට ඉදිරිපත් වී සිටිය. මේක කළේ අමුඩ ලේන්සු හේම නැති නිසාද ? නැහැ· කුලවාදය අවුස්සන්න. චී ; බොහොම කැතයි, සභාපතිතුමනි. ඇත්ත වශයෙන්ම මා හිතන හැටියට, මෑත යුගයේ කොයිම මැතිවරණයක්වත් මේ තරම් නීති විරෝධි අන්දමටත් නිව නින්දිත විධියටත් පැවැත්වුණේ නෑ.

1933 දී ජාතික සමාජවාදය ආරක්ෂා කිරීමට ඉදිරිපත් වුණු එක්තරා පුද්ගලයෙක් මට මේ අවස්ථාවෙදී මතක් වෙනව. ජාතික සමාජවාදය ආරක්ෂා කරන්නට මේ තැනැත්තා පළමුවෙන්ම කෙළේ Reichstag හෙවත් පාර්ලිමේන්තුව පුච්චා දැම්මයි. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරනවාය කියන, ජාතික සමගිය තහවුරු කරනවාය කියන ආණ්ඩු පක්ෂය අතුරු මැතිවරණවලට වැඩ කරන්ට එන අපේ හිටපු මන්ත්‍රීන්ගේ කාර් පුච්චනවා නම්, පොඩිපට්ටම් කරනවා නම් මා ඒ අයගෙන් අහන්ට කැමතියි, ජාතික සමගිය, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නේ ඔය අන්දමටද කියා. හිටපු මන්ත්‍රීන්ගේ කාර් පුච්චන්ට පුළුවන් නම්, වැඩි කල් යන්ට පෙර මේ පැසිස්ට් කණ්ඩායමට මේ පාර්ලිමේන්තුවත් පුච්චන්ට පුළුවන් බව මම අද තමුන්නාන්සේට මතක් කර දෙන්ට කැමතියි. මම කථා කරන්නෙ කෝපයෙන් නොවෙයි, කනගාටුවෙන්. පොලීසියේ පරීක්ෂණවලට ඇඟිලි ගසන්නේ නැතිව, දේශපාලන බලපෑම් නොකර, අපක්ෂපාත පොලීස් නිලධාරියකු දෙව්නුවරට යවා ඔහු ලවා මේ සිද්ධින් ගැන සාක්ෂිකරුවන්ගෙන් නියම අන්දමට සාක්ෂි ලබාගෙන පරීක්ෂණයක් පවත්වා සාධාරණ තීරණ අරගෙන වැරදිකරුවන්ට සුදුසු දඬුවම් දෙන්ට කියා ඉතා ආදරයෙන් සහ කරුණාවෙන් ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය දැන් අවසන් කරනව.

අ. භා. 7.16

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

මා තැපැල් ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්ට කල් දුන්න. තැපැල් ඇමතිතුමාවත්, එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාවත් මේ ස්ථානයේ දැනට නොමැතිවීම ගැන මා කනගාටු වෙනව.

**විජයපාල මෙන්ඩිස් මයා. (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. விஜயபால மெண்டிஸ்—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. Wijayapala Mendis—Parliamentary Secretary to the Minister of Public Works, Posts and Telecommunications)

මම ඉන්නව.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

කනගාටුයි, මම තමුන්නාන්සෙව දැක්කෙ නැහැ.

මිනුවන්ගොඩ තැපැල් කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ල ඉතා දුර්වල තත්ත්වයක පවතින බව තමුන්නාන්සේ දන්නව. දැනට ඒ ගොඩනැගිල්ලේ කොටසක් කඩා වැටී තිබෙන අතර ඉතුරු කොටසත් කොයි වෙලාවේ කඩා වැටේදැයි කියන්ට බැරි තත්ත්වයකයි තිබෙන්නෙ. ඒ තැපැල් කාර්යාලය සඳහා අළුත් ගොඩනැගිල්ලක් සාදා දැන් අවුරුදු 2ක් විතර වෙනව. ඒ ස්ථානයට මේ තැපැල් කාර්යාලය ගෙන යන්නේ කවදාද කියන එක දැන ගන්ටයි මා මේ ප්‍රශ්නය අහන්ට කල්පනා කළේ. ඒ ගොඩනැගිල්ලට තැපැල් කාර්යාලය ගෙන යාම ප්‍රමාද කරන්නෙ ඇයි ? යම් විධියකින් ලොකු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]
වර්ෂාවක් ඇති වුණොත් දැනට තැපැල් කාර්යාලය පවත්වාගෙන යන පරණ ගොඩනැගිල්ලෙ ඉතුරු ටිකත් කඩා වැටෙයි. එම නිසා කරුණාකර පුළුවන් තරම් ඉක්මණින් තැපැල් කාර්යාලය අළුත් ගොඩනැගිල්ලට ගෙන යන්ට කටයුතු සලසන ලෙස පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා ඉල්ලා සිටිනව.

අ. භා. 7.18

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දෙව්නුවර අතුරු මැතිවරණය සම්බන්ධයෙන් දෙව්නුවර ගරු මන්ත්‍රීතුමා (ආර්. ජේ. ජී. ද මැල් මයා.) වැදගත් කරුණු රාශියක් ඉදිරිපත් කළා. 10 වැනිදා සිට 14 වැනිදා රෑ වෙනතුරු ඒ ප්‍රදේශයේ මා සංචාරය කළා. 15 වැනිදා සහ 16 වැනිදා මා හිටියෙ අනුරාධපුරයේයි. 14 වැනිදා දක්වා දෙව්නුවර ප්‍රදේශයේ කිසිම කලබලයක් නැතිව සාමය ආරක්ෂා වුණු ආකාරය ගැන මා පුදුම වුණා. එහෙන් මෙහෙන් සමහර විට සුළු සිද්ධියක් සිදුවෙන්න ඇති; වැඩි යමක් සිදු වුණේ නැහැ. 14 වැනිදා රෑ අපේ අන්තිම රැස්වීමේ කථා කරල මා අනුරාධපුරේ යන්ට ගියා. ඊට පසු දවස් දෙකේ මා සිටියේ අනුරාධපුරයෙයි. මේ කියන සිද්ධීන් ඇති වී තිබෙන්නෙ 15 වැනිදා රාත්‍රියේයි. ඡන්දය විමසුවේ 16 වැනිදායි. දෙව්නුවර ගරු මන්ත්‍රීතුමා ජීප් එකක් ගැන සඳහන් කළ නිසා මා එකක් කියන්ට සතුටුයි. පළමුවෙන්ම පැමිණිල්ල කරන විට ජීප් එකක් ගැනවත්, ජීප් එකක නොම්මරයක් ගැනවත් සඳහන් කළේ නැහැ. දෙවනුව නොම්මරයක් දුන්නා. ඒ නොම්මරය 4 ශ්‍රී 1824 යි. 4 ශ්‍රී 1824 ජීප් එකක් නොවෙයි, හෝල්ඩන් රථයක් එය මගේ ජීප් එකක්ය කියා වලපනේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කර තිබෙන බව මට ආරංචියි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කොවුල්වැව වතු යායෙ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

කොවුල් වැව වතුයායෙ ජීප් එක 4 ශ්‍රී 1824 නොවෙයි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

28 ගැනයි මා මේ ගරු සභාවෙදී කිව්වෙ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඒ පසුව. 28 කිව්වෙ පසුව. ඒව තමයි අපිට දැනගන්ට ඕනෑ. [බාධා කිරීමක්] මම එකක් කියන්නම්. [බාධා කිරීමක්] දෙව්නුවර මන්ත්‍රීතුමා යම් යම් දේවල් ගැන පැමිණිල්ලක් කර තිබෙනව. කොයි පක්ෂයෙන් වුණත් ඒව කෙරුණා නම් ඒව ගැන නිසි අන්දමට විභාග කර දඬුවම් පැමිණ විය යුතුයි. ඇත්ත වශයෙන්ම මේ විධියට නොවෙයි මැතිවරණ පැවැත්විය යුතුව තිබෙන්නෙ. නමුත් කරණා කර තමාගේ චෝදනාවට—වෙන ප්‍රයෝජනයක් ලබා ගැනීම පිණිස—නොතිබුණු ජීප් එකක් ඇතුළු කරන්ට එපා. එයින් තමාගේ පැමිණිල්ල බොරු වෙනවා පමණයි, වෙන්නෙ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

විභාග කළාම ඔප්පු වෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඔව්, විභාගයක් පවත්වමු. ඒ ගැන කිසි අනුමානයක් නැහැ. මා කියන්නෙ පළමුවෙන් කිසිම නොම්මරයක් නොදුන් බවයි. දෙවනුව නොම්මරයක් දුන්නා. ඒ නොම්මරය දරණ වාහනය ජීප් එකක් නොවෙයි; හෝල්ඩන් රථයක්. මට පමණක් නොවෙයි, අපේ පවුලට අයිති වත්තක ජීප් එකක් තිබෙනව. හැම මැතිවරණයකටම ඒ ජීප් රිය ගියා. දැන් අගලවත්තටත් යයි. ඒ ගැන කිසිම අනුමානයක් නැහැ. ඒ ජීප් එක එහෙ වැඩ කරනව ඇති.

මේ සිද්ධිය කවුරු කළත් එය ඉතාමත් වැරදි ක්‍රියාවක්. නමුත් මෙයින් නිකම් දේශපාලන ප්‍රයෝජනයක් ලබා ගන්න නොතිබුණු ජීප් එකක් අමුණන්න එපා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

අපි ඔප්පු කරන්ට ලෑස්තියි ඒ සිද්ධිය.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඔප්පු කරන්ට ලෑස්ති නම් නිසි විධියට ඒ ගැන ක්‍රියා කරනවා ඇති. මා කියන්නෙ පළමුවෙන් කළ පැමිණිල්ල ගැනයි. පළමුවෙන් කළ පැමිණිල්ලේදී කිසි නොම්මරයක් දුන්නෙ නැහැ. දෙවනුව දුන් නොම්මරය 4 ශ්‍රී 1824 යි. සොයා බලන විට ඒක හෝල්ඩන් රථයක්. ඇත්ත වශයෙන්ම මේ අන්දමට ක්‍රියා කළ අයට විරුද්ධව ක්‍රියා කළ යුතුය කියා දෙවිනුවර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අදහසට මා එකඟ වෙනවා. අප දෙපක්ෂයම ඇත්ත පාවිච්චි කරන්ට ලෑස්ති නම් තමයි සාධාරණ විනිශ්චයක් ඇති වෙන්නෙ. නිකම් දේශපාලන වාසියක් අර ගන්න වෙනත් බොරු මේකට අමුණන්ට එපා. එහෙම කළොත් හරි විධියට සාධාරණ විනිශ්චයක් ලබා ගැනීම අමාරු වෙන්නත් පුළුවන්.

ඊළඟට දිසාපතිතුමෙකුගෙ මාරුවක් ගැන කිව්ව. පීටර්ස් දිසාපතිතුමා මාරු කරන්ට තීරණය කර තිබෙන්නෙ බොහෝ කලකට ඉහතදීයි. මේ මන්ත්‍රීවරු කීප පොළක්ම නුවරඑළියට දිසාපතිවරයකු වුවමනාය කියා කීප වතාවක්ම ඉල්ලුම් කළා. ඒ ගැන නුවරඑළියෙ දිස්ත්‍රික්කයෙ මන්ත්‍රීවරුන්ම ඕනෑ තරම් සාක්ෂි දේවි. ඒ ඉල්ලීම් අනුව තීරණය කර තිබෙන්නෙ පීටර්ස් මහත්මය යවන්නයි. ඇත්ත වශයෙන් ඒ මහත්මය ඒ ප්‍රදේශයට යැවීම ගැනත් මා බොහොම සන්තෝෂයි. මා මෑතදී ඒ ප්‍රදේශයට ගියා. බොහොම හොඳට—මා දන්නෙ නැහැ වලපනේ මන්ත්‍රීතුමා ඒ ගැන සාක්ෂි දේවිද කියා—බොහොම හොඳට ඒ ප්‍රදේශයෙ වැඩ කරගෙන යනව. වලපනේ ගරු මන්ත්‍රීතුමාගෙ (ටී. බී. එම්. හේරත් මයා.) කොට්ඨාශයත්, ඒ කච්චේරියට සම්බන්ධයක් තිබෙන කොට්ඨාශයක්. අතුරු මැතිවරණය ගැන කිසිම අදහසකින් නොවෙයි, පීටර්ස් දිසාපතිතුමා මරු කරන්ට තීරණය කළේ. ඒ මහතා මරු කරන්ට තීරණය කර තිබුණේ බොහෝ කාලයකට ප්‍රථමයෙන්. අනික් කරුණු පිළිබඳව ගරු සවදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා දන්නවා ඇතැයි මම හිතනව. ඒ මාරු කිරීම් ගැන ඒ ඇමතිතුමා ප්‍රකාශ කරනවා ඇත.

දෙවිනුවර වුණු සිද්ධීන් සියල්ලම ගැන සාධාරණ පරීක්ෂණයක් කෙරෙන බවට කිසිම සැකයක් නැති බව මා කියන්ට කැමතියි. කවුරු කළත් ඒ විධියට බෑ, මැතිවරණ පවත්වන්ට. සල්ලි බෙදන්ට ගිහින් මේ කාර් අසුවුනාය කියා සමහර උදවිය චෝදනා කරනව. එය ඇත්තක්ය කියා මා කියන්නෙ නැහැ. [බාධා කිරීම්] මෙතැන ඉදගෙන නොයෙක් විධියෙ චෝදනා කරන්ට අපටත් පුළුවන්. ඒවායෙ කිසි ගත යුත්තක් නැහැ. නිකම් දේශපාලන වාසිය තකා කටයුතු කිරීමක් පමණයි. එසේ ක්‍රියා කිරීමෙන් සාධාරණ විනිශ්චයකට එළඹෙන්ට පුළුවන්කමක් ලැබෙන්නෙ නැහැ. එම නිසා, දෙවිනුවර අතුරු මැතිවරණය සම්බන්ධයෙන් කළ ප්‍රකාශය ගැන මට කියන්ට තිබෙන්නෙ එපමණයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

පීටර්ස් මහතාගෙ මාරුව ගැන හැරෙන්නට දෙවිනුවර ගරු මන්ත්‍රීතුමා විසින් තවත් මරු කිරීම් දෙකක් ගැන සඳහන් කළා. ඒ දෙදෙනා කච්චේරි නිලධාරීන් ය කියා එතුමා කීව. ලැබුණු දිවුරුම් පෙත්සම් සහ සාක්ෂි අනුව දෙවිනුවර අතුරු මැතිවරණයේ ප්‍රතිඵල නිකුත් කළාට පසුව එක් කච්චේරි නිලධාරි මහත්මයෙකුගේ පමණක් රාජකාරි කටයුතු තහනම් කර තිබෙනව. එසේ රාජකාරි කටයුතු තහනම් කර තිබෙන්නෙ සාමාන්‍ය විනයානුකූල නීතිරීති අනුව මිස වෙන කිසි බලපෑමක් නිසා නොවෙයි. ඒ කච්චේරි ලිපිකරු මහත්මයෙක්. රෙජිස්ට්‍රාර් මහත්මයකුගෙ රාජකාරි කටයුතු තහනම් කර තිබෙනව. ඒ තැනැත්තාට විරුද්ධව චෝදනා තිබෙනව, බාල වයස්කාරයන් නියම විධියෙ බලපත්‍ර නැතිව කසාද බැන්දවීම ගැන. ඒ චෝදනාව උඩ රෙජිස්ට්‍රාර්වරයකුගෙ රාජකාරි කටයුතු තහනම් කර තිබෙනව. එහි මැතිවරණයට කිසිම සම්බන්ධයක් නැහැ.

පොලීසියේ මාරු කිරීම් ගැනත් සඳහන් කළා. සාමාන්‍යයෙන් අතුරු මැතිවරණයක් පැවැත්වෙන විට පොලිස් නිලධාරි මාරුවීම් කීපයක් කෙරෙනව. ඒ අනෙකක් නිසා නොවෙයි, ඒ පොලිස් ස්ථාන වලට වැඩිපුර නිලධාරීන් වුවමනා කරන නිසයි. පොලිස් නිලධාරි මාරුවීම් සිදු වුණේ, ඒ හේතුකොට ගෙනය කියා මා කල්පනා කරනව. නමුත් මට පිළිතුරු දෙන්ට තිබෙන්නෙ, කච්චේරියෙ වැඩ තහනම් කළ තැනැත්තාත් රෙජිස්ට්‍රාර් වරයාත් ගැන පමණයි.

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜயபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)

මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (ද සොයිසා සිරිවර්ධන මයා.) තැපැල් කාර්යාලයක් ගැන ප්‍රශ්නයක් මතු කළා. ඒ ප්‍රශ්නය ගැන කලින් දැනුම් නොදුන්නත්, ඒ ගොඩනැඟිල්ලෙ වැඩ අවසාන නම් ඒ ගොඩනැඟිල්ලට හැකි තරම් ඉක්මණින් ගෙවදින්නට පිළියෙළ කරන බව දන්වන්ට කැමතියි.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7.28 ට 1967 අප්‍රේල් 5 වන බදාදා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி சபை பி. ப. 7.28 மணிக்கு 1967 ஏப்றில் 5 ஆம் தேதி புதன்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப் பெற்றது.*

*Adjourned accordingly at 7.28 P.M. until 2 P.M. on Wednesday, 5th April 1967.*

PUBLIC LIBRARY
JAFFNA.

3015

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6 කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. BOX, 500, Colombo 1.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org